
සැඟවුණු බොදු මග යළි පුබුදන

# හෙළ බොදු පියුම

ශ්‍රී බු. ව. 2558ක් වූ උඳුවප් මස (ව්‍යවහාරික වර්ෂ 2014 දෙසැම්බර්)

38 වෙනි කලාපය

## මරණින් පසු ගන්ධබ්බයෙකුගේ මුල් දින 7...



සැඟව ගිය බොදු මග යළි රැගෙන සෑම පුන් පොහෝ දිනකම එළිදකින දහම් සංග්‍රහය

රු. 20/-

# අභි උතුම් බුදු පුද උපහර කළා මේ ලෙස...



පන් සත සහස් දොළො සහසක් අට විසිය
පුන් ඇල් සහල ගණනය කර ගෙන රැසිය
උන් පෙර මුනිවරුන් පිදු පින් බර වැසිය
මින් ගෙන දෙන කුසල් මතු නිවනට නිසිය

සූ අසු දහස් දම් කඳ සිහි කර බැතිනා
පූජා කරනු වස් ගැණ එපමණ අතිනා
නූතන මනු ලොවේ ගුණ උපහර මතිනා
වූවා මෙලෙස තුන් ලොවටම සෙත නිතිනා

තෙමසක් පුරා දිව රැය වෙහෙසද නොබලා
තම අත් පා මුවද පිළි වැසුමක තබලා
සමවත් ගුණින් තුන් රැකවරණය ලබලා
හැම සක්වලම යාවා සසුනම බබළා

සෙත් පිරිත් හඬද සඟ පිරිවර මැද දී
බත් ඉදෙන්ට විය මැදි අළුයම කල දී
රත් කෙරුම සුවඳ දර හත සහ ගිනි දී
පත් වුනා එයින් තුම් දන් බත සෙත දී

මුදු රස පලන් පස් ගෝ රස මුසුව ගෙන
බුදු උපහර පුදන දන් බත සුවඳ වින
බොදු දරු කැළ එකට වී තුම් ගුණය ගැන
පිදු මෙම දනේ ඇත අනතව නැගෙන පින

පෙරහර තුළින් වඩමා දන් බත තෙදිනා
කරඬුව වඩමවා හේවිසි බෙර නදිනා
තොරණද සදා කොඩි ඇද පාවඩ මැදිනා
හරසර කළා මහ මුනි ගුණයට සොඳිනා

දෙස බඹ ලොවට යන කල් තුටු වෙන තාලේ
අසනට දුලබ පින් කම් වෙයි අද කාලේ
පිස දුන් එ දන් පෙර විලසට හෙළ හාලේ
සසරෙහි මහ පිනකි සිහි වෙන හැම වේලේ

සත සෙත සැදුව මුනිවරු සහ දම ගාවා
ඇත අඩු නැතිව මහ උපහර ගෙන පෑවා
අත හිත දුන් විලස හැම සත පිහිටාවා
සිත පැහැද වී ඉන් මතු නිවනම වේවා

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

# නිවන් මාර්ගයේ මුල පටන් ගැන්ම අපදාන පාළිය තුලින්...

18 වන කොටස



මේ කියන්න යන්නෙ වහා ධර්මය අවබෝධ කළ භික්ෂුණීන් වහන්සේලා අතරින් අගතැන් පත් වෙච්ච කුණ්ඩලකේසි මහ රහත් තෙරණිය ගැන. එතුමියත් අනෙක් මහා ශ්‍රාවකයන් වහන්සේලා වගේ පාරමිතා පිරීම පටන් ගෙන තියෙන්නෙ මේ බුද්ධ සාසනයේ සිට අසංඛ්‍ය කල්ප ලක්ෂයකට පෙර ලොව පහල වූ පදුමුත්තර බුදු පියාණන් වහන්සේ ඇතුලු මහා සංඝයා වහන්සේලාට දාන මාන පුද සත්කාර කිරීමෙන්. ඉතින් ඒ කාලයේ ඇය හංසවතී නුවර සිටු කුළයක උපන් කුමාරිකාවක් විදියට පදුමුත්තර බුදුන් වහන්සේ ඉදිරියේ බණ අහල පැහැදිලා හිටියෙ.

දැන් කෙනෙකුට හිතෙන්න පුළුවන්, පැහැදුනා කියන්නෙ සෝවාන් වුනාද කියල. ඇත්තටම මෙතන පැහැදීම කියල අදහස් කරන්නෙ මුලින්ම තුනුරුවන් කෙරෙහි ඇතිවන චිත්ත ප්‍රසාදය. ඒ චිත්ත ප්‍රසාදය ඇතිවෙන්නෙ උන්වහන්සේ ඇතුලු, උන්වහන්සේ වටා සිටින භික්ෂු භික්ෂුණී, උපාසක උපාසිකා කියන සිවුවනක් පිරිස තුල ඇති සංවරත්වය, සීලය ආදී ගුණාංග දැකල. ඒ කියන්නෙ මුලින්ම ලෞකික වශයෙන් දකින්න පුළුවන් ගුණ තියෙනවා. මොකද ඒ වෙද්දි පෘතජ්ජන කෙනෙක් නිසා ලෝකෝත්තර ගුණ දැකල පැහැදීමක් ඇති වෙන්නෙ නෑ. එතකොට **පෘතජ්ජන කෙනෙක් බුදු ගුණ දකිනව කියන්නෙ, ලෞකික වශයෙන් තියෙන ගුණ දැකල පැහැදෙනව කියන එක. ඒ පැහැදීම අමූලිකා ශ්‍රද්ධාවක්, මුල් බැහැගත්ත එකක් නෙවෙයි.** සම්එහන්සනා සද්ධා ආදී වශයෙන් තවත් එහාට යන කොට තමයි මුල් බැහැගත්ත ශ්‍රද්ධාවක් ඇති වෙන්නෙ. ඒක තමයි මගඵල ලාභීන්ට තියෙන්නෙ. ලෞකික වශයෙන් ගුණ දකින කොට ඒ මට්ටමේ ශ්‍රද්ධාවක් එන්නෙ නෑ. බුදුන් වහන්සේ කවදාවත් ප්‍රාණ ඝාත, හොර මැර වංචා, සුරා සූදු, දුරාචාර කරන කෙනෙක් නෙවෙයි කියන විස්වාසය තමයි එතකොට ඇති වෙන්නෙ. එහෙම නැතුව චතුරාර්ය සත්‍යය පිළිබඳ කතා කරන්න, එහෙම ශක්තියක් තියෙන බවක් වැටහෙන්නෙ නෑ. නමුත් ලෞකික වශයෙන් අර විදියට යම් කිසි උතුම් ගුණ තියෙනව කියල ඒ මට්ටමට දකිනවා.

වෙනත් විදියකින් කියනව නම්, ඉස්සෙල්ලම ලෝක සම්මතයේ පවු නොකරන කෙනෙක් කියල දකිනවා. නමුත් බාහිත පාපී හෙවත් ලෝකෝත්තර වශයෙන් සියලු පවු බැහැර කළ කියන, රහතුන් වහන්සේ නමකගේ ගුණ දකින්නෙ නෑ. එතකොට ලෝක සම්මතයේ පවු නෑ කියන ගුණයයි, යථාවබෝධය ලැබුව ගුණයයි කියන්නෙ කාරණා 2 ක්. යථාවබෝධය ලැබූ, චතුරාර්ය සත්‍යය අවබෝධය ලැබූ ගුණය දකින්නෙ මග ඵල ලාභීන්. ඒ ගුණය නිසා බුදුන් වහන්සේගේ / රහතුන් වහන්සේගේ බාහිත පාපී ගුණය දකින්නෙත් මග ඵල ලාභීන්. නමුත් අනෙක් අය දකින්නෙ ලෝක සම්මතයේ පවු නෑ කියන ලෞකික පැත්ත. මොකද ඒ කාරණය ලෞකික අවබෝධයට ගෝචරයි. ඒ නිසා පවු නැති කෙනෙක් කියල දැකල, පවු කියන ඒවා හොඳ නැනෙ, මටත් පවු නැති කෙනෙක් වෙන්න ඇත්නම් කොච්චර හොඳද, එතකොට දුක් විඳින්නෙ නැනෙ කියන ඒ වගේ මූලික අදහස් එනවා. එහෙම අදහස් ආවම ලෞකික වශයෙන් දකින ගුණයට තමයි හිත එන්නෙ. නමුත් ඒ දකින්නෙත් ශ්‍රමණ ගුණ. ලෝකෝත්තර ගුණ තිබුනට ඒව මේ අවස්ථාවෙදි දකින්නෙ නෑ. එතකොට ශ්‍රමණ ගුණ කිව්වම ලෞකික ලෝකෝත්තර ගුණ දෙකම අයිති වෙනවා. ඒකෙන් පෘතජ්ජන කාලෙ දකින්නෙ ලෞකික ගුණ. අනුන් වෙනුවෙන් කැප වෙච්ච උත්තමයෙක් කියල බාහිරින් දකිනවා. ඉතින් මටත් ඒ වගේ කෙනෙක් වෙන්න ඕන කියන අදහස තමයි මුලින්ම එන්නෙ.

එතකොට තමන් කෙරෙහි ලෞකික වූ කිසිම බලාපොරොත්තුවක් නැතුව, අනුන්ගෙ දුක නිවන්නම කැප වෙලා ඉන්න පිරිසක් දැක්කම ඇතිවන පැහැදීම ගැන අමුතුවෙන් කියන්න දෙයක් නෑ. සාමාන්‍යයෙන් කෙනෙක් තව කෙනෙකුට උදව්වක් උපකාරයක් කරන්නෙ බොහෝ විට නැවත දෙයක් බලාපොරොත්තුවෙන්. කොටින්ම කියනව නම්, අම්ම තාත්ත වුනත් දරුවො හදන්නෙ, උස් මහත් කරන්නෙ, උගන්වන්නෙ තමන් මහළු වියට පත් වුනාම ඒ දෙමව්පියන්ගෙ දේපළ රැක බලා ගනියි, තමන්ව රැක බලා ගනියි කියන බලාපොරොත්තුව ඇතිව. ඒක සාමාන්‍ය දෙයක්. ඕනෑම සාමාන්‍ය කෙනෙකුට ඇති වෙන්න පුළුවන් අදහසක්.

නමුත් බුද්ධ සාසනය තුල ඉන්න සිවු වනක් පිරිස ප්‍රධාන වශයෙන් එහෙම බලාපොරොත්තුවක් නැතුව තමයි උදව් උපකාර කරන්නෙ. මොකක්ද කරන උදව්ව? මේ මොන සැප සම්පත් වින්දත්, මොන තාන්න මාන්න දැරුවත් මළාට පස්සෙ ගෙනියන්න වෙන්නෙ කරපු පින් පවු. ඒ පින් පවු වුනත් ගෙවිල ඉවරයක් වෙනවා. පාපයේ විපාකයට වැඩිය පිනේ විපාකයට තමයි හැමෝම කැමති. නමුත් ඒකත් ගෙවිල වැනසිලා යනවා. මේ තත්ත්වය අරිහතුන් වහන්සේ උපරිමයෙන්මත්, ඊට පහල ඉන්න ආර්ය උතුමන් ඒ ඒ මට්ටමිනුත් දකිනවා. ඒ ඒ මට්ටමින් දැනෙන දුකෙන් මිදෙන්න තමයි උදව් උපකාර කරන්නෙ, දහම් කියල දෙන්නෙ. ඉතින් තමන්ට ලැබුන ඒ ☞

උත්තරීතර සැනසීම දෙන්නයි උත්සාහ වීර්ය කරන්නෙ. ඒ නිසා තමන්ට ලැබුන ඒ සිසිල සැනසීම අනුන්ට දෙනව මිසක්, ඒ අයගෙන් ලැබෙන ලාභ, කීර්ති, ප්‍රසංසා ගන්න බලාපොරොත්තුවක් නෑ. ඒ නිසා තමයි කිව්වෙ ඒ වගේ බලාපොරොත්තුවක් නැතුව උදව් උපකාර කරන පිරිසක් කියල. ඉතින් එහෙම කෙනෙක් කෙරෙහි නුවණැත්තෙක් ඉබේම පැහැදෙනවා කියන එක කියන්න දෙයක් නෙවෙයි. ඊට පස්සෙ එතැන් පටන් පැතුමක් පතන්නෙ, තමන්ටත් ඒ තත්වෙට පත්වෙන්න තිබුන නම් කියන අවංක චේතනාවෙන්.

දැන් මේ සිටු දියණියටත් එහෙම ඇති වෙච්ච පැහැදීමක් ගැන තමයි මේ කියන්නෙ. ඉතින් ඒ අතර දැක්කා, පදුමුත්තර බුදුන් වහන්සේ ඒ කාලෙ වැඩ හිටපු රහත් මෙහෙණින් වහන්සේ නමකට වහා ධර්මය අවබෝධ වෙන භික්ෂුණීන් වහන්සේලා අතරින් අග තනතුර පිරිනමනවා. මේ සිටු කුමරියත් මහා දන් දීල තමන්ටත් ඒ තනතුර මතු බුද්ධ සාසනයක ලැබේවා කියල පැතුමක් පැතුවා. පදුමුත්තර බුදුන් වහන්සේ ඒ පැතුම ඉෂ්ඨ වෙන බව ප්‍රකාශ කරමින් අනුමෝදනාවක් කළා. ඒ මහා දානයේ ප්‍රතිඵලය ඇය සංසාරය පුරාවටම වින්දා. උපන් උපන් තැන අග මෙහෙසියක් වුණා. සැප සම්පත් ලැබුවා. දෙව් ලොව උපන්නත්, මනුස්ස ලොව උපන්නත් රජෙකුට බිසව වුනා. කාශ්‍යප බුදුන් වහන්සේගෙ කාලයේ රජ කුමරියක් වෙලා අවුරුදු 20,000 ක් කුමරි බඹසර රැක්කා. එහෙම කළේ, ඒ බුද්ධ සාසනයේ පැවිදි වෙන්න පියාගෙන් අවසර ඉල්ලුවම නොලැබිච්ච නිසා.

අවසාන අත්බැවේ, ඒ කියන්නෙ මේ ගෞතම බුද්ධ සාසනයේ, රූපයෙන් බොහෝ අග්‍ර වූ කුමාරිකාවක් විදියට සිටු කුළයක උපන්නා. කුණ්ඩලකේසි සිටු කුමරිය කියල තමයි හැමෝම ඇයව දැනගෙන හිටියෙ. ඇගේ රූපයට බොහෝ අය වශී වෙලා ඇයව පතාගෙන ආවා. නමුත් ඒක ඇගේ දෙමව්පියන්ට කරදරයක් වුණා. ඒ නිසා තට්ටු හතක ගොඩනැගිල්ලක ඉහලම මාලයේ සේවිකාවකට ඇයව බලා කියා ගන්න සැලැස්සුවා. මෙහෙම ඉන්න කොට ඇය, මරන්න ගෙනියන හොරෙකුට හිත බැඳිල දෙමව්පියන්ටත් පෙරැත්ත කරල ඒ හොරාව සරණ පාවා ගත්තා. මේ හොරා ඇයව රවට ගෙන ආභරණ හොරා ගන්න කඳු මුදුනක ගලක් උඩට ගෙනිහින් මරන්න උත්සාහ කරපු හැටිත්, ඇය ඒ සොරාව ගල පල්ලට තල්ලු කරල බේරිලා පලා ගිය හැටිත් බොහෝ පින්වතුන් අහල තියෙනවා. ඒ වගේම මේ සිද්ධියෙන් පස්සෙ විශේෂ යමක් සිද්ධ වුණා. ඒ කියන්නෙ ඒ පර්වතයට අධිපති දෙවියෙක් මේ කරපු ක්‍රියාව දැකල කුණ්ඩලකේසි සිටු කුමරිය ගැන වර්ණනාවක් කළා.

**සියලු තැන්හි පුරුෂ තෙමේ පණ්ඩිත නො වේ මැ යි, ස්ත්‍රී ද පණ්ඩිත වෙයි, ඒ ඒ කරුණෙහි විචක්ෂණ ද වේ, වහා අරුත් සිතන්නී ද වේ.** (අපදාන පාලිය 2-2 - කුණ්ඩලකේසාපදානය - පිටුව 113)

එතන හිටපු දෙවියො එහෙම කියන්න හේතුවක් තිබුණා. ඇයට ඒ වෙලාවෙ ආපු සිතිවිල්ලයි වැදගත් වුනේ. ඒ වෙලාවෙ හිතුවෙ, මේ නුවණ මට ලැබුනෙ උයාගෙන පිහාගෙන කන්න විතරක් නෙවෙයි, ලැබුන මනුස්ස ජීවිතයෙන් ප්‍රයෝජනයක් ගන්න ඕන කියන සිතිවිල්ල. ඊට පස්සෙ තමයි අර හොරාව කන්දෙන් පහලට තල්ලු කළේ. සිතිවිල්ල තිබුනෙ, හොරාව මරල නැවත ගිහි ජීවිතයට යන්න නෙවෙයි. එහෙම ගියා නම් ඒ සිතිවිල්ල අර දෙවියො අර විදියට වර්ණනා කරන්නෙ නෑ. ප්‍රාණ ඝාතය ප්‍රාණ ඝාතයමයි, ඒකෙ විපාක එනවා. නමුත් ඊට පස්සෙ කරන්න ගිය වැඩේ තමයි වැදගත්. අර හොරා අතින් මැරුම් කෑව නම්, ලැබුන එකම අවස්ථාවත් නැති වෙන්න ඉඩ තිබුණා. ඊට පෙර ඇත්බැව්වල බුද්ධ සාසනය වෙනුවෙන් කරපු පුද පූජා, පාරමිතා ශක්තිය ඒ සිතිවිල්ලත් එක්ක නැගිල එන්න ඇති. ඒ අනුව තමයි ඒ දෙවියො එහෙම වර්ණනාවක් කරන්න ඇත්තෙ. ඉතින් ඇය කෙලින්ම අර හොරා උදුර ගන්න හැදුව ආභරණ ටික එහෙම්ම එතන තියල කැලෑවට ගියා. මුලින්ම හමුවුන පරිබ්‍රාජිකා ආශ්‍රමයෙන් පැවිද්ද ඉල්ලා සිටියා. නමුත් ඊට කලින් ඇය ඒ අයගෙන් ප්‍රශ්නයක් ඇහුවා, ඔබලාගෙ උතුම් අරමුණ මොකක්ද කියල. අරමුණු දෙකක් එතනදි කුණ්ඩලකේසි සිටු කුමරියට දැනුම් දුන්නා. එකක් බවුන් වඩා ධ්‍යාන වැඩීම. අනෙක දහසක් වාදයන් ඉගෙන ගැනීම.

ඇය කොච්චර නැණවත් කාන්තාවක්ද කියනව නම්, ඒ වෙන කොට තමන් සතු නුවණ, හැකියාව මැන ගැනීමේ හැකියාවත් තිබුණා. බොරුවට ඕන එකක් කරන්න පුළුවන් කියල බාරගත්තෙ නෑ. කෙලින්ම කිව්වෙ මට ධ්‍යාන කරන්න බෑ, නමුත් වාද දහස ඉගෙන ගන්නම් කියල. අදටත් බොහෝ අය තමන් ඉන්න තැන තමන්ම දන්නෙ නෑ, තමන්ට බලවත්ව තියෙන ඉන්ද්‍රිය මොකක්ද කියලවත් තෝර ගන්න උවමනාවක් නෑ. හැම කෙනාම කරන්න යන දේ අනෙක් කෙනත් කරන්න යනවා. තමන් කැමති නම් බුදුන් වහන්සේට මල් පහන් පූජා කරන්න, පින්කම්වල යෙදෙන්න, කොඩි වියන් අඳින්න, උන්වහන්සේලාට උපහාර පින්කම් කරන්න, ඒ තුලින් තමන්ම දැනගන්න ඕන, තමන්ගෙ ශ්‍රද්ධා ඉන්ද්‍රිය තමයි බලවත් කියල. ඒ අනුව තමයි ඊළඟට කටයුතු කරන්න ඕන. මේකට ගැහැණු පිරිමි බේදයක් නෑ. තමන් වැඩි පුරම කරන්න කැමති මොකක්ද, ඒ අනුව තීරණය කරන්න පුළුවන්.

ඉතින් ඒ අනුව සිටු කුමරිය සියලු වාද ඉගෙන ගත්තා. ඊට පස්සෙ පරිබ්‍රාජක ආශ්‍රමයෙන් ඇයට මෙහෙම උපදෙස් දුන්නා. දැන් ඔබට යන්න පුළුවන්, කිසියම් ගිහියෙක් ඔබව වාදයෙන් පැරැද්දුවොත් ඔබ ඔවුන්ගෙ අතවැසියෙක් වෙන්න, පැවිද්දෙක් ඔබව පැරැද්දුවොත් එතැන පැවිදි වෙන්න. මේ විදියට කියල ඇයට දඹ අත්තක් දීල යන්න කිව්වා. ඉතින් ඇය කළේ, වැලි ගොඩක් ගහල ඒ දඹ අත්ත හිටවල වාද කරන්න කැමති කෙනෙක් මේ අත්ත අල්ලන්න, එතකොට වාද කරන්නම් කියල ප්‍රකාශ කිරීම. ඒ අනුව ඇය සියලු වාදයන්ගෙන් ජය ගත්තා. මේ දඹ අත්ත අරන් ගිය නිසා ජම්බු පරිබ්‍රාජිකාව කියල ඇය ප්‍රසිද්ධ වුණා. කිසිම කෙනෙක් ඇයත් එක්ක වාදයට ඉදිරිපත් වුනේ නෑ. නම ඇහුන ගමන් පලාතෙවත් ඉන්නෙ නැතුව යන්න ගියා.

කර්ම ශක්තිය කියන එක මහ පුදුමාකාර දෙයක්. පතපු පැතුම්, පාරමිතා ශක්තිය, ඒ සසර එන ගමන් කරපු කර්ම, විපාක විදිහට ඇවිත් අවශ්‍ය තැන්වලට යොමු කරනවා. එතකොට තමයි ඒ පැතුම, පාරමිතාව පූර්ණ වෙන්නෙ. ඇය පැවිදි වුනේ පරිබ්‍රාජිකා අසපුවක. නමුත් පැතුම වුනේ බුද්ධ සාසනයක වහා දහම් අවබෝධ කරගන්න භික්ෂුණීන්ගෙන් අග තැන ලැබීම. කොහෙත්ම සමාන කරන්න බැරි පැති දෙකක්. නමුත් බුද්ධ විවරණයක් කවදාවත් බොරු වෙන්නෙ නෑ. ඉතින් එහෙම වාද කර කර එනකොට මේ ජම්බු පරිබ්‍රාජිකාව සැවැත් නුවරට ඇවිත්, අර පුරුදු විදිහට වැලි ගොඩක් ගහල දඹ අත්ත වැලි ගොඩ උඩ හිටවල, මාත් එක්ක වාද කරන්න පුළුවන් කෙනෙක් ඉන්නව නම් ඒ අත්ත අයින් කරන්න කියල අභියෝග කළා. එතකොට වහා දහම් අවබෝධ වෙන අයගෙන් අග තනතුර තමයි පැතුවෙ. නුවණත් එසේ මෙසේ එකක් නෙවෙයි. වාද කරන්න සමතෙකුත් හිටියෙ නෑ. ඔය අතරෙ සැරියුත් මහරහතන් වහන්සේ පිඬු සිඟා වැඩල දන් වළඳල නැවත වඩින අවස්ථාවක් ආවා. පුරුද්දක් විදිහට අර පරිබ්‍රාජිකාව දඹ අත්ත හිටවල අභියෝග කරන කොට, ඒ පැත්තෙ ඉන්න ළමයි රොක් වෙලා බලන් ඉන්නව මොකද වෙන්නෙ කියල. ඉතින් මේක සැරියුත් මහ රහතන් වහන්සේ දැකල, අර ළමයින්ගෙන් ඇහුවා මොකද මතන වෙන්නෙ කියල.

දැන් කෙනෙකුට හිතෙන්න

පුළුවන්, එහෙම රටේ ලෝකෙ වෙන දේවල් රහතන් වහන්සේලා හොයන්නෙ නෑනෙ, ඇයි එහෙම සැරියුත් මහරහතන් වහන්සේ ඇහුවෙ, ලෝකයේ දේවල්වලින් සම්පූර්ණයෙන්ම මිදිල රාග, ද්වේශ, මෝහ සියල්ලෙන් සියල්ල ක්ෂය කරපු උතුමෙක් ඇයි එහෙම හෙව්වෙ කියල. රහතන් වහන්සේ නමක් හේතුවක් නැතුව නිකං යමක් අහන්නෙ නෑ. අනෙක සැරියුත් මහරහතන් වහන්සේ කියන්නෙ බුද්ධ සාසනයේ ශ්‍රාවකයන් අතර උපරිම ප්‍රඥාව තියෙන උත්තමයෙක්. ලේසි පහසු කෙනෙක් නෙවෙයි. ගෞතම බුද්ධ සාසනයේ ධර්ම සේනාධිපති. ඉතින් එහෙම උත්තමයෙක් හේතුවක් නැතුව නිකං යමක් විමසන්නෙ නෑ. සමහර විට ඇගේ පිටින් පෙනුන ස්වභාවය අනුව, ඥානවන්තකම අනුව දහම් මගට යොමු කරන්න පුළුවන් කෙනෙක් කියල අනුමාන කරන්න ඇති, ඇය ආර්ය මාවතට යොමු කරන්න හොඳම අවස්ථාව කියල හිතන්න ඇති. ඉතින් අර ළමයි විස්තරේ කිව්වම, එහෙනම් ඒ දඹ අත්ත අයින් කරන්න කිව්වා. වාද කරන්න සමතෙක් ඉදිරිපත් වුනා කියල මේ ළමයින්ටත් ඉස්පාසුවක් නැති වුනා. ඒ ළමයි සැරියුත් මහරහතන් වහන්සේ ගැනත් දැනගෙන හිටියා.

ඉතින් මේ ළමයි අර දඹ අත්ත අයින් කළා නෙවෙයි, අරගෙන කඩල බිඳල පොඩි කරල දැම්මා. මේක දැකපු පරිබ්‍රාජිකාව, ඇයි එහෙම කළේ උඹල එක්ක මට වාද කරන්න දෙයක් නෑ කියල ඒ ළමයින්ට බැන වැදුනා, අපහාස කළා. ඉතින් ඒ ළමයි කියා සිටියා, අපි නෙවෙයි අයින් කළේ සැරියුත් මහරහතන් වහන්සේ තමයි එහෙම කරන්න කිව්වෙ කියල. එතකොට මේ පරිබ්‍රාජිකාව සැරියුත් මහරහතන් වහන්සේගෙන් යටහත් පහත්ව ඇහුවා, ස්වාමිනී ඇත්තද මේ කතාව කියල. ඉතින් උන්වහන්සේ වාදයට ලෑස්ති බවත්, එය ඇත්තක් බවත් පවසා සිටියා. ඊට පස්සෙ ඇය අහපු දහසක් වාදවල කරුණු සියල්ලටම සැරියුත් මහරහතන් වහන්සේ පිළිතුරු දුන්නා. දැන් ප්‍රශ්න සියල්ලම අහල විසඳල අවසානයේ සැරියුත් මහරහතන් වහන්සේ ඊළඟට අහනවා, දැන් නැගණිය නුඹ අහපු ප්‍රශ්න සියල්ලම මා විසඳා දුන්නා, දැන් මම ප්‍රශ්නයක් අහනවා ඒකට උත්තර දෙන්න පුළුවන්ද කියල. එතකොට ඒ ප්‍රශ්නය ඇය ඉල්ලා සිටියා. ඉතින් සැරියුත් මහරහතන් වහන්සේ කිව්වා, එහෙම බෑ ඒක කරන්න නම් මේ මම වගේ පැවිදි වෙන්න ඕන කියල. ඉතින් ඇය පැවිද්ද ඉල්ලා සිටියා.

දැන් වැටෙහෙනව ඇති, ඇයි සැරියුත් මහරහතන් වහන්සේ අර ළමයින්ගෙන් ඇහුවෙ මොකද ඔතන වෙන්න කියල. ඉතින් ඇය පැවිදි වෙලා බුදුන් වහන්සේ ඉදිරියේ බණ ඇහුවා. උන්වහන්සේ අසුභය ගැන ඇයට දේශනා කළා. ලෝක සත්වයා අනිච්ච, දුක්ඛ, අනත්ත දේ සුබයි හොඳයි කියල ගන්න ආකාරයත්, ඒක සුබයි කියල ගන්න සුදුසු දෙයක්ද යන්නත්, එහි ඇති අසුභයත් පෙන්වා දුන්නා. මහා නුවණැත්තියක් වූ මේ තෙරණිය ඒ කාරණය වටහා ගෙන සෝවාන් ඵලයට පත් වුණා. මේ අසුභය පෙන්වන්නත් හේතුවක් තිබුණා. ඇය පරිබ්‍රාජිකාවක් වෙලා හිටපු කාලයේ එක්තරා බල්ලෙක්, මළකුණකින් පණුවො ගහපු අතක් කඩාගෙන යන දර්ශනයක් දැක්කා. එතැන් පටන් ඇය මේ ශරීරය ගැන පිළිකුලෙන් බලන්න පුරුදු වෙලා හිටියෙ. ඉතින් බුදුන් වහන්සේ අසුභය පෙන්වා දුන්නම වහා දහම් වැටහුනා. පැවිදි වෙලා දින කීපයකින්ම ඇය අරිහත්වයට පත් වෙලා කුණ්ඩලකේසි අරිහත් මෙහෙණිය නමින් ප්‍රසිද්ධ වුණා. ඒ වගේම සිවුපිළිසිඹියා සහිතව, ත්‍රිවිද්‍යා සහිතව, අභිඥා සහිතව තමයි අරිහත්වයට පත් වුණේ. මුලින්ම ධ්‍යාන වඩන්න බෑ, මට අමාරුයි කියපු කෙනා එහෙමයි අරිහත්වයට පත්වුනාම වෙනස් වුනේ. දැන් මෙතනින් තේරුම් ගන්න ඕන කාරණය තමයි, තමන් සතු බලවත් ඉන්ද්‍රිය මොකක් වුනත් අවසාන ප්‍රතිඵලය එකක් බව. ඉතින් ශ්‍රද්ධා ඉන්ද්‍රිය බලවත් කෙනෙක් කරන වැඩක් දැකල, වීර්ය ඉන්ද්‍රිය හෝ ප්‍රඥා ඉන්ද්‍රිය බලවත් කෙනෙක්, අයියෝ ඕක මොන පිස්සු වැඩක්ද කියල කියන්නෙ නැතුව, ඒ ඒ අයට ඒ ඒ දේවල් කරගන්න ඉඩ දීල තමන් සතු ගමන යන එකයි වටින්නෙ.

දැන් මේ කුණ්ඩලකේසි රහත් තෙරණිය ඉක්මනින් දහම් අවබෝධ කරගෙන අරිහත් වුන විස්තරය භික්ෂුණී අතර කතා බහට ලක් වුණා. කතා වෙච්ච ප්‍රධානම කාරණය තමයි, මහ ලොකුවට බණ ඇහුවෙත් නෑ, එක දේශනාවයි ඇහුවෙ, දවස් කීපයකින්ම අරිහත් ඵලයත් සාක්ෂාත් කරගත්තා කියන කාරණය. ඒ මදිවට හොරෙක් එක්ක මහා යුද්ධයක් කරල ඒකෙන් ජයග්‍රහණය කරල ඇවිත් තමයි මහණ වෙලා තියෙන්නෙ කියන කාරණයත් කතා බහ වුණා. ඉතින් බුදුන් වහන්සේ එතනට වැඩම කරල ඇහුවා, මොකක්ද නුඹල කතා වුනේ කියල. එතකොට ඒ භික්ෂුණී වහන්සේලා කාරණය සැළ කර සිටියා. ඉතින් බුදුන් වහන්සේ ඒ භික්ෂුන් වහන්සේලාට මෙහෙම අවවාදයක් කළා. මම මේ කියන දහම මොහුට ටිකයි කිව්වෙ, අනෙක් කෙනාට ගොඩක් කිව්ව කියල මනින්න එපා, **එක අර්ථයක් නැති වචන සීයක් කිව්වත් වැඩක් නෑ, අර්ථ සහිත එක දහම් පදයක් ඒකට වඩා ශ්‍රේෂ්ඨයි වටිනවා.** ඉතින් අර්ථය මොකක්ද, අනර්ථය මොකක්ද කියල තේරුම් ගන්න ඕන.

යම් වචනයක් කියන කොට, ඒ වචනයෙන් ඒ පුද්ගලයට ඒ මොහොතෙ සතුටක් එන්න පුළුවන්. ඒ වගේම ඒකෙන් සෙතක් වෙන්නත් පුළුවන්. නමුත් ඒ වචන අහල කරපු කියපු ඒවායේ ප්‍රතිඵලය එහෙම්ම තියෙයිද? ගෙවිල වැනසිලා නොගිහින් තියෙයිද? එහෙම වෙන්නෙ නෑ. ඒක ගෙවිල වැනසිලා යනවා. එහෙම නැත්නම් කවුරු හරි කඩල බිඳල දානවා. තාවකාලික සැනසීමක් ලැබුවත්, ඒ ලබපු සැනසීම නැති වෙලා යනව නම්, ඒ කියපු කරපු දෙයින් අන්තිමට වැඩක් තියෙනවද ? තේරුමක් තියෙනවද? අන්න ඒ නිසයි ඒ කතාවල කිසි අර්ථයක් නෑ කිව්වෙ. ආර්ය විනය පැත්තෙන් බැලුවම කිසිම තේරුමක් නැති දේවල්, අර්ථයක් නැති අනර්ථ දේවල්. නමුත් සැරියුත් මහරහතන් වහන්සේ අර පරිබ්‍රාජිකාවට කිව්ව වචන ටික සැලකුවොත්, ඒක එහෙම එකක් නෙවෙයි. ඒ ප්‍රශ්නය දෙන්න නම් පැවිදි වෙන්න ඕන කියලයි කිව්වෙ. දැන් ඇය පැවිදි වෙලා අනන්ත දුක් කඳකින් නිදහස් වුණා. අනන්ත සොරුන්ගෙන් ගැලවුනා. ඒ වචනවලින්, ඒ වගේම බුදුන් වහන්සේ අසුභය ගැන දේශනා කරපු වචනවලින් ඇයට සදාකාලික සැනසීමක් ලැබුණා. සියලු ලෞකික සැනසීම්වලට අංශු මාත්‍රයක්වත් සමාන කරන්න බැරි මහා සැනසීමක් ලැබුණා. ඒ වගේ උතුමන්, ඕක කරන්න එපා කියල කිව්වත්, ඒ වචන දෙක තුනෙත් මහා අර්ථයක් තියෙනවා. එහෙම එක වචනයක් කිව්වත් ඇති, ඒක ශ්‍රේෂ්ඨයි.

දැන් ඉතින් අර හොරෙක් එක්ක යුද්ධ කරපු කතාවටත් බුදුන් වහන්සේ උපමාවකින් දේශනා කළා. **කෙනෙක්ගෙ භෞතික දේවල් හොරා ගන්න හොරාට වැඩිය බිය විය යුතු හොරෙක් ඉන්නවා. ඒ තමයි අපේ මනස තුළ ඉන්න කෙලෙස් හොරා.** කුණ්ඩලකේසි තෙරණිය යුද්ධ කරල ජය ගත්තෙ ඒ හොරා එක්ක. ඉතින් ඔය වගේ බාහිරව ඉන්න හොරුන් දහස් ගණනක් එක්ක සටන් කරල ගන්න ජයට වඩා වටින උතුම් ජයක් තියෙනවා. ඒ තමයි තමන්ගෙ සිත තුළ ඉන්න කෙලෙස් කියන හොරා එක්ක සටන් කරල ලබා ගන්න ජය. ඒක තමයි උතුම් වෙන්නෙ, ශ්‍රේෂ්ඨ වෙන්නෙ. ඉතින් මේ දේශනාව අවසානයේ බොහෝ භික්ෂුණී වහන්සේලා සෝවාන් ආදී මාර්ග ඵලවලට පැමිණුනා.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැගවුණ දහම් කරුණු සමග අපදාන පාලිය 2-2 කුණ්ඩලකේසාපදානය ඇසුරින් සකස් කළේ:*

**ෆික්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

# ධම්ම පදය තුලින් නිවන් මග

**5 වන කොටස**

මල් ගැනත්, මල් මාලා සහ මල්කරුවන් ගැනත් උපමාවලින් දහම් අරුත් කියන පුෂ්ප වර්ගයට අයත් ගාථා පෙළක් තමයි මේ කියන්න යන්නෙ. මේ ගාථාවන්ට මූලික වෙච්ච කාරණයක් තියෙනවා. ඒ කියන්නෙ ගෞතම බුදු පියාණන් වහන්සේ දෙවුරම් වෙහෙරෙ වැඩ ඉන්න කාලෙ පන්සීයක් භික්ෂූණ් වහන්සේලා අතර ඇතිවුන කතාවක් මුල් කරගෙන තමයි මේ ගාථාවන් දේශනා කළේ. මේ භික්ෂූණ් වහන්සේලා සියල්ලම පාහේ පිණ්ඩපාතෙ වඩින කොට, ඒ යන එන පාරවල්වල තියෙන ප්‍රශ්න ගැන තමයි කතා කර කර හිටියෙ. සමහර භික්ෂූණ් වහන්සේලා කියනවා, මම ගිය මාවත හරිම අමාරුයි මඩ පිරිල කියල. තවත් භික්ෂුණ් වහන්සේලා කොටසක් කියනවා, අපෝ ඒ පාරෙ යන්න බෑ දිගටම ගල් බොරලු, කකුල් හැපෙනවා හරිම අමාරුයි කියල. ඉතින් ඒ එක එක ගමට යන පාරවල් ගැන, ඒ පොලවෙ තත්ත්වෙ ගැන, යන්න අපහසු තැන් ගැන, පහසු තැන් ගැන ... මේ ආදී වශයෙන් ඒවායෙ හොඳ නරක ගැන තමයි කතා කර කර හිටියෙ. තමන්ගෙ ඉලක්කය, ඒ කරා ගමන් කළ යුතු මාර්ගය සහ ඒ මාර්ගයේ ඇති රළු ස්වභාවය, සුමට ස්වභාවය ආදී කාරණා තමයි මේකට මූලික වුනේ. බුදුන් වහන්සේ මේ කතාව අහල, දහම් කියල දෙන්න හොඳ අවස්ථාවක් නිසා මේ ගාථා දෙක ඒ භික්ෂූණ් වහන්සේලා ඉදිරියේ දේශනා කළා.

කෝ ඉමං පඨවිං විචෙස්සති
යමලෝකඤ්ච ඉමං සදේවකං
කෝ ධම්ම පදං සුදේසිතං
කුසලෝ පුප්ඵමිව පචෙස්සති

මේ ගාථාවෙ සරල සිංහල තේරුම නම්,

මේ පොළොවත්, සතර අපායත්, දෙව් ලොව සහ මිනිස් ලොවත් කවරෙක් නුවණින් අවබෝධ කොට දැන ගන්නේද? දක්ෂ මාලාකාරයෙකු මල් තෝරා රැස් කරන්නාක් මෙන් කවරෙක් මනා කොට දෙසන ලද සත් තිස් බෝධි පාක්ෂික ධර්මය පිළිබඳ දැන ගන්නේද?

සේඛෝ පඨවිං විචෙස්සති
යමලෝකඤ්ච ඉමං සදේවකං
සේඛෝ ධම්ම පදං සුදේසිතං
කුසලෝ පුප්ඵමිව පචෙස්සති

මේ ගාථාවෙ සරල සිංහල තේරුම නම්,

සේක පුද්ගල තෙමේ මේ අත්බැව් නමැති පොළවත්, සතර අපායත්, දෙව් ලොව සහ මිනිස් ලොවත් විමසා තත් වූ පරිදි දැන ගන්නේය. දක්ෂ මාලාකාරයෙකු මල් තෝරා රැස් කරන්නාක් මෙන්, සේක පුද්ගලයා මනා කොට දෙසන ලද සත් තිස් බෝධි පාක්ෂික ධර්මය නුවණින් විමසා දැන ගන්නේය.

ඉතින් මේ ගාථා දෙක නුවණින් විමසල බලන කොට දකින්න කාරණයක් තියෙනවා. මුල් ගාථාවෙන් බුදුන් වහන්සේ ප්‍රශ්නයක් අහල තියෙනවා, දෙවන ගාථාවෙන් ඒකට උත්තර දීල තියෙනවා. බුදුන් වහන්සේ වඩින මොහොතෙ අර භික්ෂූණ් වහන්සේලා කතා කර කර හිටියෙ මහ පොලොව ගැන. ඒ කියන්නෙ අර ගමකට යන්න තියෙන පාරෙ තත්ත්වය ගැන, මඩ ස්වභාවය ගැන, රළු ස්වභාවය ගැන, ඒ වගේම පහසු තැන් ගැන. තම තමන් ගිය පාර අනුව ලැබුන අත්දැකීම් තමයි කතා කර කර හිටියෙ. ඉලක්කයක්, ඒ වගේම ඒ ඉලක්කය කරා යන මාවත ගැන (ගමට යන පාර ගැන) තමයි කතා වුනේ. මේක තමයි බුදුන් වහන්සේ උපමා කළේ. ඉලක්කය නිවන නම්, ඒ යන මාවත තමයි ආර්ය මාර්ගය. ඒක සමහරුන්ට කටුකයි, සමහරුන්ට සුමටයි. ඒ ඒ කෙනා පෙර කරපු දන් පින් ප්‍රමාණය අනුව කටුක බවත්, සුමට බවත් තීරණය වෙනවා. (16 වන කලාපයේ ''පින නිවනට බාධාවක්ද'' යන ලිපියේ මේ ගැන විස්තරාත්මකව කරුණු ඉදිරිපත් කරල තියෙනවා). කටුක හෝ සුමට කියන ඒ මාවතේ ගමන් කළ යුතු ආකාරය තමයි පෙන්වා දුන්නෙ. මුලින්ම අහන ප්‍රශ්නය තමයි, කවුද මේ මහ පොළොව ගැන හරියටම දන්නෙ? කවුද මනුස්ස ලෝකෙ ගැන දන්නෙ? කවුද සතර අපාය ගැන දන්නෙ? කවුද දෙව් ලොව ගැන දන්නෙ? හරියට දක්ෂ මාලාකාරයෙක් මල් තෝරනව වගේ මේවා ගැන කවුද දන්නෙ කියල උන්වහන්සේ ප්‍රශ්නයක් අහනවා.



ඉතින් ඊට පස්සෙ දෙන උත්තරය තමයි දෙවැනි ගාථාවෙ තියෙන්නෙ. මේ මහ පොළව ගැන දන්නෙ සේක පුද්ගලයයි කියල උන්වහන්සේ මුලින්ම පහදල දෙනවා. ඉතින් කවුද මේ සේක පුද්ගලය කියල මුලින්ම තෝරගන්න වෙනවා. සේක කියන්නෙ තවමත් ශික්ෂණය වෙමින් පවතිනවා කියන එක. ඒ කියන්නෙ සෝවාන් මාර්ග අනුගාමිකයාගේ පටන් අරිහත් මාර්ග අනුගාමිකයා කියන තැන් හතේ ඉන්න පුද්ගලයන්ට. ඒ කියන්නෙ සෝවාන් මාර්ග අනුගාමිකයා, සෝවාන් ඵල ලාභියා, සකෘදාගාමි මාර්ග අනුගාමිකයා, සකදාගාමි ඵල ලාභියා, අනාගාමි මාර්ග අනුගාමිකයා, අනාගාමි ඵල ලාභියා, අරිහත් මාර්ග අනුගාමිකයා කියන ආර්ය පුද්ගලයන් හත්දෙනාට. දැන් අර පිණ්ඩපාතෙ වැඩිය හාමුදුරුවන්ගෙ ඉලක්කය ගම, නගරය කියන තැන වගේ, මේ ආර්ය පුද්ගලයන්ගෙ ඉලක්කය නිවන. ගමට වඩින, පිය නගන මාවත වගේ තමයි මේ අයට ආර්ය මාර්ගය. ඉතින් මේ පුද්ගලයො කොහොමද පොළව ගැන දන්නෙ? මෙතන බුදුන් වහන්සේ පෙන්නුවෙ උපමාවක්. මහ පොළොව උපමා කළේ සීලයට. මේ ආර්ය පුද්ගලයන්ට ලැබෙන සීලය තමයි සංවරත්වයෙන් ලැබෙන සීලය. ඒක තමයි සංවරට්යේන සීලං කියන්නෙ. එතකොට කොහොමද සංවරත්වයක් ආවෙ? ඒක ඉබේම ලැබුන දෙයක්ද? එහෙම නැත්නම් උත්සාහයෙන්, වීර්යෙන්, අධිෂ්ඨානයෙන් ලබා ගත්ත දෙයක්ද?

කෙනෙකුට මන වඩන රූප බලන්න ඕන නම්, මන වඩන ශබ්ද අහන්න ඕන නම්, විවිධ රසයන් හොයාගෙන යනව නම්, එක එක සුවඳවල්වලට හිත නිකන්ම ඇදිල යනව නම්, ඒවම හොය හොයා යනව නම්, තමන් කැමති ස්පර්ශයන් දිගටම හොයනව නම්, ඒ හිත නිසා ඒ පුද්ගලයා කොච්චර වෙහෙසට පත්වෙනවද? එක මොහොතක් වත් නැවතිලා නෑ. ලැබෙන කල් නොඉවසිල්ලෙන් ඉන්නවා. ඉවර වුන ගමන් නැවතත් හොයනවා. හරියට වඳුරෙක් කිසිම හැදියාවක් නැතුව අර ගහට පනිනවා, මේ ගහට පනිනවා, කොල අතු හොල්ලනවා, කෑ කෝ ගහනවා වගේ. හරිම කලබලයි, වෙහෙසයි. ඉතින් ☞

මෙහෙම අවස්ථාවක කියනවා සංවරත්වයක් නෑ කියල. ලෝක සම්මතයේ නරක වැඩම නෙවෙයි මේ කියන්නෙ. තමන්ගෙ හිත දුවන වේගය ගැනයි කියන්නෙ. හිතට කොච්චර දුන්නත් මදි. නොදුන්න ගමන් කලබල වෙනවා. ඉන්න බැරුව යනවා. ඉතින් මේක නරක පැත්තට ඉක්මවනකොට තමයි කොහොම හරි ලබා ගන්න උත්සාහ කරන්නෙ. අයුතු අසාධාරණකම් කරන්න යන්නෙ.

ඉතින් මේ රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ, ධර්ම කියන අරමුණු පිළිබඳව යථාර්ථයෙන් සත්‍ය ඥානයෙන් දැකපු කෙනා සෝතාපන්නයි. කෘත්‍ය ඥානයෙන් දැකපු අය සකෘදගාමී මාර්ගයේ පටන් ගෙන අරිහත් මාර්ගයට යනකල් ඉන්නවා. කෘත ඥානයෙන් සියල්ල පූර්ණත්වයෙන් අත් දැක්කම අරිහත් ඵලය. සත්‍ය ඥානයෙන් දකින්නෙ චතුරාර්ය සත්‍යය. ඒ කියන්නෙ දුක්ඛ ආර්ය සත්‍යය ලෝකය බවත්, තණ්හාව දුක්ඛ සමුදය බවත්, ඒ තණ්හාවෙන් නික්මීම දුක්ඛ නිරෝධය බවත්, ඒ යන මාර්ගය හෙවත් ආර්ය අෂ්ඨාංගික මාර්ගය දුක්ඛ නිරෝධ ගාමිණී පටිපදා මාර්ගය බවත් සත්‍ය වශයෙන් වැටහෙනවා. ඊළඟට දුක පිරිසිඳ දැනගත යුතුයි, සමුදය දුරු කළ යුතුයි, නිරෝධය ප්‍රත්‍යක්ෂ කළ යුතුයි, මාර්ගය වැඩිය යුතුයි කියන නිගමනයට බැහැල ක්‍රියාත්මක වෙන අය තමයි කෘත්‍ය ඥානයෙන් දකින්නෙ. අන්තිමට දුක පිරිසිඳ දැන ගත්තා, සමුදය දුරු කළා, නිරෝධය ප්‍රත්‍යක්ෂ කළා, මග ප්‍රත්‍යක්ෂ කළා, මින් එහාට කරන්න දෙයක් නෑ කියල දැන ගත්තයි කියන්නෙ කෘත ඥානය පූර්ණ කළා කියන එක. ඒ තමයි අරිහත්වය. ඉතින් මේ වගේ ආර්ය කෙනෙක්ගෙන් මේ ගැන හරිහැටි අහල දැනගත්තම තමයි අර දුවන්න ඕන ගතිය, කලබල ගතිය නැතිවෙන්නෙ.

දැන් කෙනෙකුට හිතෙන්න පුළුවන්, ඒ කාරණය හරියටම දැනගන්නෙ කොහොමද කියල. මෙහෙම හිතුවොත්, කෙනෙකුට රූපවාහිනී යන්ත්‍රයක් මිලදී ගන්න කැමැත්තක් තියෙනවා. දැන් ඉතින් ඒක ගන්නකල් මේ ජාතියේ එකක් තමයි ගන්න ඕන කියල විස්තර හොයනවා, හීන මවනවා. හොඳට රූප පේන්න ඕන, ශබ්ද ඇහෙන්න ඕන, පොඩි එකක් අරගෙනත් බෑ, හොඳ ලොකුවට තියෙන්නත් ඕන. දැන් අර හිතේ මවා ගත්ත ජාතියේ එකක් ගන්න නිකන් බෑ, මුදල් ඕන. ඒකට වෙහෙසෙන්න ඕන, මුදල් නැත්නම් ණයට හරි ගන්න හිතෙනවා. ඒකත් නිකන් කරගන්න බෑ. කී දෙනෙක් පස්සෙ යන්න ඕනද? අර හිතේ බැහැගත්ත බලාපොරොත්තුව නිසා මාස ගණන් දුක් විඳිනවා. දැන් මුදල් එකතු කරගත්ත කියල හිතමු. රූපවාහිනිය ගෙදරට ගෙනාවා. දැන් අවශ්‍ය විදිහටත් තියෙනවා. ඊළඟට මොකද වෙන්නෙ? පොඩ්ඩක් දූවිලි වැදුන ගමන් පිහිදනවා. පොඩි එවුන්ට අල්ලන්නවත් දෙන්නෙ නෑ කැඩෙයි කියල. ඔහොම ඉන්නකොට ගෙදර කවුරු හරි අතුගාන වෙලාවක කොස්ස වැදිල රූපවාහිනිය පොඩ්ඩක් පලුදු වෙනවා. දැන් හිතට මොකක් එයිද? අනේ අපොයි වෙච්චි දෙයක් කියල විලාප දෙයිද, එහෙම නැත්නම්, ආ... ලෝකෙ හැටි ඔහොම තමයි, ඕවා කැඩෙන බිඳෙන දේවල් කියල නිකන් ඉඳියිද? කතා දෙකක් නෑ, විලාප තියනවා. කොස්සෙන් වද්දපු කෙනා ළමයෙක් නම්, ඒ ළමයට දඬුවම් දෙයි, කෑකෝ ගහයි. දැන් බලාපොරොත්තු වෙච්ච ආකාරයේ රූපවාහිනියක් ලැබිලත් සැනසීමක් තියෙනවද?

නැවතත් ආරංචියක් එනවා, ඊට වඩා හොඳ රූපවාහිනියක් වෙළඳපොළට ඇවිල්ල තියෙනවා, තමන් ළඟ තියෙන එකටත් වඩා මිල අඩුයි කියල. දැන් මොකද වෙන්නෙ? අපරාදෙ තව මාසයක් හිටිය නම් ඒක ගන්න තිබුන කියල නැවතත් හූල්ලනවා. ඔහොම හිත හිතා රූපවාහිනිය ගත්ත දවසෙ ඉඳන් දුක් විඳ විඳ ඉන්නවා. රූපවාහිනියක බලාපොරොත්තුව හිතේ බැහැගත්ත දවසෙ ඉඳන් ඒක ගන්න කල් විඳෙව්වා. දැන් බලාපොරොත්තුව ඉෂ්ඨ වුනාට පස්සෙ ඒක රැක ගන්න විඳවනවා. ඉතින් ලෞකික මොන දෙයක් වුනත් ලබා ගන්න දුක් විඳිනවා. ඊට පස්සෙ ඒක රැක ගන්න දුක් විඳිනවා. මේ දේවල්වල ස්වභාවය මේකයි, කොහොමත් දුකක් දෙන්නෙ කියල දැන ගත්ත දාට ඒක ගන්න උවමනාවකුත් නෑ, රැක ගන්න උවමනාවකුත් නෑ. ඉතින් එහෙම දැන ගත්ත ප්‍රමාණය අනුව හිතේ කලබල ගතිය අඩුවෙනවා. මේ කලබල ගතිය අඩු කරගන්න අමුතුවෙන් උත්සාහ කරන්න උවමනාවක් එහෙම තියෙනවද? මේ කලබල ගතිය අඩුවීම තමයි සංවරත්වය කියන්නෙ. ඒ ඒ මට්ටමින් සේක පුද්ගලයන් සංවර වෙනවා. ඒ සංවර වෙන මට්ටමට සීලය ඉබේම පිහිටනවා. සීලය දැන ගන්නවා. ඒ කියන්නෙ උපමා කරපු මහ පොළව තම තමන්ගෙ නුවණට අනුව දැන ගන්නවා. මෙතන තම තමන් කියල අදහස් කළේ ඉහත සඳහන් කරපු සේක පුද්ගලයන් හත් දෙනා ගැන.

ඉතින් මේ සීලය දැනගත්ත කෙනා ඊළඟට දැන ගන්නෙ සතර අපාය ගැන. කොහොමද දැන ගන්නෙ? ''අනේ මම මේ කැඩෙන බිඳෙන දේට, කඩන බිඳින දේට නේද ආස කළේ? කොච්චර රැක්කත් කැඩෙන බිඳෙන, කඩන බිඳින දේ මම අසාධාරණයෙන් හරි ගන්න නේද උත්සාහ කළේ! එහෙම කළා නම් මට මොකද වෙන්නෙ? තිරිසනෙක් වගේ වැඩ කළා නම් මම තිරිසන් අපායෙ නේද ගිහින් නවතින්නෙ! ඒවා ලබා ගන්න එපා කියද්දිත් අනුන්ට තලල පෙලල ගිනි දීල ඒ කැඩෙන බිඳෙන දෙයක්ම නේද බලාපොරොත්තු වුනේ. එහෙම කළා නම් ගිහින් නවතින්න වෙන්නෙ ගිනි අපායක හරි, ඊට එහා ගිය අට මහා නරකයක නේද?'' මෙහෙම හිතල සතර අපායත් දැන ගන්නවා. ඉතින් ඒ දුක් ගොඩින් මිදිල මනුස්සයෙක් වගේ හිටිය නම්, මනුස්ස ගුණය රැක්ක නම්, අනුන් පිහිටක් ඉල්ලන වෙලාවක පිහිට වුනා නම්, තමන්ගෙ මනුස්සකම නේද වැඩි වෙන්නෙ? ඒත් මනුස්සයෙක් වුනත් මොකක්ද වෙන්නෙ ? ඒකත් කැඩිල බිඳිල යන කයක්නෙ. ඕනම මොහොතක ලෙඩ වෙන්න පුළුවන් කයක්නෙ. එතන හිටියත් දුකනෙ. මේ විදියට මනුස්ස ලෝකය දැන ගන්නවා.

ඉතින් ඊට පස්සෙ මනුස්ස ලෝකයට වඩා දුකින් අඩු දෙව් ලොව ගැන බලනවා. එතන ලෙඩ රෝග පීඩා ආදිය නැති වුනාට, නුවණින් මුහුකුරා ගිය ආර්ය පුද්ගලයා ඒකත් ගෙවිල වැනසිලා යන දෙයක් කියල, චුත වෙන්න ළං වුනාම දෙවියන්ගෙ මැලවුන ස්වභාවයන්, දුක් බය ස්වභාවයන් දකිනවා. ඒ අත්දැකීම පවා ලබනවා. එතන තියෙන දුකත් දකිනවා (22 වන කලාපයේ දෙවියන් විඳින දුක ගැන හරවත් විග්‍රහයක් ඉදිරිපත් කරල තියෙනවා) ඉතින් ඒ අනුව දෙව් ලොවත් දැන ගත්ත වෙනවා. දැන් මේ ආකාරයන් දැන ගැනීම, ඒ කියන්නෙ අපාය, මනුස්ස ලොව, දෙව් ලොව ගැන ඇත්ත ඇති ආකාරයෙන් දැන ගැනීම ගැන උපමාව තමයි ඊළඟ ගාථාවෙන් පෙන්වල තියෙන්නෙ. හරියට දක්ෂ මල්කරුවෙක් හොඳ මල් තෝරනව වගේ. කෙනෙකුට එන හැඟීම්, සිතිවිලි, නිවනට උපකාරි වෙන සිතිවිලි මොනවද බලනවා. ඒ වගේම නිවනට බාධා වෙන සිතිවිලි අයින් කරල දානවා. හරියට මල් මාලයට නොගැලපෙන මල් අයින් කරල දානව වගේ. අවසානයේ දක්ෂ මල්කරුවා හොඳ ලස්සන පැහැපත් මල්වලින් මාලයක් හදාගෙන සම්පූර්ණ කරනව වගේ, සේක පුද්ගලයා නිවන නමැති මල් මාලය සම්පූර්ණ කර ගන්නවා. අවසානයේ අසේක හෙවත් අරිහත් කියන තැනට පත් වෙනවා. අසේක කියන්නෙ තව දුරටත් සේක නොකරන කෙනා හෙවත් ශික්ෂණය කරල ඉවර වෙලා පූර්ණ කරපු අය. ඒ තමයි අරිහතුන් වහන්සේ.

***වෑරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු සමග ධම්මපද පාලිය - පුප්ඵ වග්ගය ඇසුරින් සකස් කළේ:***

**ෆික්රි ඉස්මයිල්**
**පරිගණක ඉංජිනේරු - ගොතටුව**

# කඨින චීවර පූජාව නිවනට පසුතලය සකසන හැටි..

බොදුනුවන් විසින් හැම අවුරුද්දක් පාසාම සිදු කරගෙන එන මහා පිංකමක් තමයි කඨින චීවර පූජාව කියන්නෙ. පන්සලක පැවැත්වෙන අනෙක් පිංකම්වලට සාපේක්ෂව මේ කඨින චීවර පූජාවට බොදුනුවන් විශේෂ තැනක් ලබා දෙනවා. අනෙකුත් පිංකම්වලට සහභාගි වෙන්න නොහැකි වුණත්, මේ පිංකමට සහභාගි වෙන්න පින්වතුන් උනන්දුවක් දක්වනවා. ආචාර්ය වාදයක් විදියට අට මහා කුසල් කියල සම්මත කරගෙන තියෙන කඨින චීවර පූජාව, අටපිරිකර පූජාව, සංඝාවාස පූජාව, සඟ සතු කොට දන් පිදීම, දහම් පොත් ලිවීම, කෙත්වතු පූජාව, බුද්ධ ප්‍රතිමා ඉදිකිරීම, වැසිකිළි සකසා පූජා කිරීම කියන මේ පූජාවන් අතරින් ඉතාමත් වැදගත් තැනක් හිමි වෙන්නෙත් කඨින පූජාවට.

මේ කඨින පූජාවේ ආරම්භය පැවතෙන්නෙ මෙන්න මේ විදියට. බුදුන් වහන්සේගෙ කාලයේ පටන් අළුතෙන්ම සිවුරක් හදා ගන්න ක්‍රමවේදයක් තිබුණා. සම්පූර්ණ සිවුරක් කැලි කැලි එකතු කරල මහල ගන්න කොට, එක පැත්තක් කොට වෙලා තව පැත්තක් දික් වෙලා හරියට සිවුරේ හැඩය මතු නොවන ගැටළුවක් ඒ කාලයේ වැඩ වාසය කරපු භික්ෂූන් වහන්සේලාට තිබුණා. මේ ගැටළුව ලිහා ගන්න භික්ෂූන් වහන්සේලා බුදු රජාණන් වහන්සේගෙන් ක්‍රමයක් ඉල්ලා හිටියා. ඒ නිසා කිසියම් වූ රාමුවකට තියල සිවුර හදා ගන්න ක්‍රමවේදයක් උන් වහන්සේ අනු දැන වදාළා. ඊට පස්සෙ එහෙම හදාගෙන කැලි එකට තියල මැහුවම ඇදකුද නැතුව හරි ගියා. ඉතිං මෙහෙම සිවුර හදා ගන්න එකට තමයි කඨිනය කියල කිව්වෙ.

ඒ කියන්නෙ ඉස්සර සිවුරක් සකස් කරන කොට පිරිස එකතු වෙලා ඉස්සෙල්ලම අමුවෙන් කපු අරගෙන නූල් කටිනවා. ඊට පස්සෙ ඒ නූල් අරගෙන රෙද්ද වියනවා. ඒ විදියට සියල්ල සකස් කරල කැලි අල්ලල පඬු පොවල තමයි අවසානයේ සිවුරක් සකස් කරගෙන පූජ කළේ. අද ඒක සංකේතයක් විදියට කළාට, එදා සැහෙන පිරිසකගෙ ශ්‍රම සහභාගීත්වයෙන් විසාල වෙහෙසක් මහන්සියක් දරල තමයි ඒක කළේ. ඒ නිසා තමයි අහසින් ලැබුන රෙද්දක් කියල කිව්වෙ. මොකද ඒක සකස් කරපු තනි හිමිකාරයෙක් නෑ, ඒ තරම් පිරිසක් සහභාගි වෙලා තමයි ඒ වැඩේ කළේ. එතකොට තනි කෙනෙක්ගෙ මහන්සියක් නෙවෙයි, අහවල් කෙනා විතරක් තනියෙන් පූජ කළා කියන්න බෑ. ඒ තමයි කඨින චීවරය හදා ගැනීමේ මුල.

බුදුන් වහන්සේගෙ කාලයේ පින්වත් පිරිස් විසින් දෙන රෙදි හෝ රෙදි කැලිවලින් එක එක කැලි තියල මහල තමයි භික්ෂූන් වහන්සේලා විසින්ම මේ



චීවරය සකස් කර ගත්තෙ. පසු කාලයකදී ගිහි වතේ ඉන්න අයටත් සිවුරු සකස් කරන්න බුදු පියාණන් වහන්සේගෙන් අවසර ලැබුණට පස්සෙ, බොහොම සතුටින් පින්වත් පිරිස් ඒක භාරගෙන හදල දෙන්න පටන් ගත්තා.

වර්තමානයේ මේ කඨින පූජාව විවිධ සාම්ප්‍රදායික ක්‍රමවලට පූජාවක් වශයෙන් සිද්ධ කරගෙන යනවා. නමුත් ඒ කාරණය නිවන් මගට පසුතලයක් වෙන්නෙ කොහොමද කියන කාරණය පිළිබඳව බොහොමයක් බෞද්ධ පිරිස් දැනුවත් නෑ. මේ කඨින පූජාව නිවන් මග වඩා ගන්න සෘජුවම සම්බන්ධ නොවුණත්, නිවන් මග සඳහා අවශ්‍ය පසුතලය සකස් කර ගන්න ඉවහල් වෙන, බොහොම පිං රැස් කරගන්න පුළුවන් පූජාවක්. මනුස්ස සම්පත් අතර ඉහළම සැප සම්පත් ළඟා කර ගන්න පුළුවන් පිනක් ලෙසත් කඨින චීවර පූජාව පිළිබඳ මහා නාගිත අපදානයේ විස්තර කරල තියෙනවා. විපස්සි බුදුන් වහන්සේ වැඩ වාසය කරන සමයේ, වස් කාලය තුළ භික්ෂූන් වහන්සේලාට සිවු පසයෙන් උපස්ථාන කරල අවසානයේ කඨින චීවර පූජාවක් සිදු කරල, ඒ ආනිසංසයන් සසර පුරාවට විඳල, ගෞතම බුදුන් වහන්සේගෙ කාලයේ නාගිත නම් වූ තෙර නමක්, කඨින සිවුරක් සංඝයාට පූජා කරල ලැබුණු සැප සම්පත් ගැන මහා නාගිත අපදානයේ මේ විදියට සඳහන් වෙලා තියෙනවා.

"මම මෙයින් කල්ප අනූ එකකට පෙර බුදු පාමොක් මහ සඟනට කඨිනයක් පිදුවෙමි. ඒ කුසල බලයෙන් කල්ප තිහක් දුගතියකට නොපැමිණියෙමි. අටලොස් කල්පයක්ම දෙව් ලොව සිත් අලවා වාසය කළෙමි. තිස් හතර වාරයක් ශක්‍ර සම්පත් වින්දෙමි. එක් ඉඳි කටු ඇසකට තිස් හය වාරයක් බැගින් සක්විති සම්පත් ලැබුමට හේතු සම්පත් ඇති වුවත් සසර එපමණ කල් නොසිටි හෙයින් අසූහය වාරයක් සක්විති රජ සිරි වින්දෙමි. උපනුපන් හැම තැනකදීම කඨින දානයේ ආනිසංස වශයෙන් සියලු සම්පත් ලැබ ඉතා සුව සේ කල් ගෙවුවෙමි. දෙව් මිනිස් ලොව හැර අන් කිසි දුගතියක කවරදාවත් නූපන්නෙමි. ක්ෂත්‍රිය, බ්‍රාහ්මණ දෙකුලය හැර අනික් කිසි කුලයක කවරදාවත් නූපන්නෙමි. මුළු පොළව සුදු කසී සළුවෙන් වසන්නට තරම් පොහොසත් කෙනෙක් වූයෙමි. මේ කඨින චීවර දානයේ ආනිසංසයෙන් මම දෙව් ලොව උපන් කළ දෙවියන් අතරද, මනු ලොව උපන් කළ මිනිසුන් අතරද ඉතා ප්‍රිය මනාප කෙනෙක් වූයෙමි. අවසාන වශයෙන් මම ඒ කඨින චීවර දානයේ ආනිසංසයෙන් අමා මහ නිවන් ද ලබා ගත්තෙමි" මේ විදියට නාගිත හිමියන් බුදුන් වහන්සේ ඉදිරියේ ප්‍රකාශ කරල තියෙනවා.

භික්ෂූන් වහන්සේ නමකට වස් කාලයක (වැහි කාලයක) වස් ආරාධනා

කරල, වස් වසපු ඒ තුන් මාසයක් සඳහාම ඇප උපස්ථාන, උදව් උපකාර කරල උන් වහන්සේට නිදහසේ ආර්ය මාර්ගය පූර්ණ කර ගන්න පසුතලය සකස් කරල දීම තමයි කඨින පිංකමේදි සිද්ධ වෙන්නෙ. කිසිම දේකින් අඩු පාඩුවක් කරන්නෙ නැතුව, ගමේ ඉන්න පිරිසක් එකතු වෙලා භික්ෂූන් වහන්සේ නමක් හෝ කීප නමක් උදෙසා මේ වස් කාලය තුළ උන් වහන්සේලාට ආර්ය මාර්ගය වඩන්න අවශ්‍ය කරන උදව් උපකාර, බෙහෙත් හේත්, දාන මාන ආදී කිසිම දේකින් අඩුවක් නොකර, ඒ සියල්ලම භාර ගෙන කටයුතු කරන්න වග බලා ගැනීමක් මෙතනදී සිද්ධ වෙනවා. මේ විදියට භික්ෂූන් වහන්සේලාගේ ඕනෑ එපාකම් ඒ කාලය තුළ තමන් හෝ පිරිසක් විසින් භාරගෙන ඒ සඳහා භික්ෂූන් වහන්සේලාට කරන ආරාධනාවට වස් ආරාධනාව කියල කියනවා. ඇසළ පෝය දිනට පසු දින වස් සමාදන් වෙන උපසම්පදා භික්ෂූන් වහන්සේලා, වප් පෝය දිනයෙදි වස් පාවාරණය කරනවා. ඒ කියන්නෙ, පින්වතුන් විසින් දුන් දානය නිකං අපතෙ යැව්වෙ නෑ, ඒ කාලය තුල හිස්ව ගත කළේ නෑ, ප්‍රතිපත්ති අනුගමනය කළා.... ආදී වශයෙන් තමන් වහන්සේලාට පිංවතුන් විසින් ලබා දුන් දාන මාන ආදී ඇප උපස්ථානවලින් ඒ වස් කාලය තුළ සාසන මාර්ගය පූර්ණ කරගන්න උත්සාහ ගත් බව ඒ භික්ෂූන් වහන්සේලා විසින් ප්‍රකාශ කරනවා. ඊට පස්සෙ එන වප් (ඔක්තෝබර්) පෝය දින සිට ඉල් (නොවැම්බර්) පෝය දින දක්වා කාලය තුළ පමණක් මේ කඨින චීවර පූජාව සිදු කරන්න පුළුවන්. මේ මාස දෙක අතර කාලය චීවර මාසය කියලත් කියනවා. සමහර අවස්ථාවල පළමු මාසය කඨින මාසය ලෙසත්, දෙවන මාසය චීවර මාසය ලෙසත් හඳුන්වනවා. කඨින මාසය තුළදි රෙදිකඩ සකස් කරල, චීවර මාසයේදි පඬු පෙවීම සිද්ධ කරනවා. හැබැයි මේ කාරණය එදා එහෙම වුනත් පොත පතේ සඳහන් වෙන්නෙ නෑ. ඉතිං මේ මාසයක කාලය තුළ මේ පින්කමට සහභාගි නොවුනොත් තවත් වසරක් බලා ඉන්න සිද්ධ වෙනවා.

පිළිවෙත් පුරන භික්ෂූන් වහන්සේලාට තමන්ගෙ ප්‍රතිපත්ති පුරා ගන්න අවශ්‍ය නිදහස, කාල වේලාව ලබා දීල, උන් වහන්සේලාට මාර්ගය වඩා ගන්න අවශ්‍ය සියළුම දේවල් සොයල බලල ඉටු කරන්න ගමේ ඉන්න දායක පිරිසක් විසින් ඉඩ සලසල දෙනව නම් ඒක පින්වතුන්ට ලැබෙන මහඟු අවස්ථාවක්. **නිවන් දකින්න මග පාදගන්න කටයුතු කරන කෙනෙකුට ඒ සඳහා පහසුකම් සලසා දීම, උපකාර අතර මහෝපකාරයක් වෙනවා.**

මේ කරන උදව් උපකාර දෙවනි වෙන්නෙ, නිවනට උපනිශ්‍රය වෙන වටිනා දහම් දේශනා කරල මාර්ගය පාදා දීම කියන උත්තරීතර ගුණයට විතරයි. **ඇප උපස්ථානයන් තුළින් අග්‍ර, ශ්‍රේෂ්ඨ වෙන්නෙ නිවන් දකින්න කටයුතු කරන්නා වූ භික්ෂූන් වහන්සේලා කෙරෙහි හැකි අයුරින් ආධාර උපකාර කිරීම.** එහෙම ආධාර උපකාර කරනව නම්, ඉහළින්ම කරන්න පුළුවන් කාලයක් තමයි මේ වස් කාලය කියන්නෙ. එබඳු ආකාරයෙන් භික්ෂූන් වහන්සේලාට, හැකි උපරිමයෙන් උදව් උපකාර කිරීම සඳහා කරනු ලබන ආරාධනාව තමයි වස් ආරාධනාව කියල භාර දෙන්නෙ. වස් ගොට්ටක් පිරිනමනව කියන එකේ බලාපොරොත්තුව ඒකයි. කිසිම දෙයක් ගැන හිතල බලන්නවත් ඉඩක් තියන්නෙ නැතුව, හොඳ සෝදිසියෙන් ඉඳල අඩු පාඩු හොයල බලල, අසනීප ගැන හොයල බලල, ඒ සඳහා අවශ්‍ය කරන බේත් හේත්, ආහාර පාන, නිදහසේ ඉන්න අවශ්‍ය කරන පරිසරය යනාදී දේවල්වල ඇති අඩු පාඩු, ගමේ පිරිසක් විසින් එකතු වෙලා හොයල බලල කරන කටයුත්තෙදි වස් ආරාධනා කරල වස් කාලයේදි ඇප උපස්ථාන කටයුතු කරනවා.

මේ ආකාරයට අංග සම්පූර්ණව කරල දුන්නට පස්සෙ භික්ෂූන් වහන්සේලා වඩින්න ඉස්සෙල්ල උන් වහන්සේලාගෙ සිවුරු, අටපිරිකර ආදියෙහි අඩු පාඩු බලල සියල්ල පූර්ණ කරල දෙනවා. එහෙම කරල අවසානයේදි, තුන් මාසයක් තිස්සෙ තම තමන් කරපු දේවල්වලට ප්‍රසාදය පිණිස උන් වහන්සේලාගෙන් පුණ්‍යානු-මෝදනාවක් කරව ගන්නවා. භික්ෂූන් වහන්සේලාත් ඒ තුන් මාසයක් මුළුල්ලේ දායකයන් විසින් සිදු කර ගත්තා වූ පින එකවිට සිහි කරවල දෙනවා. උන් වහන්සේලා ඒ ලබා ගත් දානය නිසා බොහොම විවේක සුවයෙන් මාර්ගය වඩා ගැනීමේ කටයුතු සිද්ධ කරගත් බවත්, රෑ දවල් වෙහෙස මහන්සි වෙලා ඒ මාර්ගය වඩා ගන්න කටයුතු කළ බවත්, මේ දායක පිරිස විසින් කළ මේ උදව් උපකාර නිසා ඒ පින්වතුන් විසින් අප්‍රමාණ ලැබීමක් උදා කර ගත්ත බවත් පවසල චිත්ත ප්‍රසාදයක් ඇති කරවනවා. එහෙම කියන කොට ඒ උපාසක උපාසිකාවන්ට අසීමිත සතුටක් තම තමන්ගෙ හිත්වලට දැනෙනවා. තමන් සාසනය උදෙසා කරපු ඒ මහඟු පුණ්‍ය කර්මය සිහි වෙන කොට ඒ ශ්‍රද්ධා භක්තිය පිරිල ඉතිරිලා යන නිසා ඇහැට කඳුළු පවා උනනවා. ඒ තරම් අසීමිත චිත්ත ප්‍රසාදයක් ඒ අවස්ථාවෙදි ඇති වෙනවා.

මේ විදියට නැගෙන චිත්ත ප්‍රසාදය වළක්වන්න සාමාන්‍ය පාප කර්මයකට බැරි බවත් ධර්මයේ සඳහන් වෙනවා. කෙනෙක් විසින් කරන ලද ආනන්තරික හෝ ආර්ය උපවාද කියන පාප කර්මයක් නොවුන නම්, අනෙක් සාමාන්‍ය පාප කර්ම අභිබවා මේ කර ගත්තා වූ පින මරණාසන්න මොහොතෙදි නැගිල එනවා. වෙනත් යම් පාප කර්මයක් කරල තිබුන නම් මේ කර ගත්ත පින සිහි වෙනකොට ඒ පාප කර්මයට නැගී එන්න ඉඩක් නැතුව යනවා. ඒ තරම් මහා බලවත්ව ඒ පින නැගිල එනවා. මේ සුචරිතය, කළ ගුණය, උපකාරය මරණාසන්න මොහොතෙදි ඇදිල එනවා. අපාගත වෙන්න තරම් හේතුවක්, වින කරපු පාපයකින් තිබුන නම් ඒවා ළං වෙන්නෙ නැතුව යනවා. එහෙම අවස්ථාවක් තියෙන නිසා මේ කඨින ආනිසංස හරි වාසනාවක් කියල කියනවා.

ඒ භික්ෂූන් වහන්සේ තමන් වහන්සේට මාර්ගය වඩා ගන්න ලැබුණු උදව් උපකාර ඒ උපාසක උපාසිකාවන්ට සිහි කරවල දෙන්න ඕන. තමන් වහන්සේට දානය නැති අවස්ථාවල ඒ අයට කන්න තිබිච්ච දේ හරි දීපු උපාසක උපාසිකාවන් හිටිය නම්, ඒ බව දන්නව නම්, ඒවා සිහි කරවල දෙන්න ඕන. තමන්ගෙ දරුවන්ට කන්න දෙන්න තිබිච්ච ඒ ආහාරයෙන්, ඒ මුදලින් තමයි මේ ආකාරයට මේ දානය සිද්ධ කර ගත්තෙ... ආදී වශයෙන් සිහි කරන කොට ඒ දායකයන්ගෙ හිත්වල අසීමිත පැහැදීමක් ඇති වෙනවා. තම තමන් කරපු උදව් උපකාර, දාන මාන ආදිය පිළිබඳව උන් වහන්සේලා කොච්චර නම් දන්නවද, ඒ දානය අපතෙ යවන්නෙ නැතුව ඒවායේ වටිනාකම දැකල උන් වහන්සේලා කටයුතු කරල තියෙනවා, මේ බුද්ධ සාසනයේ සංඝ රත්නය කියන්නෙ කොච්චර නම් උත්තම වූ රත්නයක්ද ... ආදී වශයෙන් සංඝ රත්නයේ අසීමිත ගුණ, උපාසක උපාසිකා සිත්වල පේන්න පටන් ගන්නවා. මේ විදියට සංඝ රත්නයේ අසීමිත ගුණ පේන්න තරම් ඇති වෙන චිත්ත ප්‍රසාදය දෙවැනි කරන්න තරම් කිසිම දෙයක් නැතුව යනවා. ආනන්තරීය පාප කර්මයක් හෝ ආර්ය උපවාදයක් කරපු කෙනෙක් හිටිය නම් ඒකෙන් බේරෙන්න බැරුව යනව මිසක්, අනෙක් සියළු පාප කර්ම මැඩ පවත්ව ගෙන මේ පින මරණාසන්න මොහොතකදි පවා නැගිල එන්න පුළුවන්. ආනන්තරීය හෝ ආර්ය උපවාද පාප කර්මයක් තිබුන නම් සමහර විට ඒවායේ බලය අඩු වෙන්න හේතු වෙන්න පුළුවන්.

මේ විදියට ගමේ ඉන්න දායක පිරිස කාලයක් තිස්සෙ කැප වෙලා කරපු කටයුතු, භික්ෂූන් වහන්සේලා විසින් යලි සිහි කරවල දෙනවා. එහෙම පින සිහි කරල

දීමේ වටිනාකම අසීමිතයි. ඊළඟට කඨින චීවරය පූජා කරන දවසෙ භික්ෂූන් වහන්සේලාගේ සියළු අඩු පාඩුකම් හොයල බලල කරල දීපු උපකාර සිහි වෙන කොට, ඒ දායකයන් තුළ ඇති වන අසීමිත චිත්ත ප්‍රසාදය සම කරන්න වෙන ලෞකික වූ කිසිම පුද්ගලික දානයක් නෑ. සාංඝික දානයට විතරයි ඒක දෙවෙනි වෙන්නෙ. මේ ලෝකෙ එක එක සත්වයෝ එක එක ඵල ලබනවා. පිං කරල දෙව් ලොව ඉපදුනාම දිව්‍ය ඵල ලැබුණ වෙනවා. භාවනා කරල බඹ ලොව ඉපදුනාම බ්‍රහ්ම ඵලයක් ලැබුණ වෙනවා. පිං දහම් කරල දාන දීල සිටුවරු වෙලා උපදිනවා, ධනවතුන් වෙලා උපදිනවා. එතකොට ධනවත් ඵලයක් ලැබුණ වෙනවා. හැබැයි මේ සියළු ඵල ගෙවිල යන ඵල මිසක් මහත් ඵල නෙවෙයි. යම් ඵලයක් මහත් වෙනව නම් ලැබිච්ච ඵලයේ අඩුවක් වෙන්න බෑ.

එහෙනම් ගෙවෙන්නෙ නැතුව මහත් වෙන්නෙ මාර්ග ඵල විතරයි. සෝවාන් ඵලය ලැබුණොත් කවදාවත් අඩු වෙන්නෙ නෑ. තව තවත් වැඩි වෙලා සකෘදාගාමී ඵලය දක්වා වර්ධනය වෙනවා, අනාගාමී ඵලයට වර්ධනය වෙනවා, අරිහත් ඵලයට වර්ධනය වෙනවා. එහෙනම් යම් පිනක් තමන්ට සෝවාන් ඵලයට පත් වෙන්න ආධාර දෙනවද ඒක මහත් ඵලයක් ගෙන දෙන පිනක් වෙනවා. ඒ නිසා තමයි කඨින චීවර පූජාවේ පින මහත් ඵලයි මහානිසංසයි කියල කියන්නෙ. මහත් ඵලයි මහානිසංසයි කිව්වම කාරණා දෙකක් තියෙනවා. එහෙම කර ගත්තා වූ පින ඒකාන්තයෙන්ම නිවන් අවබෝධ කරගැනීමට උපකාර වෙනවා. තුන් මසක් තිස්සේ නිවන් අවබෝධ කර ගැනීමට කළ උපකාරය යම් තාක් මහත්ද, ඒ සියල්ල කැටි කරල කරන ඒ පුණ්‍යානුමෝදනාවෙන්, ඒ කැටි වෙච්ච මහා පිං කන්දරාව ඒකාන්තයෙන්ම තමන්ටත් මහත් ඵලයක් ලබන්න හේතු වෙනවා. ඒකයි කඨින පූජාව මහත් ඵලයි කියල කිව්වෙ.

ඒ වගේම මේ කඨින චීවර පූජාව මහානිසංස වෙන්නෙ මෙහෙමයි. නිස + අංසය කියන්නෙ නිශ්‍රය කරන අංසය. එහෙම නැත්නම් ලෝකය ඇසුරු කරන අංසය. දෙවි වුණත්, බඹ වුණත්, සක්විති රජ වුණත්, මහා ධන කුවේරයෙක් වුණත් මේ සියල්ල ලෝකය නිශ්‍රය කරගෙන තමයි කටයුතු කරන්නෙ. ඒ නිසා ඒ කවුරු වුනත් නිශ්‍රයේ අංසයක් මිසක් අනිශ්‍රයේ අංසයක් නෙවෙයි. එහෙනම් මේ මහත් ඵල ලබන කොට මේ නිශ්‍රය කරගෙන හිටපු ලෝකය අත් හැරී, නොඇලී මිදී යනවා, අනිශ්‍රයට පත් වෙනවා. ඒ නිසා මහා අනිශ්‍රයේ අංසය තමයි මහානිසංසය (මහා + ආනිස + අංසය) වෙන්නෙ. එහෙනම් මාර්ග ඵලයන්ටත්, අත් හැරී නොඇලී මිදී ලබන නිවනටත් හේතු වන්නා වූ යම් පිනක් ඇත්ද, ඒක මහත් ඵලයි මහානිසංසයි. නිවනට උපකාරී වන අන්දමින් ඊට අවශ්‍ය කරන සියළුම දේවල් ඒ භික්ෂූන් වහන්සේලාට ලබා දුන්නම, ඒ කර ගත්තා වූ පින මහත් ඵල මහානිසංස ගෙන දෙනවා.

යාවතා සබ්බ පරික්ඛාරේ
සංඝස්ස සතතං දදේ
ඒකස්ස කඨින දානස්ස
කාලං නාග්ඝන්ති සෝළසිං

යම් කෙනෙක් භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය කරන සියළු පිරිකර හැමදාම නිරතුරුව පූජා කිරීමෙන් ලැබෙන ආනිසංසත්, කඨින චීවරයක් පූජා කිරීමෙන් ලැබෙන ආනිසංසත් අතර සොළොස් කලාවෙන් කලාවක් (දහසය ගුණයෙන් එකක්) නොවටිනා ගුණ පරතරයක් තියෙන බවයි ධර්මයේ සඳහන් වෙන මේ ගාථාවෙන් කියවෙන්නෙ.

ගිරිරාජ සමංරාසිං
සංඝේ දේති තිචීවරං
ඒකස්ස කඨින දානස්ස
කාලං නාග්ඝන්ති සෝළසිං

ලෝකයේ ඇති උසස්ම වර්ගයේ වස්ත්‍රවලින් දෙපට සිවුරු, තනිපට සිවුරු, අඳන ආදී සිවුරුවලින් මහමෙර උසට ගොඩ ගහල පූජා කළත්, කඨින පූජාවක් කිරීමෙන් ලබන ආනිසංසත් එක්ක ගත්තම දහසය පංගුවෙන් එක් කොටසක් තරම්වත් නොවටින බවයි මේ ගාථාවෙන් කියවෙන්නෙ. කඨින චීවරය ප්‍රතිපත්ති පූජාව මුල් කරගෙන කරන නිසා සිවුපස පූජාවට වඩා වටිනවා.

ඒ වගේම ඒ කාලෙ ඉඳන් වෙනත් පිරිකර පූජා කරන්න අවස්ථාව තිබුනත්, කඨින චීවරයක් පූජ කරන්න ලේසියෙන් හොයා ගන්න අවස්ථාව ලැබුනෙ නෑ. ඒ තරම් දුර්ලභයි, හදාගන්න බොහොම අමාරුයි. අද ඒක දුර්ලභ නැති වෙන්න හේතුවත්, එදා එහෙම දුර්ලභ දෙයක් පූජා කිරීමෙන් ලැබෙන පින මනුස්ස, දිව්‍ය, බ්‍රහ්ම ආදීන් අනුමෝදන් වීම නිසා මහත් සම්පත්තියක් උදාවෙලා තිබීම. එතකොට එදා එහෙම යහපත් දුර්ලභ දේ පූජා කිරීම නිසා තමයි අද ඒක දුර්ලභ නොවී සම්පත්තියක් විදියට පිහිටන්නත් හේතු වෙලා තියෙන්නෙ.

දැන් කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන්, එහෙනම් බෞද්ධ නොවන අන්‍ය ආගමික රටවල උදවියට ලෞකික වශයෙන් විසාල සම්පත්තියක් ලැබිල තියෙන්නෙ කොහොමද කියල. මෙතනදි බුද්ධ සාසනයක් කිව්වම මේ ඉන්න සුළු පිරිසක් විතරක් නෙවෙයි ඒ වගේ පුණ්‍ය කටයුත්තකට අත ගහන්නෙ. අපට නොපෙනෙන ලෝකවල ඉන්න විවිධාකාර දිව්‍ය, බ්‍රහ්ම, අමනුස්ස කොටස් පවා ඒ වෙලාවෙදි යම් කිසි චිත්ත ප්‍රසාදයක් මතු කර ගත්ත නම්, ඒක කවද හරි මනුස්ස අත්බැවක් ලැබිච්ච කාලෙක සම්පත්තියක් මතු කරල දෙන්න හේතු වෙනවා. එදා එහෙම අනුමෝදන් වෙච්ච අය අද විවිධ අන්‍යාගමිකයන් වශයෙන් ඉපදිලා ඉන්න පුළුවන්. මොකද චතුරාර්ය සත්‍යය නොදන්න නිසා ඊළඟ අත්බවයෙත් බෞද්ධයො වෙනවයි කියල නියමයක් නෑ. පින කියන එක ලෞකික නිසා ඒ ලැබීම මොන ආගම ඇදහුවත් ලබන්න පුළුවන්. ඒ වගේම සමහර විට අන්‍ය ආගමිකයෙක් වෙලා ඉඳගෙනත් බුද්ධ සාසනයට යම් කිසි පුංචි දෙයක් හරි පූජ කළා නම් ඒකෙ ලැබීම පුංචි නෑ. අද වුනත් එහෙම කරන අන්‍යාගමික පිංවතුන් ඕන තරම් ඉන්නවා. නිවන් දකින පරමාර්ථයක් ඒ අයට නොතිබුණත් ලෞකික බලාපොරොත්තුව ඉෂ්ට වෙන්න හේතු යෙදෙනවා. බෞද්ධයින්ගෙ ප්‍රධාන අරමුණ නිවන නිසා ඒ අයට නිවන් මග පූර්ණ වෙන්න හේතු වෙනවා, ඒ නිසා ලෞකික ලැබීම අඩු වෙන්න පුළුවන්. ඒ නිසා මෙතනදි දැනගන්න ඕන කාරණය තමයි ඉඳිකටු තුඩක දෙයක් හරි බුද්ධ සාසනයට යම් අරමුණකින් පූජ කළා නම්, ඊට අනුකූල ලැබීමක් පහළ වීමට හේතු යෙදෙන බව.

ඒ වගේම හැම බුදුවරයන් වහන්සේ නමකගෙම සාසනය තුළ දස දහසක් සක්වල ඉන්න සියලු දිව්‍ය බ්‍රහ්මයින් එකට රැස් වන අවස්ථාවක් යෙදෙනවා. ඒකට කියන්නෙ මහා සමය කියල. ඒ වගේ මහා සමයක් හැම බුද්ධ සාසනයකම එක් අවස්ථාවක යෙදෙනවා. ඒ වෙලාවෙදි ඒ දස දහසක් සක්වලම ඉන්න දිව්‍ය බ්‍රහ්මයො බුද්ධ නමස්කාරය කරනවා, චිත්ත ප්‍රසාදයක් ඇති කරනවා. ඒ වෙලාවෙදි ඔය අන්‍යාගමික දෘෂ්ටි කතාවල් මුකුත් නෑ. ඒ ආගම් දෘෂ්ටි සියල්ලම තියෙන්නෙ මේ මනුස්සයො වෙලා උපන්නට පස්සෙ. මාර දෙවිවරු පවා ඒ අවස්ථාවෙදි කලබල නොකර නිහඬ වෙනවා. ඒ කියන්නෙ අවස්ථාවාදීව හරි ඒ ප්‍රාතිහාර්ය දකල සද්ද නැතිව ඉන්නවා. අර වගේ **දිව්‍ය බ්‍රහ්ම තත්ත්වයට පත් වුනාම මහා සමය අවස්ථාවක් උදා වුනොත්, ඒ හැම කෙනාටම බුදුන් වහන්සේ නමකට නමස්කාර කරන්න අවස්ථාව ලැබෙනවා.** ඒ වගේ අවස්ථාවකදි ඒ දස දහසක් සක්වල දිව්‍ය බ්‍රහ්මාදීන් යම් තරමක් හිටිය නම්, ඒ සියලු දෙනාම ඒ අවස්ථාවට සම්බන්ධ වෙලා බුදුන් වහන්සේට ගරු කිරීමක් කරනවා. ඒ වගේ අවස්ථාවක යමෙක් දිව්‍ය බ්‍රහ්මයො අතර හිටිය නම් එක වතාවක් හරි ගරු නොකරපු කෙනෙක් නෑ. ඒ වගේ අය පසුව වෙනත් හේතුවකින් සතර ☞

අපාගත වෙලා හරි ඉන්න පුළුවන්. සමහර විට ඒ ගරු කරපු අය කවද හරි මනුස්සයො වෙලා ඉපදුනත් බෞද්ධයො නොවී වෙනත් ආගම් අදහන්නත් පුළුවන්. මෙහේ මනුස්සයො වෙලා ඉපදුනාට පස්සෙ තමයි විවිධ දෘෂ්ටිවලට පත් වෙන්නෙ. නමුත් දිව්‍ය බ්‍රහ්මයො අතර ඉන්න කොට එහෙම භේදයක් නෑ. ඒ කියන්නෙ මනුස්ස ලෝකෙ වගේ ආගම් වශයෙන් බෙද නෑ. මොන ආගම ඇදහුවත් පාපයට ලැජ්ජා බිය ඇතිව කටයුතු කිරීම තමයි දේව ධර්මය කියන්නෙ. දෙවි කෙනෙක් වෙන්න ඒක අවශ්‍යයි. යම් කිසි කෙනෙක් දේව ලෝකවල උපන්නට පස්සෙ යම් යම් දෘෂ්ටි ගතවීම් වෙන්න පුළුවන්. හැබැයි මනුස්ස ලෝකෙ වගේ නියත මිත්‍යා දෘෂ්ටියක් නෑ. බොහෝ කොටම නිවන් මගට බාධා පැමිණවීම තමයි ඒ දෘෂ්ටිගත වෙච්ච අය කරන්නෙ. ඒ අය දේව මගට කැමතියි. ඒ නිසා තමයි බුදුන් වහන්සේට පවා ලෞකික සැප සම්පත් ලබල පින් දහම් කරල රජ වෙලා ලෝකයාට සේවය කරන්න කියල මාර දෙවිවරු ඉල්ලා හිටියෙ. මේ වගේ දෘෂ්ටි ගතවෙච්ච අය බුදු දහම වැළඳ ගත්තෙ නැති වුනාට බුදුන් වහන්සේ ගරු කළ යුත්තෙක් කියල දකිනවා.

අද ආගමික වශයෙන් විවිධ අය දෘෂ්ටි ගත වෙලා හිටියට, ඒ අයගෙ මූලික අන්‍යාගමික නායකයන් එහෙම දෘෂ්ටි ගත වෙලා ඉඳල නෑ. උදාහරණ විදියට අද ඉන්න සමහර අන්‍යාගමික අය බුදුන් වහන්සේට යක්ෂයා කියල කෑ ගැහුවට, ඒ ආගම්වල මූලික නායකයො බුදුන් වහන්සේට උත්තමයෙක් හැටියට ගරු කරල තියෙනවා. ඒ කාරණය පොත් පත්වල නැතත් ගුප්ත ලෝකය දකින්න පුළුවන් නම්, ඒ ගුප්ත ලෝකයේ ඉන්න අන්‍යාගම් අදහන අයගෙ හැසිරීමෙන් ඒ කාරණය ඔප්පු වෙනවා. නමුත් ඒව මුකුත් දන්නෙ නැතිව එක එක්කෙනාගෙ කට කතාවල් අල්ලගෙන තමයි සමහර අය පහර ගහන්නෙ. අද පක්ෂ භේදයක් වශයෙන් ආගම් හදා ගත්තු අය තමයි ඒ විදියට පහර ගහල නිගරු කරල අන්තිමට දුගතිගත වෙන්නෙ. ඒක ඉස්සරත් තිබුණා, අදත් තියෙනවා. නමුත් ඒ කාලෙත් ඔය දිව්‍ය බ්‍රහ්ම කියන තැනට ගියාම උච්ඡේද දෘෂ්ටි ගත තත්ත්වයට වැටුනෙ නෑ. ඊට වඩා ඉහළ මානසිකත්වයක ඒ අය හිටියා. ඒ අය ඒ කාරණය දකින නිසා මනුස්ස ලෝකෙ වගේ ආගම් භේදයක් නෑ. මොනව හෝ මාත්‍රයක් හරි යහපතක් කරන කෙනෙක් දැක්කොත්, ඒ අය හොඳ අය විදියට දකිනවා. යහපත කරපු අය හොඳයි කියල තීරණය කිරීම තමයි ඒ අයගෙ ස්වභාවය. නමුත් මේ වගේ දේවල් අද කතා කරන කොටත් සමහරු තරහයි. යේසුස් වහන්සේ බුදුන් වහන්සේට ගරු කළා කියල අද කිව්වොත් ඒකට සමහරු දොස් කියනවා. උඹල කොහොමද ඒක දන්නෙ, ඕව පිස්සුවෙන් දොඩවන කතා, ආගමික වශයෙන් කත් ඇදල බුද්ධාගම නැති කරන්න හදනවා.... ආදී වශයෙන් නොයෙක් ආකාරයෙන් දෝෂාරෝපණය කරන්න පුළුවන්. නමුත් යථාර්ථය ඕකයි. දැන් බෞද්ධ නොවී ඉස්ලාම්, කතෝලික වගේ අන්‍යාගමක ඉන්න කෙනෙක් දේව අත්භවයකට ඒ අයගෙ වචනවලින් සුද්ධාත්ම කියල කියන්න පුළුවන්. නමුත් ඒ අය සුද්ධාත්මය කියල කියන ඒ අවස්ථාවෙ ඉන්න අය බෞද්ධ අබෞද්ධ කියල නිගරු කරන එහෙම භේදයක් නෑ. මනුස්ස ලෝකෙදි හදා ගත්තු එක එක්කෙනාගෙ මත නිසා තමයි ඒ විදියට භේද ඇති කර ගන්නෙ.

ඒ වගේම යමක් පූජා කිරීමේදී තමන්ගෙ පරමාර්ථය අනුවයි ඒකෙ ප්‍රතිඵල ලැබෙන්නෙ කියන කාරණය සීවලී මහ රහතන් වහන්සේට තිබිච්ච දානමය ලැබීමෙන් පැහැදිලි වෙනවා. උන් වහන්සේ පෙර අත් බැවක, නැත යන වචනයක් අසන්නට නොලැබේවා කියල දුන්න දානයක් දෙකක් මුල් කර ගෙන ගෞතම බුද්ධ සාසනයේ දානය ලැබෙන්නන් අතරින් අග තනතුර ලැබුණා. එබඳු හේතු වාසනාවක් පහළ වුණා. නමුත් දාන පාරමිතාවේ පරමත්ථ පාරමිතාවට එනකල්ම පෙරුම් පුරපු ලොව්තුරා බුදුන් වහන්සේටත් සමහර අවස්ථාවලදී දානය නැති වුණා. සමහර දවස්වලට, අද දානෙ ලැබෙන්නෙ නැති පාටයි කියල භික්ෂූන් වහන්සේලා කියන කොට, සීවලී හාමුදුරුවො වඩිනවද කියල බුදුන් වහන්සේම අහනවා. වඩිනව කිව්වොත්, එහෙනම් අද දානෙ වරදින්නෙ නෑ කියල උන් වහන්සේම කියනවා. එතකොට ලොව්තුරා බුදු වෙච්ච, මෙච්චර දාන පාරමිතා පුරපු බුදුන් වහන්සේ ඉස්සරහින් වැඩලත් දානෙ නොලැබිච්ච සමහර දවස් තිබුණා.

එතකොට දානමය ලැබීම් සම්බන්ධයෙන් බුදුන් වහන්සේට වඩා සීවලී මහරහතන් වහන්සේට එච්චර වාසනාවක් ලැබුණෙ කොහොමද? බුදුන්ටත් වඩා සසරෙ අප්‍රමාණ දන් දීලද? බුදුන් වහන්සේ පෙරුම් පුරන බෝධි සත්ව කාලෙදි දීපු අනන්ත දානත් එක්ක බලද්දි, ඕන නම් ඉඳිකටු තුඩක තරම් ප්‍රමාණයක් සීවලී හාමුදුරුවො දන් දීල ඇති. නමුත් අවසාන අත් බැවේ දානෙ ලැබීමේ වෙනසක් ආවා. ඒක වුනේ ප්‍රාර්ථනාව අනුව. සීවලී මහ රහතන් වහන්සේ පෙරුම් පුරද්දි මූලික ප්‍රාර්ථනාව වුනේ, දානය නැත යන වචනයක් අසන්න නොලැබේවා කියල. උන් වහන්සේ දානය මුල් කර ගත්තු මහා ශ්‍රාවක පැතුමත් එක්ක තමයි නිවන පැතුවෙ. බුදුන් වහන්සේ පෙරුම් පුරද්දි මූලික ප්‍රාර්ථනාව වුනේ, සත්‍යාවබෝධය සියලු ආකාරයෙන් පූර්ණ කරගෙන ලෝක සත්ත්වයා දුකින් මුදවාලීමට අවස්ථාව ලැබේවා කියල.

ඒ වගේ ලෝකෙ ජීවත් වෙද්දි මූලිකව නිවන් පතන්නෙ නැතිව, ලෞකිකත්වය තුළ සැප සම්පත් පත පතා දන් දෙන අය ඉන්නවා. ඒ අයට ඊට අනුකූලව ලැබීම පහළ වෙනවා. නමුත් නිවන දුරයි. බෞද්ධයො යම් තරමකට හෝ දාන මාන දෙන කොට නිවන් පතා දන් දෙනවා. ඒ නිසා ඒ අයට නිවනට මග පෑදෙනවා. ලැබීම අඩු වෙන්න පුළුවන්. මේ වෙනසට ඒකත් එක හේතුවක්. නමුත් මේ කාරණය දන්නෙ නැති අය පටලවා ගෙන විවිධ මත ප්‍රකාශ කරනවා. නිවනටම උපනිශ්‍රය වේවා කියල ප්‍රාර්ථනා කරගෙන දන් දීපු උදව්යට ලැබෙන සම්පත්තිය අඩු වුනාට නිවන කරා යන්න මග පෑදෙනවා, සසර දුකින් සදහටම නිදහස් වෙන්න මග පෑදෙනවා. ඒක හරි විශේෂයි. ලෞකික සැප සම්පත්තියක් ලැබෙන්න මේ පින හේතු වේවා කියල දාන මාන ආදිය දීපු අයට ඒ ලෞකික සම්පත්තිය ලැබිල නිවන් දුර වෙනවා. මේ සඳහා උපමාවක් තමයි සීවලී මහ රහතන් වහන්සේගෙ සහ බුදුන් වහන්සේගෙ දාන ලැබීම්වල වෙනසින් පෙන්නුවෙ.

එහෙනම් සැබෑ බෞද්ධ පිංවතුන් ඒ විදියට කර ගත්තා වූ ඒ පිං දහම්, රජ සැප, සිටු සැප, ලෝක පරමාර්ථයක්, ලෝක සම්පත්තියක් අපේක්ෂාවෙන් කළා නෙවෙයි. පරමාර්ථය වුණේ, ආර්ය මාර්ගය පූර්ණ කරගැනීම උදෙසා මේ විදියට තමන් විසින් කරනු ලබන උදව් උපකාර, ඇප උපස්ථාන මේ උත්තමයන් වහන්සේලාට මේ උත්තරීතර නිවන් ඵලයම ලබා ගැනීමටම හේතු වාසනා වේවා කියන පැතුමත්, ඒ ආනිසංසයන් තමන්ටත් එසේම ලැබේවා කියන බලාපොරොත්තුවත්. නිවන මුල් කරගෙන නිවන් මග පාදගන්න උත්තමයන්ට මේ ඇප උපස්ථාන නිවන සඳහාම වේවා කියන අධිෂ්ඨානයෙන් කර ගත්තා වූ මේ පින, තමන්ටත් ඒකාන්තයෙන්ම මහත් ඵල කියන්නා වූ මාර්ග ඵල ලබන්නත්, මහානිසංස කියන්නා වූ නිවන ලබන්නත් හේතු වෙන බව අවබෝධ කර ගන්න ඕන.

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**ප්‍රසාද් ද සිල්වා**
**පරිපාලන නිලධාරී**
**ශ්‍රී ලංකා පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය**

# දස දිසා බන්ධන බුද්ධ ආරක්ෂාව ගැන අමතර පැහැදිලි කිරීම්....

දස දිසා බන්ධන පිරිතෙන් ගෙවල් දොරවල් ආරක්ෂා කර ගන්න පහසු ක්‍රමයක් පසුගිය කලාපයෙන් ඉදිරිපත් කළා. ඒ ක්‍රමය අනුගමනය කරන කොට කෙනෙකුට යම් යම් ප්‍රායෝගික ගැටළු වගේම, යම් යම් කාරණාවලදී සිද්ධ වෙන හේතු ඵල ක්‍රම රටාව දැන ගැනීමේ කුතුහලයකුත් ඇති වෙන්න පුළුවන්. විශේෂයෙන් අද හැම දෙයක්ම වගේ විද්‍යානුකූලව හිතන්න පුරුදු වෙලා ඉන්න යුගයක එහෙම දැන ගැනීමේ අවශ්‍යතාවයක් ඇති වීමත් ස්වභාවිකයි. කොහොමත් මේ වගේ දේවල්වල හේතු ඵල රටාව දැනගෙන ඉදීම අවබෝධයට වැදගත්. ඒ නිසා ඒ සම්බන්ධයෙන් වහරක අභයරතනාලංකාර හිමියන් සමග කරපු වැඩිදුර සාකච්ඡාවක් ඇසුරින් කෙරෙන අමතර පැහැදිලි කිරීමක් තමයි මේ ඉදිරිපත් කරන්නෙ.

මේ බුද්ධාරක්ෂාවෙන් ජීවම් කරන පොල් තෙල්වලින්, සුවඳ දුම් කූඩුවලින්, ඒ වගේම මුදු වැලිවලින් අමනුස්ස කරදර පළවා හැරල ආරක්ෂාව සැලසෙන්නෙ කොහොමද කියල කෙනෙකුට හිතෙන්න පුළුවන්. මේ ජීවම් කරපු පොල් තෙල්වලින් පහන පත්තු කරන කොට එන සුද්ද ආලෝක කිරණ, අඳුරු ස්ථානවලට වැටුනම ඒ ස්ථාන විනිවිඳ යනවා. විශේෂයෙන් සෙත් කරපු බලය නිසා ඒ ආලෝක කිරණවල සුදු කිරණ ශක්තියත් වැඩියි. එතකොට අඳුරු කිරණ තියෙන අමනුස්සයින්ට ඒ කිරණ දරන්න බැරිව යනවා. මොකද අමනුස්සයො බොහෝ කොටම අඳුරු කිරණින් යුක්තයි. ඒ අයට ඒ ආලෝක කිරණ සැර වැඩියි. ඒ නිසා ඒවායින් දුවෙන්න පටන් ගන්නවා. අඳුරු කිරණ තියෙන්නෙ නරක අදහස් තියෙන අයට. ඒ නිසා මේ ජීවම් තෙලින් එන ආලෝක කිරණ ගැලපෙන්නෙ හොඳ අදහස් තියෙන අයට. එතකොට හොඳ අදහස් තියෙන අයට ඉන්න සුදුසු වටපිටාවක් හදල දෙනව මිසක්, නරක අදහස් තියෙන අය පුච්චන්න කියල නෙවෙයි මේ වැඩේ කරන්නෙ. මොකද නරක අදහස් තියෙන අය හොඳ තැන්වලට එන්න අවශ්‍ය නෑ. ඒ අයට වෙන් වෙච්ච වෙනම සුදුසු ස්ථාන තියෙනවා. නමුත් ඒ අය යම්කිසි උරුමයකින්, හිමිකමකින්, හේතුවකින් ආව නම් ඒ නිසාම තමයි ඒ අයට ඉස්සෙල්ලම ඥාති බතක් දීල පුණ්‍යානුමෝදනාවක් කරල ඒ අයගෙ හිමිකම ලබාදීල යුතුකම ඉෂ්ට කරල ඉන්න කිව්වෙ. එතකොට ඒ අයට හතුරුකමක් කළා වෙන්නෙ නෑ. ඒ හේතුවෙන් ඒ යුතුකම ඉටු කරපු පිරිසටත්, ඉන්න අවශ්‍ය සුදුසු පරිසරයක් ගොඩනැගිල එනවා.





ඊළඟට වායු ගන්ධයෙන් ජීවත් වෙන තවත් ගන්ධබ්බ අමනුස්ස ආදී කොටස් ඉන්නවා. විශේෂයෙන් ඒ වගේ අමනුස්සයො දුගඳ තමයි බොහෝ කොටම උරා ගන්නෙ. ඒක තමයි ඒ අයගෙ ආහාරය. එතකොට මේ සුවඳ දුම් කූඩුවලින් දුම් අල්ලන කොට ඒ දුගඳින් ජීවත් වෙන අමනුස්සයින්ට පහර වදිනවා. දුගඳ කියල කිව්වම අපිට දැනෙන දුගඳ විතරක් නෙවෙයි, අමනුස්සයින්ට ගැලපෙන, මනුස්සයින්ට ගෝචර නොවන සියුම් වායුමය කිරණ කොටස් තියෙනවා. ඒකෙන් අමනුස්සයින්ට ගැලපෙන පෝෂණ කොටස් ඒ අය ලබා ගන්නවා. සෙත් කිරණ යවන කොට ඒ කාවද්දපු සුවඳින් අර දුගඳ පෝෂණය වෙනස් කරනවා. එතකොට දුගඳ ආහාර කරගත්තු අමනුස්සයින්ට ආහාර නැති වීමෙන් ඉන්න බැරිව, සුගඳ ආහාරයට ගන්න කොටස්වලට විතරක් ඒ පරිසරය ගැලපෙන තැනක් වෙනවා. ඒ කියන්නෙ යහපත් සුගතිගාමී දේවතා කොටස් තමයි බොහෝ කොටම සම්බන්ධ වෙන්නෙ. මෙතනදිත් කාරණා 2 ක් සිද්ධ වෙනවා. එකක් ඒ දුගඳින් ජීවත් වෙච්ච අමනුස්සයින්ට ඒ ස්ථානයේ ආහාර නොමැතිවීම. අනෙක ඒ සුවඳ දුම නිසා දැවීම. මේ හේතු නිසා ඒ අය ඉවත් වෙනවා.


ඒ වගේම යම්කිසි විදියකින් ශරීර ඝනත්වයක් තියෙන අමනුස්ස කොටස් ඉන්නවා. සෙත් කරපු වැලි ගැහුවම ඒ ඝනත්ව තියෙන අමනුස්සයින්ට ඒකෙන් කිරණ පහර වදිනවා. එතකොට ඒ අමනුස්සයින්ගෙ ශරීර ඝනත්වයටත් ඒක පහරක් වෙනවා. මොකද විශේෂයෙන්ම මේ වැලි ඉසීමෙන් ඒ කිරණ වදින කොට ඒ ස්ථාන සැහැල්ලු කිරීමක් කරනවා. ඒ ඇති වන සැහැල්ලුව ඒ අමනුස්සයින්ට දරන්න බැරිව යනවා. නිකං විසි වෙන්න ගන්නවා, ඒ ස්ථානවල පිහිටල ඉන්න බැරිව යනවා.

මේ විදියට මේ කාරණා තුනෙන් ඒ පරිසර තත්ත්වයන් වෙනස්වීම නිසා අමනුස්සයින්ට ඒ පරිසරයේ ඉන්න බැරි වෙනවා. නමුත් ඒ අයට ඉන්න සුදුසු පරිසර වෙනම තියෙනවා. මොකද නැත්නම් කෙනෙකුට හිතෙන්න පුළුවන්, ඇයි ඒ අයව අසාධාරණ විදියට පන්නන්නෙ කියල. නමුත් මේ වගේ අවස්ථාවකදි අසාධාරණයක් කරගෙන තියෙන්නෙ ඒ අමනුස්ස කොටස්මයි. මොකද ඒ අයට ඉන්න වෙනම පෙරේත පාදයක් තියෙනවා. ඉඩමක් ගත්තම හැම මායිමකම පෙරේත පාදයක් තියෙනවා.

ඒ කියන්නෙ හතරැස් ඉඩමක් නම් ඒ ඉඩමේ දිග පළල මැනල මැද්දෙ ඉඳන් හතර පැත්තට, එකතු කිරීමේ (+)

☞

හැඩයට සමාන පරතරයක් තියෙන කොටු 4 කට බෙදුවොත් ඒ සම මිම් හතරෙන් මැද තියෙන පළවෙනි මිම්මෙ හතරැස් පාදය තමයි බ්‍රහ්ම පාදය කියන්නෙ. මේ බ්‍රහ්ම පාදය තියෙන්නෙ වීතරාගී හෝ කාමයන්ගෙන් වෙන් වෙච්ච කොටසට. ඒ නිසා තමයි නිවසට අහුවෙන ඒ කොටසේ මධ්‍ය ලක්ෂය ලෞකික කටයුතුවලින් වෙන් කරල පෑගෙන්නෙ නැති වෙන්න පිත්තල පහනක් හෝ මල් පෝච්චියක් වගේ දෙයක් තියන්නෙ. දෙවන කොටුව දේව පාදයටත්, තුන් වන කොටුව මනුස්ස පාදයටත්, හතර වන කොටුව පෙරේත පාදයටත් අහු වෙනවා. මේ විදියට කොයි හැඩයෙ ඉඩමක් වුනත් ඒක මැද ඉඳල වටේට ඉඩමෙ හැඩයට සමාන පරතර තියෙන ඉරිවලින් කොටස් 4 කට වෙන් කළාම ඒකෙන් මැද පාදය බ්‍රහ්ම පාදයටත්, ඊළඟ පාදය දේව පාදයටත්, ඊළඟ පාදය මනුස්ස පාදයටත්, ඉඩම මායිමේ වටේට පිහිටන පාදය පෙරේත පාදයටත් අහු වෙනවා. එතකොට වර්ග ඵලය ගත්තම වැඩිම වර්ග ඵලයක් තියෙන්නෙ පෙරේත පාදයට. අඩුම වර්ග ඵලයක් තියෙන්නෙ බ්‍රහ්ම පාදයට. ඒ වගේම ඉඩම විසාල නම් මේ පාදත් ලොකුයි. ඒ පාදවල වර්ග ඵලයන් සම්පූර්ණ ඉඩමෙ ප්‍රමාණය මත වෙනස් වෙනවා. (මේ පිළිබඳ වැඩි විස්තරයක් ලබන කලාපයෙන්)



එතකොට මේ පෙරේත පාදය ඉඩම වටේටම මායිමට යන කල් විහිදෙනවා. මනුස්සයො ගෙයක් හදනව නම් පෙරේත පාදය ඒකට මිශ්‍ර කරගන්න හොඳ නෑ. එහෙම කළොත් දුක් කරදර එන්න පුළුවන්. ඒ නිසා පුළුවන් තරම් දුරට පෙරේත පාදය ඉවත් කරල ගේ හදන්න උත්සාහ කරන්න ඕන. නමුත් ගෙවල් හදන කොට ලොකු ඉඩක් අවශ්‍ය නම් දේව, මනුස්ස පාද දෙකම අල්ලල ගේ හැදුවට ගැටළුවක් නෑ. මොකද දේව, මනුස්ස ගති දෙකම ළඟ ළඟම තියෙන කාම ලෝකයට අයිති ගති දෙකක් නිසා ඒ දෙක ගැළපෙනවා. නමුත් මේ පෙරේත පාදයට අහුවෙන්න ගෙවල් හදන්න හොඳ නෑ. හැබැයි ඉතින් පර්චස් 4 - 5 ක් වගේ ඉඩමක ගෙවල් හදන කොට ඒ ඉඩ ප්‍රමාණය මදි වෙනවා. ඒ නිසා තියෙන මට්ටමින් හරි පෙරේතයින්ට යන්න එන්න අඩියක් තරම් ප්‍රමාණයක්වත් ඉඩ තියන්න ඕන.

නමුත් අද විශේෂයෙන් නගර බද ගත්තොත් ඉඩ කඩ බොහොම සීමා සහිත නිසා පෙරේත පාදයට යන ඒ කොටසත් අල්ලල තමයි හුඟක් අය ගෙවල් හදල තියෙන්නෙ. ඉඩම් දෙකක් වෙන් වෙන මායිමක් ගත්තම, ඒ මායිම මැදින් තාප්පයක් බැඳල දෙපැත්තෙම ගෙවල් දෙකේ බිත්තිය ඒ තාප්පෙට අහු වෙන්න හදපු අවස්ථා තියෙනවා. එතකොට සීමාව වෙන්නෙ ඒ තාප්පය. එහෙම නැත්නම් මායිමටම අල්ලල බිත්තිය බඳිනවා. දැන් ඒ පැත්තෙ පෙරේත පාදය සම්පූර්ණයෙන්ම වැහෙනවා. නමුත් තාප්පය වෙනම බැඳල තිබුණ නම්, තාප්පය උඩින් හරි අමනුස්සයින්ට යන්න එන්න පුළුවන්. අඟල් 6 බැගින් දෙපැත්තෙන් අඩියක් ඉඩ තිව්වත් ඒ ටිකත් ඒ අයට යන්න එන්න ප්‍රමාණවත්. අඟල් 3 - 4 ක් තිව්වත් ඒකත් ඒ අයට මාධ්‍යයක් වෙනවා. තාප්පය දිගේ හරි යන්න එන්න පුළුවන්. ඒ නිසා බිත්තිය තාප්පෙන් වෙන් කරල තිබුණොත් ගැටළුවක් නෑ. නමුත් තාප්පෙත් කොටු කර ගත්තොත් ඒක ඇහිරෙනවා. ඒ කියන්නෙ තාප්පෙත් වැහෙන්න සීමාව අල්ලල බිත්තිය බැන්දොත්. හැබැයි තාප්පෙ ඝනකම බිත්තියට ගන්නෙ නැතිව තාප්පෙ සීමාවට ආසන්නව බිත්තිය තිබුනොත් පුංචි ඉඩක් හරි තියෙන නිසා ඒකත් ප්‍රමාණවත්. නමුත් වහල ගහන කොට තාප්පයටම අල්ලල ගැහුවොත් ඉඩ ඇහිරෙනවා. ඒ නිසා පුංචි ඉඩක් හරි ඉතුරු කරන්න ඕන. කෙස් ගහක ඉඩ ප්‍රමාණයක් තිබුණත් අමනුස්සයින්ට යන්න එන්න පුළුවන්. නමුත් පෙරේත පාදයට අයිති නියමිත ඉඩ ප්‍රමාණයම තිබීමයි, පුංචි කෙස් ගහක ඉඩ ප්‍රමාණයක් තිබීමයි අතර වෙනසක් තියෙනවා. නියමිත ඉඩ ප්‍රමාණය අඩු වුනාම පෙරේතයින්ට යන්න එන්න බාධා එනවා. නමුත් ඉතින් කරන්න දෙයක් නැති නිසා එහෙම ඉඩක් හරි තියන්න ඕන. නියම විදියට කරනව නම් මුළු පෙරේත පාදයම අත හරින්න ඕන.

ඉතින් මේ වගේ අවස්ථාවල ඒ ඉදිකිරීම කඩන්නෙ නැතිව ඒකට කරන්න පුළුවන් උපක්‍රමයක් තියෙනවා. ඒ අවහිරය තියෙන පැත්තෙ ඉඳන් අනිත් පැත්තට මල් වැලක් හිටවන්න පුළුවන්. ඒ තාප්පෙ උඩින් හෝ ගේ උඩින් මල් වැල ගෙනිහින් දෙපැත්තට සම්බන්ධ කළොත් පෙරේතයින්ට යන්න එන්න ඒකෙන් පාරක් හැදෙනවා. හරියට පාලමක් හදල දුන්න වගේ. ඒක නොකළොත් උන් සාප කරනවා. මෙතනදි සමහර මල් ජාති තියෙනවා, ඒ මල් වැල දිගට ගියාට පස්සෙ කාලාන්තරයක් යනකල් මැරෙන්නෙ නෑ. මල් නැතත් වැල තියෙනවා. ඉතින් ඒ වගේ ගස් දෙකක් හිටවල උඩින් සම්බන්ධ කළා නම් ඒ දෝසෙ මග හැරෙනවා. මේ ක්‍රමය අවශ්‍ය වෙන්නෙ, හදපු ගෙදර කඩන්න බැරි නිසා ඉඩ තියන්න වෙනත් ක්‍රමයක් නැත්නම් තමයි. ඒ නිසා අලුතින් ගෙවල් හදනව නම් අර විදියට ඉඩ ඇරල ඉදිකිරීම තමයි වඩාත් සුදුසු. ඒ විදියට ඉඩම හතර පැත්තෙන්ම කොටු කරල තිබුණොත් ඒ හතර පැත්තටම මේ වගේ උපක්‍රමයක් යොදන්න වෙනවා. ඒ කියන්නෙ දෙපැත්තටම මල් වැල් දෙක බැගින් හිටවල උඩින් සම්බන්ධ කරන්න ඕන. එක පැත්තක් විතර නම් වැහිල තියෙන්නෙ, ඒ පැත්තෙ දෝසය ඒ විදියට අරින්න ඕන.

දැන් කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන් අමනුස්සයින්ට තියෙන්නෙ සියුම් කයක් නම්, මොකටද ඔය විදියට ඉඩ වෙන් කරන්නෙ ඒ සියුම් කයින් ඕන තැනකින් රිංගල යන්න පුළුවන්නෙ කියල. සියුම් කයක් තිබ්බච්ච පලියට හැමෝටම එහෙම පහසුවෙන් යන්න පුළුවන් කමක් නෑ. ඒ අයගෙ කිරණ කයටත් කිරණ පහර වදිනවා. මොකද මේ අමනුස්සයින්ගෙ ලෝකය කියන්නෙ අපි හිතන් ඉන්න ලෝකය නෙවෙයි. උදාහරණ විදියට අපි දොරක් වැහුවොත්, ඒ දොර වහන්න මනසින් හිතන කොටම එතනත් කිරණ පහරකින් වැහෙනවා. ඒ කිරණ පහරත් දුර්වල අමනුස්සයින්ට බාධකයක්. වැටක් / තාප්පයක් බැන්දත් ඒ වැට / තාප්පය කිරණ පහරකින් බැඳෙනවා. ඒකත් අමනුස්සයින්ට බාධකයක්.

ඒ වගේම මේ මල් වැල් වෙනුවට නිකං කෝටු කෑලි 2 ක් හිටවල නූලක් අදින්න බැරිද කියලත් හිතෙන්න පුළුවන්. මේ අමනුස්ස  කොටස් බොහෝ කොටම ගස් කොළංවල තියෙන කිරණ ආධාර කර ගෙන තමයි ඒ අයගෙ මාධ්‍ය හදා ගන්නෙ. ගස් කොළංවල ඒ අයගෙ විමන් තියෙනව කියන්නෙත් ඒකයි. ඒවායින් විහිදෙන කිරණ තමයි ඒ අයගෙ මාධ්‍ය වෙන්නෙ. මේ සම්බන්ධයෙන් අභයරතනාලංකාර හිමියන් දකපු අත්දැකීමක් තමයි මේ.


''මම එක්තරා තැනක නැවතිලා ඉන්න කොට ඒ ළඟ පාත කොස් ගහක් තිබුණා. ඒකෙ විමාන ගොඩක් තිබුණා. ඒ විමන්වල ගන්ධබ්බයොත් ගොඩක් හිටියා. මේ කොස් ගහින් කිරණ යනවා. දවසක් මම ඒ කොස් ගහ දිහා බලාගෙන ඉන්න කොට පැල් රකින්න හදපු පැල් කොටයක් වගේ විමානයක් පේනවා. නමුත් ඒ පුංචි විමානය ඇතුලෙත් හත් අට දෙනෙක් විතර ඉන්නවා. ඒ කිරණ මාධ්‍යයෙන් ඒ විමන්වලට යන්න පාරවල් තියෙනවා. ඒ පාරවල් දිගේ තමයි ඒ විමන් හෙවත් ඒ අයගෙ ගෙවල්වලට ඒ අමනුස්ස ආදී කොටස් යන්නෙ. ඉතින් මම ඒ දිහා බලාගෙන ඉන්න කොට ඒ ගන්ධබ්බ පිරිස් බන්දේසියක තියල හොඳට ලස්සනට බැදපු කොස් ඇට, පොලුත් එක්ක අර කිරණ මාධ්‍යය දිගේ ඒ ගෙදරට (විමානයට) ගෙනියනවා. ඒ අය කන්නෙ බොන්නෙ ඒවා. කොහෙන් ලැබුනද දන්නෙ නෑ. නියම විදියට පුච්චගෙනත් තිබුණා.''

ඉතින් මෙන්න මේ වගේ මල් වැලකිනුත් කිරණ මාධයක් හැදෙනවා. ඒ කිරණ මාධ්‍යය දිගේ අමනුස්සයින්ට යන්න එන්න පුළුවන්. හරියට පාරක් හදල දුන්න වගේ. ඒ නිසා තමයි එහෙම දෝස තියෙන ගෙවල්වල මල් වැල් හිටවන්නෙ. එතකොට ඒ දෝසය මග හැරෙනවා. ඒ නිසා නිකං කෝටු කැලි හිටවල නූල් ඇදල වැඩක් නෑ.

දැන් එතකොට මේ කියන කාරණය නිසා තමයි මීට කලින් සඳහන් කළේ, සම්පූර්ණ භූමිය අල්ලල වටේට ආරක්ෂාවල් දාන්න එපා කියල. එතකොට පෙරේතයින්ගෙ පාදයට උන්ට යන්න එන්න අවස්ථාව නැතිව යනවා. මායිම්වලින් උන් යන එන කොට ඒ ගමන් මග අවහිර නොවී තියෙන්න ඕන. ඒක ඒ අයගෙ උරුමය. අපි ඒ උරුමය නැති කරන්නෙ නෑ. උදාහරණ විදියට යම් කිසි රටක මිනිස්සු ඉන්නවා. ඒ රට ඒ අයට උරුම රට. හැබැයි ඒ අය බලහත්කාරයෙන් තවත් රටක් ආක්‍රමණය කරන කොට එතනදි වැරදිකාරයො වෙන්නෙ ඒ ආක්‍රමණය කරපු අය. ඒ රටේ උරුම කාරයො මරල හරි පන්නල හරි ඒ රට අල්ල ගත්තොත් ඒක ඒ අයගෙ උරුමයට කරන අසාධාරණයක්. ඒ නිසා ඒ උරුම පිරිස ඒ රටේ ඉන්න ඕන. ඒ වගේ මේ ලෝකෙ ඒ ඒ පිරිස්වලට උරුම තැන් තියෙනවා. හැබැයි ඒ උරුම තැන්වලට අසාධාරණ විදියට ඇවිත් තමන්ගෙ නැති බැරිකම් වුනත් අසාධාරණ විදියට ප්‍රයෝජනයට ගන්න හොඳ නෑ. අනිත් අයට තියෙනව කියල නැති බැරි අය ඒ අයගෙන් හොරකම් කරල හරි යන්නෙ නෑ. ඒ වගේ වැරදි ආකල්පයකින් ඒ අය ආස්වාද ගන්න, යමක් ලබා ගන්න අයුතුකම් කළොත් ඒක වැළැක්වීම අසාධාරණයක් නෙවෙයි.

ඉතින් ඒ වගේ මේ අවස්ථාවෙදිත් ධර්මතාවයක් සිද්ධ වෙනවා. සාධාරණය ළඟ අසාධාරණකම් කරන අයට ඉන්න බෑ, දැවිල පිච්චිලා යනවා. ඒ අවස්ථාවෙදි සාධාරණ කෙනා වැරදිකාරයෙක් නෙවෙයි.

දැන් මේ කාරණය පෙන්වන තැනක් තමයි ආටානාටිය සූත්‍රය. එතනදි බුදුන් වහන්සේ ඉදිරියේදීම සතර වරම් දෙවියො මෙහෙම කියා සිටිනවා. මේ අමනුස්සයින්ට ඉන්න මේ මේ ස්ථාන ආදී වශයෙන් තැන් තියෙනවා. නමුත් ඒ අය අසාධාරණ විදියට ඇවිත් මෙහේ ඉන්න මනුස්සයින්ට කරදර කරනවා. අපි ඒ අයව අරගෙන ගිහින් ඒ අයගෙ ස්ථානවලට




යවනවා, ඒ අය ඒ වැරැද්ද තව දුරටත් කළොත් දඬුවම් දීල හරි අනෙක් පිරිසට ආරක්ෂාව සලසනවා. එතකොට ඒ කාරණය බුදුන් වහන්සේ අනුමත කරල තියෙනවා. මොකද අසාධාරණය කරල තියෙන්නෙ ඒ අමනුස්සයො. ඒ අයට ඉන්න හිටින්න ස්ථානයක් තියෙද්දිත් ඒ ස්ථානයේ ඉඳගෙන ඒ අයගෙ වැඩ කරගන්නෙ නැතිව මනුස්සයින්ට කරදර කරන්න එනවා.

කරුණු මෙහෙම තියෙද්දි සමහරු තර්ක කරනවා, බුදුන් වහන්සේ යක්ෂාදීන් පැන්නුව කියන එක වෙන්න පුළුවන්ද, මහා කරුණාව තියෙන කෙනෙක් එහෙම කරයිද කියල. නමුත් ඒ භෞතිකවාදී තර්ක හරි යන්නෙ නෑ. මොකද එතනදි පැහැදිලිම දෙයක් තමයි, ඒ අයට ඉන්න ස්ථානයක් තියෙද්දිත් එහේ ඉඳන් මෙහාට අසාධාරණකම් කරන්න ඇවිල්ල ඉන්නවා කියන කාරණය. ඒ අසාධාරණය ගැලපෙන්නෙ නෑ. ඒ නිසා තමයි බුදුන් වහන්සේ අධිෂ්ඨාන කළාම ඒ අයට ඒ අසාධාරණය කරන්න බැරිව යන්නෙ. ඒ වගේ අවස්ථාවකදි ඒ අසාධාරණකම් කරන අය ගිනි ගන්න පුළුවන්. උදාහරණ විදියට බුදුන් වහන්සේ ප්‍රශ්නයක් අහන කොට කෙනෙක් ඒකට උත්තර නොදී හිතා මතාම මග හරිනව නම් උන් වහන්සේ ඒ ප්‍රශ්නය තුන් වතාවක් අහනවා. තුන් වතාවක් අහන කොටත් හිතා මතාම උත්තර නොදී මග හරිනව නම් ඒ අයගෙ හිස හත් කඩකට පැළෙනවා. ඒකට උන් වහන්සේට කරන්න දෙයක් නෑ. ඒ කියන්නෙ අසාධාරණයක් විදියට ආවොත් එහෙම වෙනවා. ඒක ධර්මතාවයක්.

ඒකට හේතුවක් තියෙනවා. බුදුන් වහන්සේ නමක් අප්‍රමාණ පාරමිතා ගුණයකින් ලෝකයට පහළ වෙලා ඉන්නෙ, ලෝකයාට අප්‍රමාණ යහපතක් කරන්න. එතකොට කවුරු හරි කෙනෙක් උන් වහන්සේගෙ එක තත්පරයක හරි කාලයක් අපතෙ යවල හිතා මතාම උන් වහන්සේ වෙහෙසට පත් කරනව නම් ඒක ඒ පුද්ගලයට දරන්න බැරිව යනවා. අප්‍රමාණ මහා දයානුකම්පාවකින් ලෝකයට යහපතක් කරන්න පහළ වෙච්ච උන් වහන්සේගෙ එක මොහොතක් හරි යමෙක් දැන දැනම අපතෙ යැව්ව නම් ඒක මහ අපරාධයක්. ඒ නිසා ධර්මතාවයෙන්ම මහ හෙණ පාරක් වැදිච්ච වගේ ඒ පුද්ගලයට මහ විසක් වදිනවා. ඒ නිසා තමයි හිස හත් කඩකට පැලෙන්න හේතු වෙන කාරණයක් යෙදෙන්නෙ. මොකද බුදුවරු දැන දැනම වෙහෙස වන්න හොඳ නෑ.

දැන් මේ වගේ සිද්ධියක් බුදුන් වහන්සේත් එක්ක වාද කරන්න ආපු සච්චකටත් සිද්ධ වෙන්න ගියා. සච්චක රූපය නිච්චයි, ආත්මයි, වේදනාව නිච්චයි, ආත්මයි.... ආදී වශයෙන් විග්‍රහ කළා. ඉතින් බුදුන් වහන්සේ අනාත්මයට හේතු සාධක පෙන්වල දැන් අත්තද අනත්තද කියල අහන කොට, පැරදෙයි කියල බයෙන් කපටිකමට සච්චක උත්තර නොදී හිටියා. එතකොට උන් වහන්සේ කියනවා, තුන් වතාවක් තථාගතයන් වහන්සේ වෙහෙසට පත් කරන්න එපා, අහන ප්‍රශ්නයට උත්තර දෙන්න නැත්නම් නුඹේ හිස හත් කඩකට ධර්මතාවයෙන්ම පැලෙනව කියල. මේ අවස්ථාවෙදි සක්‍ර දෙවියො වජ්‍රපානි කියන යක්ෂ වේසයක් මවා ගෙන යගදාවක් අතින් උස්ස ගෙන ඇවිත්, උඹ උත්තර දුන්නෙ නැත්නම් උඹේ හිස හත් කඩකට පළනව කියල සච්චක බය කළා. ඒ කාරණය බුදුන් වහන්සේ සහ සච්චක විතරයි දැක්කෙ. ඒකත් එක්තරා ධර්මතාවයකින්ම මෙහෙය

වෙච්ච දෙයක්. එතකොට සච්චක ඒකට බය වෙලා තමයි අන්තිමට උත්තර දුන්නෙ. සක්‍ර දෙවියො ඒ වගේ දෙයක් කළේ නැතත්, එහෙම උත්තර දුන්නෙ නැත්නම් ධර්මතාවයෙන්ම හිස හත් කඩකට පැලෙනවා. ඒ තරම් භයානකයි. (මේ කාරණය ඒ විදියටම නැතත් සාසන ගුණයට විරුද්ධ වුනාමත්, මේ වගේ හිස හත් කඩකට පැලෙන්න පුළුවන් සිද්ධියක් වහරක අභයරතනා-ලංකාර හිමියන්ට අත්දකින්න ලැබිල තියෙනවා. ඒ සිද්ධිය ඉදිරියේදී අභයරත-නාලංකාරය තුළින් බලාපොරොත්තු වන්න.)

ඒ වගේම කෙනෙකුට තවත් ප්‍රශ්නයක් එන්න පුළුවන්, ඇයි මේකට මුදු වැලිම ගන්නෙ කියල. විශේෂයෙන් ගංගා ඇල දොළවල වගේ නෙවෙයි, මුදු වැලිවලට හිමිකාරත්වයක් නෑ. මොකද හැම තිස්සෙම වගේ ගසා ගෙන යන වැල්ල තියෙන්නෙ. ඒ කියන්නෙ නොපැහිච්ච වැල්ල. අද නොපැගුන වැල්ල කියල හඳාගෙන තියෙන්නෙත් මේ නොපැහිච්ච වැල්ල කියන වචනය. පැගිච්ච නැති කතාවක් නෙවෙයි මේ කියන්නෙ. පැහුනේ නෑ කියන එකයි නොපැහුන කිව්වෙ. ඒ කියන්නෙ වැලි, ගොඩට ඇවිත් වැල්ලෙ රැඳුනට පස්සෙ ඒක පැහුනා වෙනවා. ගසාගෙන යන වැල්ල ගන්නෙ ඒ නිසා. මොකද සාමාන්‍යයෙන් පොළවට පැහිලා තියෙන වැල්ලට හිමිකාරයො ඉන්නවා, බදා ගත්තු අය ඉන්නවා. ඒ ස්ථානයට අධිපති යම් කිසි අමනුස්ස කොටස් හරි, භහිරව කොටස් හරි යම් දේවතාදී කොටස් හරි හිටියොත් ඒ අයට ඒක හිමියි. පැහිච්ච දේ කෙනෙකුට අයිතියි. මුදෙ මඩක් හෝ තැන්පත් වෙලා තියේ නම් ඒකට අසුරයො වගේ අරක් ගත්තු හිමිකාර කොටස් ඉන්න පුළුවන්. නමුත් චලනය වෙන දේකට හිමිකාරයෙක් නෑ, අධිගෘහිතකම් කරන්න බෑ. නොපැහුනා කිව්වෙ ඒකයි. ගලන ගඟකට, ඇලකට, දොලකට බලි තොවිල් ආදියේදී අමනුස්ස දෝස අයින් කරන්න ගත්තු යම් යම් ද්‍රව්‍ය දාන්න කියන්නෙත් ඒකයි. මොකද යම් කිසි ආකාරයකට බැඳිල තිබිච්ච දෝස ඒවට ඇදල ගන්න නිසා ඒව වතුරෙ පා කළේ නැත්නම්, අමනුස්සයො ඒවායේ එල්ලිලා මාධ්‍යයක් කරගෙන ඒ පුද්ගලය අල්ලන්න පුළුවන්. නමුත් ගලාගෙන යන වතුරකට දැම්මට පස්සෙ ඒකෙ එල්ලිලා ඉන්න බැරිව යනවා. ඒවට අයිතිකාරයො නෑ. නිශ්චල දේට තමයි අයිතිකාරයො ඉන්නෙ. උදාහරණ විදියට පොකුණක ජල රකුසො වගේ කොටස් ඉන්නවා. හැබැයි මුහුදක, ගඟක වගේ ගලන ජලයක ජල රකුසො නෑ. මුද ගත්තත් නිශ්චල මුහුදෙ අසුර කොටස් ඉන්නවා. නමුත් චලන මුහුදක නෑ. මොකද චලනය වෙන කොට මගේ කියල හිමිකමක් කියන්න බෑ.

ඒ වගේ ගලාගෙන යන වැල්ල තවම පැහිලා නෑ. හැබැයි ගඟක හරි ඒ විදියට වැල්ල ඇවිත් සිලි සිලි ගාල තැන්පත් වෙනව පේනව නම්, අන්න ඒ වැල්ල පැහිලා නෑ. ඒක ගන්න පුළුවන්. ඒක හේදිලා ගියපු අලුත් වැල්ලක්. කවුරු හරි ගොඩ දාගන්න ඉස්සෙල්ල ඒක ගන්න පුළුවන්. නමුත් ගඟට වඩා මුහුදෙ මේ ක්‍රියාවලිය නිරන්තරයෙන්ම සිද්ධ වෙන නිසා, නොපැහුන වැලි ගන්න බොහොම ලේසියි. රැල්ලක් එක්ක ගොඩ ගහන කොට, පැහිලා හිමි කරගන්න පෙර, කාටවත් හිමි නැති වෙලාවක් එනවා. නමුත් ගොඩ ගහපු වැල්ලට භූමි අධිගෘහිත, ජල අධිගෘහිත දේවතා අමනුස්ස ආදී කොටස් ඉන්න පුළුවන්. ඒ නිසා වැල්ල ගහගෙන ආපු ගමන් ඒකෙන් වැලි ගන්න පුළුවන් නම් වඩා හොඳයි. ඒක නිතර නිතර අලුත් වෙන වැල්ලක්. ඉතින් මුහුදෙ නිරන්තරයෙන් රැළි ඇති වෙන නිසා මුදු රැල්ල වැල්ලත් එක්ක ඇවිත් බැහැල යන අතරෙදී ඒ ගොඩ ගහපු වැලි ටික හාරල හරි ගන්න පුළුවන්. නිකං වෙරළින් හාරල ගන්නවට වඩා රැල්ල යන එන කල් බලාගෙන ඉඳල ගැනීම විශේෂයි, වඩා හොඳයි. ගඟේ හෝ මුහුදෙ හෝ වැලි ගන්න කොට ඒක තමයි වඩා සුදුසුම ක්‍රමය. මොකද හේතුව එතකොට කාටවත් බැල්ම දාන්න බෑ, අයිතිකාරයෙක් නෑ. කිසිම කෙනෙකුට අණසක පිහිටවන්න බෑ. ඒ නිසා මේ කියන්නෙ සාමාන්‍ය විදියට මුදු වැලි හෝ ගඟේ වැලි ගන්න එපා කියන එක නෙවෙයි, මේ කියපු සුද්ධ ක්‍රමයටම ගන්න පුළුවන් නම් ඒක වඩාත් සුදුසුයි, හොඳයි.

ඒ වගේම මේ ජීවම් කරන පොල් තෙල් ආදියට දෙහි, සුදු හඳුන් කුඩු, කහ දමන්නත් හේතුවක් තියෙනවා. සුදු හඳුන්වල තියෙන්නෙ විශේෂිත සුවඳක්. එක අතකින් අපද්‍රව්‍ය නැසීමේ ගුණයත්, අනිත් පැත්තෙන් අමනුස්ස ආදීන් පළවා හරින සුවඳත් නිසා විශේෂයි. සුද්ධ භාවය, පිරිසිදු බව හඳුනන ගති ලක්ෂණය නිසා එහෙම ස්වභාවයක් තියෙනවා. ඉතින් නරක අමනුස්සයො, ගුණ ධර්ම හඳුනන්නෙ නැති විරුද්ධ පැත්තෙ ඉන්න නිසා ඒ අයට සුදු හඳුන් විසයි. දුර්ගන්ධය ආඝ්‍රාණය කර ගෙන ඉන්න අමනුස්සයින්ට සුදු හඳුන් සුවඳ විසයි. ඒ වගේ දෙහි සහ කහවලත් විසබීජ නසන ගුණය හොඳින් තියෙනවා.

ඊළඟට කෙනෙකුට තවත් ගැටළුවක් එන්න පුළුවන්, බුදු මැදුර ගේ ඇතුලෙ නැතිව ගෙයින් පිටත තිබුනොත්, ජීවම් තෙල්වලින් බුදු පහන පත්තු කරන්නෙ කොතැනද කියල. මොකද සමහර ගෙවල්වල බුදු පිළිම වහන්සේ ගෙයින් පිට වෙනම සුද්ධ ස්ථානයක තැන්පත් කරල තියෙනවා. ඒ වගේ අවස්ථාවකදි වුනත් මේ ජීවම් තෙල් යොදල පත්තු කරන බුදු පහන ගේ ඇතුලෙ බ්‍රහ්ම පාදය වගේ ඊට ගැලපෙන සුදුසු ස්ථානයක තියල පත්තු කරන්න පුළුවන් නම් වඩා හොඳයි. පිටතින් තියෙන බුදු මැදුර ඇතුලෙ පත්තු කළයි කියල ගැටළුවක් නෑ. නමුත් ගේ ඇතුලෙ තියෙන දෝස කැපෙන්නත් එක්ක, ගේ ඇතුලෙම සුදුසු ඉහළ තැනක පත්තු කරන්න පුළුවන් නම් වඩා හොඳයි.

ඒ වගේම කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන්, මේ බුද්ධාරක්ෂාවෙන් පස්සෙ නිවස ඇතුළු භූමියට සිවු කොන් හෝ අට කොන් ආරක්ෂාවක් වෙනම කරන්න ඕනද කියල. නමුත් එහෙම වෙනම ආරක්ෂාවක් කර ගන්න අවශ්‍ය නෑ වගේම, එහෙම දෙයක් කිරීම ගැළපෙන්නෙත් නෑ. බුද්ධාරක්ෂාව හරියට කරගත්තම අමනුස්ස ආදීන්ට එහෙම සීමා බඳින්න අවශ්‍ය නෑ. ධර්මතාවයෙන්ම සීමා ලකුණු වෙනවා. ඒ ක්‍රමයට ඒ අමනුස්ස ආදීන්ට බාධාවකින් තොරව නිදහසේ යන්න එන්න පුළුවන්. එතකොට මිනිස්සුන්ට කරදර හිරිහැර කරන්නත් ඒ අයට හැකියාව නැතිව යනවා. මොකද මේ වගේ බුද්ධාරක්ෂාවකින් පස්සෙ වුනත් සියලුම අමනුස්ස ආදී කොටස් ඒ භූමියෙන් ඉවත් නොවෙන්න පුළුවන්. ඒ කියන්නෙ සුදුසු අය ඉන්නවා, නුසුදුසු අය යනවා. සුදුසු අය කිව්වම යහපත් ගන්ධබ්බ දේවතාවො, ඒ වගේම හිමිකම් තියෙන යහපත් මනුස්ස ගන්ධබ්බයො ආදිය ඉන්න පුළුවන්. ඒ වගේ අයගෙන් උදව්වක් මිසක් කරදරයක් වෙන්නෙ නෑ. යම් කිසි විදියකින් මේ වගේ බුද්ධාරක්ෂාවක් කරල තියෙද්දිත් අමනුස්සයින් ඒකට විරෝධයක් දක්වුවොත්, නොගැලපෙන විදියට හැසිරුනොත් ඒ අයට ඒ ස්ථානයේ ඉන්න බැරිව යනවා. ඒ නිසා සුදුසු ගැලපෙන අයට විතරයි ඒ ස්ථානයේ ඉන්න පුළුවන් වෙන්නෙ.

ඒ වගේම මේ දස දිසා බන්ධන පිරිතෙන් කියවෙන අර්ථයත් සංක්ෂිප්තව දැනගෙන ඉදීම අවබෝධයට වැදගත්. එතකොට අවශ්‍ය නම් කර්මස්ථානයක් විදියටත් අර්ථ දැනගෙන වඩන්නත් පුළුවන්. එතකොටත් ආරක්ෂාවක් ලැබෙනවා. මොකද වීතරාගී, වීතදෝසී, වීතමෝහී උතුමන්ගෙ ගුණ සිහි කිරීමත් බුද්ධානුස්සතියට තමයි වැටෙන්නෙ. ☞

හැබැයි කර්මස්ථානයක් විදියට වඩන කොට හෝ නිකං පිරිතක් විදියට සජ්ජායනා කරන කොට අර වගේ 7, 14, 21.... ආදී වශයෙන් සීමා කරගෙන කියන්න අවශ්‍ය නෑ. තමන්ට කැමති වාරයක් කියන්න පුළුවන්. ජීවම් කරන කොට විතරයි ඒ විදියට අනුක්‍රමයෙන් බල වැඩි කර ගෙන යන්නෙ. පොදුවේ ගත්තම මේ පිරිතෙන් කියවෙන්නෙ මේ වගේ අදහසක්.

**දස දිසා ඇතුළු සියලු දිසාවන්හි බුදුවරයන් වහන්සේලාගේ ආනුභාව පිහිටුවනවා. වෛර හා අන්තරාවෝ ශේෂයක් නැතිව විනාස වෙනවා. ආදියේ පටන් එන්නා වූ ඒ මහා උත්තම ගුණය, ඒ උතුම් ගුණ ආරක්ෂාව ප්‍රකාශ කරනවා. පෙර දිසාවේ පදුමුත්තර බුද්ධාරක්ෂාවත්, ගිනිකොණ දිසාවේ රේවත බුද්ධාරක්ෂාවත්, දකුණු දිසාවේ කස්සප බුද්ධාරක්ෂාවත්, නිරිත දිසාවේ සුමංගල බුද්ධාරක්ෂාවත්, පසු දිසාවේ සිඛී බුද්ධාරක්ෂාවත්, වයඹ දිසාවේ මේධංකර බුද්ධාරක්ෂාවත්, උතුරු දිසාවේ පියදස්සී බුද්ධාරක්ෂාවත්, ඊසාන දිසාවේ දීපංකර බුද්ධාරක්ෂාවත්, පොළව දිසාවේ හෙවත් යට දිසාවේ කකුසඳ බුද්ධාරක්ෂාවත්, උඩ දිසාවේ සරණංකර බුද්ධාරක්ෂාවත් ලෙස ඒ ආකාරයෙන් දස දිසාවේම සියලු බුදුවරයන් වහන්සේලා පිහිටුවනවා. ඒ ඇසුරේ තිබෙන්නා වූ සියලු සෝක, රෝග, භය ආදිය අප කෙරෙහි සියලු ආකාරයෙන් වැනසේවා. සියලු ඉරියව් පථයන්හිම යක්ෂ භය, දේව භය, රජ හා සොරුන්ගේ ගැහැට, සියලු අමනුස්සයින්ගෙන්, තිරිසන් ගත සත්වයින්ගෙන් උපන්නා වූ සියලු භය විනාස වේවා. සියලු උපද්‍රව ශේෂයක් නැතිව විනාස වේවා. අපගේ සිරසට ශ්‍රේෂ්ඨ වූ බුද්ධ ශාන්තියයි, දකුණට සාරිපුත්ත මහ රහතන් වහන්සේද, වාමාංසයට මුගලන් මහරහතන් වහන්සේද, ඉදිරිපසට ත්‍රිපිටකයද, පසු පසට ආනන්ද මහ රහතන් වහන්සේද, සතර දිසාවන්හි රහතන් වහන්සේලාද, හැම තැනම වට පිටාවේ ලෝක පාලනය කරන්නා වූ ඉන්ද්‍ර දෙවියන්, බ්‍රහ්මයින් ආදී ඒ හැම දෙනාගේම ආනුභාවයෙන් සියලු උපද්‍රව, සියලු අන්තරායන් ශේෂයක් නැතිව විනාස වේවා. මේ පිරිතේ ආනුභාවයෙන් සියලු ආකාරයේ රෝග, භය, වින, අන්තරාවෝ, වින හිර බන්ධන විනාස වේවා.**

ඒ වගේම කෙනෙකුට හිතෙන්න පුළුවන්, හෙළ බොදු පියුම 18 වන කලාපයේ සඳහන් කළ විදියට මේ පිරිතෙන් ගෙවල් දොරවල් ආරක්ෂා කරන කොට ජීවම් පිරිත දිට්ඨි, ප්‍රාණ, පලිප්පු, පූය, සිද්ධි ආදී වශයෙන් බල පිහිටවන්න අවශ්‍ය නැද්ද කියල. මේ අවස්ථාවෙදි ඒ වගේ සංකීර්ණ ක්‍රමයක් අවශ්‍ය නෑ. බොහෝ විට යන්ත්‍රයක් හදන කොට ඒක කල් පවතින විදියට පවත්ව ගන්න තමයි ඒ ශක්ති පිහිටවන්න ඒ වගේ ක්‍රමයක් අනුගමනය කරන්නෙ. නමුත් මේ ක්‍රමයෙදි එහෙම එකක් අවශ්‍ය නෑ. මේ ක්‍රමය ඒ වගේ සංකීර්ණ නැති නිසා ඕනෑම කෙනෙකුට තනියෙන් කර ගන්නත් පුළුවන්. මෙතනදිත් තෙල්, වැලි, සුවඳ දුම් කුඩු ආදියට ශක්තිය කවල විසුරුවා හැරීමක් තමයි කරන්නෙ. එතකොට අර ක්‍රමයෙදි වගේ මහන්සි වෙන්න අවශ්‍ය නෑ. අනෙක මේ ක්‍රමයට ගෙදර කෙනෙකුටත් තනියෙන් කරගන්න පුළුවන් නිසා, ගෙදර අයටත් මේ ආරක්ෂාව සිද්ධි වෙනවා. ඒ කියන්නෙ සෘද්ධිමත් වෙනවා, යහපත් පැත්තට සිද්ධ වෙනවා, යමක් හොඳින් සිද්ධ වෙනවා කියන එක. ඒකත් විශේෂයක්. නමුත් අර කලින් ක්‍රමය ටිකක් සංකීර්ණ නිසා, ඒ වගේම වැඩි කාල වේලාවක් ගත වෙන නිසා සමහර කෙනෙකුට තනියෙන් කරගන්න බැරි වෙන්න පුළුවන්. එතකොට පිට කෙනෙක්ගෙ උදව් උපකාර ගන්න වෙනවා. පිට අයට කියල කර ගන්න කොට ගෙදර ඉන්න අයට සිද්ධි වෙන්නෙ නෑ. ඒ අය නිකං බලන් ඉන්නව මිසක් තමන්ගෙ වැඩේට උනන්දුවක් නැතිව යනවා. කවදාවත් ඒ අය දැනුවත් වෙන්නෙ නෑ.

ඒ වගේම පිට අය ලවා කර ගත්තම, සමහර විට ඒ සම්බන්ධයෙන් පිරිස් බිහි වෙලා ඒකාධිකාරයක් හැදිල අන්තිමට ඒක ව්‍යාපාරයක් කර ගන්න අයත් බිහිවෙන්න පුළුවන්. සියල්ලම නොවුනත් එහෙම අයත් මේ අතර ඉන්න පුළුවන්. එතකොට තමන්ට වැඩක් කරගන්න ඒ අයගෙ පස්සෙන් යන්න වෙනවා. ඊළඟට දෙහි පුහුල් ආදිය කපන්න ඕනයි කියල ඒ අයගෙ ව්‍යාපාර කරගන්න, නැති දෝසත් කියල මිනිස්සු රවට්ටල මුදල් ගරාගන්න ක්‍රමවලට යොමු වෙන්න පුළුවන්. ඒ වගේ උපක්‍රමශීලී කපටි පුද්ගලයින්ගෙන් බේරෙන්නයි මේ කාරණාව කිව්වෙ. නමුත් මේ වගේ තමන්ම බල පිහිටුවා ගත්තම තමන්ට විශේෂ වියදමක් යන්නෙත් නෑ, තමන්ටත් ඒ ශක්තිය පිහිටනවා. ඒක විශේෂයි. ඒ වගේම මේ ක්‍රමය හරි සරලයි. පුරුදු වුනාම හැමෝටම වගේ කර ගන්න පුළුවන්. කිසි අමාරුවක් නෑ. හැමදාම කර කර ඉන්න අවශ්‍යත් නෑ. මුල් ජීවම් වාර 5 න් පස්සෙ මාස ගාණකට සැරයක් ජීවම කරගත්තම ඇති. එහෙම කර ගෙන ගියාම ස්වභාවයෙන්ම ඒ ඒ ස්ථානවල දොස් ඇරෙනවා, ඒ වගේම තමන්ටත් ස්වභාවයෙන්ම ආරක්ෂක වළල්ලක් පිහිටනවා.

ඊළඟට මේ ආරක්ෂාව පොදුවේ ගෙවල් දොරවල්වලට කරගන්න විදිය තමයි පසු ගිය කලාපයෙන් සටහන් කළේ. නමුත් සමහර විට තමන්ම මුල් කරල ජීවම කර ගන්න අවශ්‍ය වුනොත්, විශේෂයෙන්ම තමන් පාවිච්චි කරන බේත් හේත්වලට මේ ආරක්ෂාව කර ගන්න ඕන නම් සහ ඒ බෙහෙත් පාවිච්චි කරන තමන්ම ඒ ජීවම කර ගන්නව නම් මේ පිරිතේ එන ''අච්චන්තරායා සබ්බේ තේ, සිරස්මිං තේ, තේ පුරතෝ'' යන ස්ථානවල ''තේ'' කියන වචනයට ''මේ'' කියලත්, ''තුය්හං'' කියන වචනයට ''මය්හං'' කියලත්, ''පච්ඡිමේ තව ආනන්දෝ'' කියන තැනට ''පච්ඡිමේ මම ආනන්දෝ'' කියලත් යොදන්න ඕන. ''තේ'' කියල යෙදුවම පොදුවේ ගෙවල් භූමි ඇතුලු සියලු දෙනාම ඒ ආරක්ෂාවට ඇතුලත් වෙනවා. තමන්ට විශේෂයෙන් කරගන්න ඕන නම් තමයි අර විදියට ''මේ, මය්හං'' කියල යොදන්නෙ. මොකද බේත් තමන්ට ගන්න කොට ඒ අවස්ථාවෙදි තමන්ටම කියල වෙනම ජීවම් කර ගැනීම හේතු කිහිපයක් නිසා වැදගත් වෙනවා.

එකක් තමයි ඒ පුද්ගලයට එල්ල කරලම ජීවම සිද්ධි වෙන නිසා ඒ බේතට විශේෂ බලයක් ගැබ් වෙනවා. විශේෂයෙන් අසනීපයකදි ඒ කාරණය හරි වටිනවා. නමුත් අනුන් ලවා ඒ බේත් ජීවම් කර ගෙන නිකං හිටියොත් කවදාවත් තමන්ට සිද්ධි වෙලා විශේෂ ආරක්ෂාවක් පිහිටන්නෙ නෑ. පිට අය ඒකෙන් මුදල් හම්බ කර ගන්න පුළුවන්. එතකොට අර කලින් කිව්ව වගේම ඒකට පිරිසක් හැදිල ව්‍යාපාර බිහි වෙන්න පුළුවන්. ඒ නිසා තමන්ගෙ බේතට හේතට තමන්ම ජීවම කළාම තමන්ගෙ වැඩෙත් හරියට කෙරෙනවා, ඒ සඳහා උනන්දුවකුත් ඇති වෙනවා, තමන්ට සිද්ධි වෙලා විශේෂ ආරක්ෂාවකුත් පිහිටනවා. දියර බේත් වගේ නම් ඒ වගේ අවස්ථාවකදි ඉරටු කැල්ලක් අරගෙන ඒ බේතට දාල කලවම් කර කර 108 වාරයක් හෝ 7, 14 ... ආදී වශයෙන් තමන් කැමති වාරයක් මේ ජීවම් පිරිතෙන් තමන්ටම ජීවම් කර ගන්න පුළුවන්. පුංචි ළමයෙක්ගෙ බේතකට ජීවම කරනව නම්, අම්ම තාත්ත හෝ ගෙදර වෙනත් සහෝදර සහෝදරයෙක් හෝ පවුලෙ කෙනෙක්ම කරන්න ඕන. එතකොට යොදා ගන්නෙ ''තේ / තුය්හං / තව'' කියන වචන. මේ කාරණය බේත් වගේ දේකට තමයි වැදගත් වෙන්නෙ.

(තවත් අමතර පැහැදිලි කිරීම් ලබන කලාපයෙන්.)

**සටහන**
**නීතිඥ චන්දන සිරිවර්ධන**

**අභයරතනාලංකාරය - 38**

# මැරෙන බහුතරය සතර අපාගත වීම සම්බන්ධයෙන් ලැබූ තවත් ඇත්දැකීම් ....



(පසුගිය කලාපයෙන් - මැරෙන බහුතරය මරණින් පසු විඳින දුක්ඛිත තත්ත්වය ගැන සත්‍ය අත්දැකීම්....) **- වහරක අභයරතනාලංකාර හිමි**

මැරෙන බහුතරය මරණින් පසු සතර අපාගත වන බවත්, ඒ මරණාසන්න අවස්ථාවෙදි සහ ඉන් පසු විඳින්න සිද්ධ වෙන දුක්ඛිත තත්ත්වය ගැනත් අභයරතනාලංකාර හිමියන්ට අත්දකින්න ලැබිච්ච අත්දැකීම් මාලාවක් හේතු සහිතව පසුගිය කලාප කිහිපයකින්ම ඉදිරිපත් කළා. ඒ වගේම ඒ බොහොමයක් අවස්ථාවලදි භික්ෂූන් වහන්සේලාගේ සතර අපාගතවීම් ගැනත් කියවුණා. දූන් කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන් කොහොමද භික්ෂූන් වහන්සේලාට එහෙම වෙන්නෙ, ඒක වෙන්න පුළුවන්ද කියල. මොකද අද සමාජයේ බහුතරයක්, මේ මරණය කියන්නෙ මොන වගේ දෙයක්ද, මරණින් පසු උප්පත්තිය කොහොමද, ඒ උප්පත්තියට හේතු වෙන්නෙ මොනවද කියන කාරණා සම්බන්ධයෙන් දැනුවත් වීම බොහොම අඩුයි. කොටින්ම කිව්වොත්, කෙනෙක්ගෙ බාහිර ස්වරූපය විතරක් සලකල බලල පිටින් පේන්න තියෙන දේ අනුව නිගමන ලබා දෙනවා. එතකොට භික්ෂූන් වහන්සේ නමක් කියන්නෙ හොඳට බණ කියා ගෙන, දානෙකට පිරිතකට වැඩල, එහෙම නැත්නම් මොනව හරි සමාජ සේවයක් ඉටු කරල සමාජයේ යම්කිසි වැදගත් තත්ත්වයකින් ඉන්න කෙනෙක් කියල තමයි බොහෝ දෙනෙක් නිගමනය කරන්නෙ. නමුත් ඒ මතුපිට ක්‍රියාකාරකම් දිහා විතරක් බලල කෙනෙක්ගෙ ඊළඟ උප්පත්තිය තීරණය කරන්න බෑ කියන කාරණය බුද්ධ දේශනාවෙත් පැහැදිලිවම සඳහන් වෙනවා.

විශේෂයෙන් පෘතජ්ජන කෙනෙක්ගෙ උප්පත්තිය පිටින් පේන ආකාරය කොහොම වුනත් නිගමනය කරන්න බෑ කියල දහමෙ පෙන්වනවා. ඒ කියන්නෙ ඒ පුද්ගලයගෙ අභ්‍යන්තරය ක්‍රියාත්මක වෙන්නෙ කොහොමද කියල සාමාන්‍ය කෙනෙකුට දකින්න බෑ. ඒක ලොව්තුරා බුදු කෙනෙක්ම දකින්න ඕන දෙයක්. උන් වහන්සේ ප්‍රත්‍යක්ෂ වශයෙන්ම යථාර්ථයෙන් ඒ කාරණය දකිනවා. ඒ වගේම යම් අධ්‍යාත්මික ශක්තියක් මතු කරගත්තු අනෙක් අය අනුමාන වශයෙන්, බාහිර කරුණුවලින් ඒ කාරණය දකිනවා. වචනයයි, ක්‍රියාවයි දෙකින් බැලූ බැල්මට කෙනෙක්ගෙ අභ්‍යන්තරය මනින්න බෑ කියල ධර්මයේ එක තැනක සඳහන් වෙනවා. නමුත් ඒ දෙක නැතිව කෙනෙක්ගෙ අභ්‍යන්තරය දකින්න බෑ කියලත් තවත් තැනක සඳහන් වෙනවා. හැබැයි මේ දෙකේ පරස්පරයක් නෑ. අවස්ථානුකූලව තෝර ගන්න ඕන. මොකද වචනයයි, ක්‍රියාවයි දෙකින් බොහෝ අය රඟපානවා. අන්න ඒ රඟපාන මොහොතෙ අභ්‍යන්තරය දකින්න බෑ. නමුත් රඟපානව කියන එක හැමදාම කරන්නත් බෑ. බොහෝ තීක්ෂණ නැණ නුවණක් තියෙන කෙනෙක් කාලයක් ඕක දිහා විමර්ශනාත්මකව බලා ගෙන හිටිය නම් ඒ රඟපෑම අහු වෙනවා. එතකොට ස්වභාවිකත්වය දැක බලා ගන්න පුළුවන්. එතකොට වචනයයි, ක්‍රියාවයි දෙකින්, කලින් රඟපාපු එක නෙවෙයි මේකයි ඒ පුද්ගලයගෙ යථාර්ථය කියල අල්ල ගන්න පුළුවන්. එහෙම නැතිව හිතේ අභ්‍යන්තරය කෙලින්ම දැන ගන්න ආසය අනුශය ඥානය, ඉන්ද්‍රිය පරෝපරියත්ත ඥානය ... ආදී වශයෙන් කියන ෂඩ් අසාධාරණ ඥාන තියෙන්න ඕන. ඒක ලොව්තුරා බුදුන් වහන්සේට විතරයි තියෙන්නෙ. අනික් කෙනෙකුට නෑ. එතකොට ගිහි වේවා, පැවිදි වේවා, පිටින් පේන ස්වභාවයක් තියෙනවා. නමුත් අභ්‍යන්තරයෙන් තියෙන්නෙ යම් කිසි ආකාරයකින් යහපතක් හෝ අයහපතක් නම් ඒ අනුව තමයි මේ කාරණය සිද්ධ වෙන්නෙ කියල ධර්මානුකූලව කියන්න පුළුවන්. ඒ කාරණය පිටින් බලල නිගමනය කරන්න බෑ. මේ වගේ අවස්ථාවකදි ගුප්ත ලෝකය බලන්න පුළුවන් නම්, මේ කාරණය ප්‍රායෝගිකවත් අත් දකින්න පුළුවන් දෙයක්.

ඉතින් බුද්ධ චීවරය දරාගෙන බාහිරින් මොන විදියට හිටියත්, මේ මනසේ සිදුවන ක්‍රියාකාරීත්වය තමයි චුති පටිසන්ධියේදි බලපාන්නෙ. ඒක පිටින් බැලුවට පේන්නෙ නෑ. අති සියුම් දෙයක්. අනෙක මේ හැම භික්ෂූන් වහන්සේ නමක්ම මහණ වෙන කොට යම්කිසි බුද්ධ ප්‍රතිඥාවක් ඉටු කරන බවට පොරොන්දු දීල තමයි සාසනයට ඇතුල් වෙන්නෙ. ඒ ප්‍රතිඥාව බොහොම බරපතලයි. ඒ කියන්නෙ හරියට ඉටු කළොත් හරියනව වගේම, ඒ ප්‍රතිඥාව කඩ වෙන විදියට කටයුතු කළොත් ඒකෙ විපාකත් බරපතලයි.

එතකොට මේ ලිපි පෙළේ අරමුණ වෙන්නෙ සංසාරයේ තියෙන අතිශය බියකරු බව පෙන්වා දෙන්න කියල මීට කලිනුත් සඳහන් කළා. ඒ නිසා තේරුම් ගන්න ඕන එක කාරණයක් තමයි, මේ ප්‍රතිපත්ති පුරන්න සැදී පැහැදිලා සාසනයට ඇතුල් වෙන භික්ෂූන් වහන්සේලා අතරින් සමහර අයගෙ ඊළඟ උප්පත්තිය මේ වගේ දුගතිගාමී වෙන්න හේතු වෙනවා. සාමාන්‍ය ගිහි අය වුනත් ඒ අයගෙ අභ්‍යන්තරය පිටින් පේන්නෙ නෑ. එතකොට ධර්මතාවය කියන එක කාටත් එක හැන්දෙන් බෙදනව මිසක් පුද්ගලත්වය අනුව වෙනස් කරල සලකන ස්වභාවයක් ධර්මයේ නෑ. ධර්මය ක්‍රියාත්මක කරන පුද්ගලයෙක්, සර්ව බල අධිකාරියක් නෑ. තම තමන්ම කරගත්තු දේට අනුව තම තමන්ම ඵල විපාක භුක්තිය ලබනව මිසක් බේර ගන්න, ගොඩ දාන්න, විපාක අඩු කරන්න එහෙම විශේෂ සැලකීම් කරන්න කවුරුවත් නෑ. ඒ නිසා භික්ෂූන් වහන්සේ නමක් හෝ බාහිර සිල්වත් දුසිල්වත් වෙනසක් නැතිව අභ්‍යන්තරයෙන් සතර අපාගත වෙන්න හේතු තියේ නම් සතර අපාගත නොවී තියෙන්නෙ නෑ, විපාක ක්‍රියාත්මක නොවී තියෙන්නෙත් නෑ.

එතකොට ඒ කාරණය තේරුම් ගන්නත්, ඒ වගේම සාසනයේ තියෙන බරපතලකම තේරුම් ගන්නත් තමයි ඒ විදියට භික්ෂූන් වහන්සේලාගේ සිද්ධි ☞

කිහිපයක්ම සඳහන් කළේ. මොකද එතකොට බණ කියන්න, බණ පිළිපදින්න සැදී පැහැදිලා සාසනයට ඇතුල් වෙන සමහර භික්ෂූන් වහන්සේලාටත් මේ වගේ තත්ත්වයක් උදා වෙනව නම් මේ සංසාරයේ තියෙන මහා භයානකත්වය ඒකෙන්ම තේරුම් ගන්න ඕන. ඒ වගේම සාසන න්‍යායේ බරපතලකමත් තේරුම් ගන්න ඕන. ඒ නිසා ඒ වගේ භික්ෂූන් වහන්සේ නමක් සම්බන්ධ තවත් සිද්ධියක් මෙවරත් පළ වෙනවා.

ඒ වගේම මැරෙන බහුතරය සතර අපාගත වෙනවයි කිව්වම මේ මනුස්සයො විතරක් නෙවෙයි, අපට නොපෙනෙන ගුප්ත ලෝකවල ඉන්න උදවියත් ඒ ලෝකෙ ඉඳන් මැරිල චුත වෙලා සතර අපායටමයි බොහෝ කොටම යන්නෙ. දේව චුති සූත්‍රය, නිරය චුති සූත්‍රය.... ආදී සූත්‍ර ගණනාවකම ඒ බව පෙන්වා තියෙනවා. අන්න ඒ වගේ ගුප්ත ලෝකයේ ඉන්න කෙනෙක් සතර අපාගත වීම සම්බන්ධයෙන් අභයරතනාලංකාර හිමියන් ලබපු අත්දැකීමකුත් මෙවර ඉදිරිපත් කරල තියෙනවා. ඉතින් මේ හැම කාරණයකින්ම මේ සංසාරයේ තියෙන මහා භයානකත්වය තේරුම් ගන්න ඕන. ඒ නිසා මේ කාරණා නිකං විහිළුවකට, කොළොප්පමකට භාජනය නොකර දෙතුන් වතාවක්ම නැණ නුවණින් සිහි කරල, මේ මහා බියකරු සංසාරයෙන් මිදෙන්න උපනිශ්‍රයක් වේවා කියල තමයි මේ කරුණු මේ විදියට සටහන් කරන්නෙ. ඒ අනුව මේ සම්බන්ධයෙන් අභයරතනාලංකාර හිමියන්ට අත් දකින්න ලැබිච්ච තවත් විශේෂ සිදුවීම් කිහිපයක් තමයි මේ.

ලෝක සම්මතයේ හැටියට බාහිරින් බොහොම හොඳට පිරිසිදු චරිතයක් ගෙනිච්චයි කියල පිළිගන්න, යම් යම් සමාජ සේවා කටයුතුවලත් නිරත වෙලා හිටපු, යම්කිසි ආකාරයකින් බණ කියල පින්වතුන් අතර ප්‍රසිද්ධියක් දිනා හිටපු එක්තරා භික්ෂූන් වහන්සේ නමක් හිටියා. හැබැයි මේ භික්ෂූන් වහන්සේ පැවිදි වුනාට පස්සෙ යම්කිසි ස්ත්‍රී සම්බන්ධයකුත් අප්‍රකටව තිබිල තියෙනවා. එහෙම තිබිච්ච බවට මටත් යම්කිසි ක්‍රමයකට දැනිල තිබුණා. ඉතින් උන් වහන්සේ බොහොම ඉඳල යම්කිසි කාලයකදි අපවත් වුණා. ඒ අපවත් වෙච්ච කාලෙදි මමත් හොඳට යොමු කරල බැලුව කොහෙද ඉන්නෙ, මොකද වෙලා තියෙන්නෙ කියල. බලන කොට හිතාගන්නත් බැරි දෙයක් පේන්න තියෙනවා. ඒ කියන්නෙ බාහිරින් පේන්න තිබිච්ච ආකාරයට නෙවෙයි දැන් ස්වභාවය. දැන් බලු අත්බැවකට සම්බන්ධ වෙන්නයි යන්නෙ. ඊට සම්බන්ධ ගති නිමිත්තකුත් පහළ වෙලා තිබුණා. හැබැයි ඒ අවස්ථාව එතැන් පටන් ඉතාම ආසන්න කාලයකින් බලු අත්බැවකට පරිවර්තනය වුණා. ඒ පරිවර්තනය සිද්ධ වෙන්න ගියේ ඉතාම කෙටි කාලයයි.

මම ඉතින් බැලුවා, ඇයි මෙහෙම අත් බැවකට සම්බන්ධ වෙන්න හේතුව මොකක්ද කියල. එතකොට මට පේනවා, උන් වහන්සේ කාන්තාවක් එක්ක හිටපු ආකාරයක්. ඒක මනෝමය දර්ශනයට මැවිල පෙනුනා. බලන කොට තවත් කාන්තාවො දෙන්නෙක් එක්කත් සම්බන්ධයක් තිබිල තිබුණා. ඒ අයගෙ වයසත් බොහොම අඩුයි. දැන් මම මගෙන්ම අහනවා, ඇයි මෙහෙම වෙන්නෙ, ඇත්ත වශයෙන්ම ඒ පේන දර්ශනය සත්‍යයක්ද කියල. ඒ මොකද කියල මමම සමාධියට යොමු කරල අදහස ගත්තා. එතකොට මට පේනවා මේක සත්‍යයක් කියල. මෙන්න මේකයි වුනේ කියල අන්තිමට දර්ශනයක් වැටුණා. මම ඒක තහවුරු කරගන්න යළි යළිත් බලන කොට මෙන්න මේකයි සිද්ධ වුනේ කියල ඒ වෙච්ච සිදුවීම වෙච්ච හැටියටම අතීත් සැරේ දර්ශනය වුණා.

ඒ එක කාන්තාවක් ඇඟ ටිකක් මහත තළෙලු කෙනෙක්. මේ හාමුදුරුවො ඒ කාන්තාවත් එක්ක එක්තරා සම්බන්ධයක යෙදිච්ච ආකාරය ඒ විදියටම පෙන්නුම් කළා. ඊට පස්සෙ තවත් කාන්තාවො දෙන්නෙක්ගෙ සම්බන්ධයක් තිබුණත්, වැඩියෙන්ම හිත උපාදාන කරගෙන තිබුණෙ අර මුලින් කියපු කාන්තාව මුල් කර ගෙන. මෙන්න මේ සම්බන්ධය තමයි උන් වහන්සේට මරණාසන්න මොහොතෙදි නිමිත්ත විදියට දර්ශනය වෙලා තිබුණෙ. එදා වෙච්ච සිද්ධිය ඒ ආකාරයෙන්ම දැනුත් සිද්ධ වෙනව වගේ තමයි උන් වහන්සේට දර්ශනය වුණේ. ඒක තමයි උපාදාන කරගෙන තිබිච්ච කර්ම නිමිත්ත. අන්තිමට උන් වහන්සේගෙ හිත හිටියෙත් එතැනට.


ඊට පස්සෙ මම බැලුවා ඊළඟට මොකද වෙන්නෙ කියල. ඒ දර්ශනය බලා ඉඳෙද්දීම වෙනස් වෙලා ගිහින් යම් තැනක ඉන්න ඇල්සේෂන් වර්ගයේ බැල්ලියකගෙ රූපය තමයි අන්තිමට ගති නිමිත්තක් විදියට මතු වෙලා පෙනුනෙ. ඒ කියන්නෙ අර කාන්තාව හැටියට අන්තිමට පෙනුනෙ මේ බැල්ලිය. පෙර තිබිච්ච දර්ශනය අනුව ඒ හිටපු ශරීරයෙන් ඒ කාන්තාවත් එක්ක ඉන්න මොහොත දර්ශනය වෙනකොටම කර්ම ශක්තිය ක්‍රියාත්මක වෙලා අර හිටපු කාන්තාවගෙ ස්වභාවය ඇල්සේෂන් බැල්ලියකටයි යොමු වෙලා තිබුණෙ. එතකොට මේ ගන්ධබ්බයගෙ ස්වභාවය බල්ලෙක්ගෙ ස්වභාවයට පරිවර්තනය වෙලා තිබුණා. දැන් අර කාන්තාවත් එක්ක එක්තරා ආකාරයකට හිටපු විදියටම ඒ ගන්ධබ්බ කයින්ම මේ බැල්ලියගෙන් කිරි උරා බොන ආකාරයක් හා සම්බන්ධ වුණා. මිනිස් ශරීරය මහා බලු ශරීරයක් බවට පරිවර්තනය වෙලා, ඒ ඉරියව්ව එහෙම්ම කරගෙන යද්දි මේ බලු ගන්ධබ්බය බලා ඉඳෙද්දීම පුංචි වෙලා ගිහින් බලු පැටියෙක් කිරි බොන තත්ත්වයට පත් වුණා. ඊට පස්සෙ ඒ බලු ගන්ධබ්බය අතුරුදන් වෙලා ක්ෂණිකවම කිරණ ශක්තියක් වශයෙන් ඒ බැල්ලියගෙ බඩට ඇතුල් වුණා. ඒ කියන්නෙ බැල්ලියගෙන් කිරි බොන දර්ශනය අහක් වෙලා පෙකණිය පැත්තෙන් ක්ෂණිකවම බඩට ඔක්කන්ති වුණා. එතනින් එහාට ඒ ගන්ධබ්බයාට, දීර්ඝ නින්දකට ගියා වගේ මොකද වුනේ කියලවත් නිච්චි නැති ස්වභාවයක් ආවා. ඒ කියන්නෙ ඒ ගන්ධබ්බයත් දන්නෙ නෑ තමන්ට මොකද වුනේ කියල, මනස නිදි ගැන්විලා. කර්ම ශක්තිය ක්‍රියාත්මක වෙලා බලු ශරීරයකට පරිවර්තනය වුණා. ඊළඟට බලන කොට ඒ බැල්ලියගෙ බඩේ උප්පත්තිය ලබල. ඕක තමයි වෙච්ච සිද්ධිය.

හැබැයි බල්ලන්ගෙ සංවාසයන් හැම කාලෙකම නැති නිසා, ඒකට වෙනම කාල වකවානු තියෙන නිසා, ඒ වගේ බලු ගන්ධබ්බයෙක් හරියටම ඔය වෙලාවෙදි බැල්ලියකගෙ කුසට ඇතුල් වුනේ කොහොමද කියල කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන්. ඉතින් මේ කියන කාලයත් එහෙම සංවාස කාල වකවානුවක් වෙන්න පුළුවන්. නමුත් එතනදි බලු සංවාසයක් සිද්ධ වෙච්ච මොහොතෙම ගන්ධබ්බයෙක් කුසට ඇතුල් වෙනවයි කියල නියමයක් නෑ. ඒ සිද්ධියෙන් දවසක් එකහමාරක් ඇතුලත වුනත් ඒ බීජ බැල්ලියගෙ තියේ නම්, ඒ කාලය ඇතුලත මැරෙන කෙනෙක් චුති පටිසන්ධියකින් බලු ගන්ධබ්බයෙක් වෙලා ඒ බීජය අල්ල ගන්න බැල්ලියගෙ කුසට ඔක්කන්ති වෙන්න පුළුවන්. මාතා පිතරෝච සන්නිපාතා කිව්වම, මවු පිය දෙන්නෙක්ගෙ සන්නිපාතය හෙවත් එකතු වීම සිද්ධ වෙන මොහොතෙම ගන්ධබ්බයෙක් කුසට ඔක්කන්ති වෙනවයි කියල නෑ. මවු පිය දෙන්නෙක්ගෙ සන්නිපාතයක් ඕන කියල විතරයි තියෙන්නෙ. ඒ කාරණය පැහැදිලි වෙන තැනක් තමයි, මාතානි උතුනි හොන්ති කියන කාරණය. ඒ කියන්නෙ මවුගෙ සෘතු ගති ඇති වෙන්නෙ එවෙලෙ නෙවෙයි. ඊට සුමාන ගණනකට පෙර ඒ සිද්ධිය වෙලා තියෙන්න පුළුවන්. නමුත් අද මේ කාරණය එවෙලෙම වෙන දෙයක් විදියට පටලවාගෙන තියෙනවා. ඉතින් මේ කියන කාරණා 2, කල් තියා සිද්ධ වෙලා තියෙන්න පුළුවන්. ඒ වගේ කලින් ඒ ඇල්සේෂන් බැල්ලිය සෘතු වෙලා ඉන්නත් ඇති, දවසකට එකහමාරකට පෙරදි සංවාසයක් සිද්ධ වෙලා තියෙන්නත් ඇති. ඒ වගේ අවස්ථාවක ඒ හැදිච්ච යුක්තානුව තිබුණ නම් එතනට බලු ගන්ධබ්බයින් ඇදිල ඇවිත් කර්මානුරූපීව සුදුසු එවුන් ඒ බැල්ලියගෙ බඩට ඔක්කන්ති වෙනවා.

දූන් මේ ඇල්සේසන් කියන වචනය මොන භාෂාවෙන් හැඳුනත් ඒකෙන් කියවෙන පද නිරුක්තියක් තියෙනවා. සන් කියන්නෙ සන්තානය. ඇල් සේ කියන්නෙ බොහොම සිසිලක් වගේ පේනවා. සන්තානය පිරිත් බැලුවම හරියට බොහොම සාන්තයි, බැලු බැල්මට බොහොම හොඳ කෙනෙක්, ඇල් වෙලා නිවිච්ච හදවතක් පිරිත් පෙන්වන්නෙ. ඒ ඇල් සේ ගතිය තමයි ලෝකයට පෙන්නුවෙ. නමුත් කරල තියෙන්නෙ ගැළපෙන්නෙ නැති තිරිසන් වැඩ. නිවිච්ච හදවතක් පෙන්නගෙන තිරිසන් වැඩ කරන කොට සන්තානය ඇල් සේ වෙලා පේන්නෙ. නමුත් කළේ බලු වැඩ නම් ඒ ජාතියෙ බල්ලෙක් වෙන්න හේතු යෙදෙනවා. හැබැයි අර ලෝක සම්මතයේ තිබිච්ච ස්වභාවය නිසා බල්ලෙක් වෙලා උපන්නත් විශේෂ තැනක් ලැබුණා. ඒ කියන්නෙ මොන විදියෙ නීච වැඩ කළත්, ලෝක සම්මතයේ කරපු පින් වැඩ තිබුණ නම් ඒකෙ ඵලය ලැබෙනවා. ඒ නිසා පාරෙ අයාලෙ යන, නිකං කෑට ගැහිච්ච බල්ලෙක් නොවී විශේෂ තැනක යම් කිසි සම්පත්තියක් ඇතිව උපන්නා. අපේ සිංහල නම්වලින් මේ ඕනෑම වචනයක නිරුක්තිය ගත්තම හරියට අදහස එනවා. (හෙළ බොදු පියුම 11 වන කලාපයේ සිට මේ වචන හැදෙන හැටි, ඒවායේ නිරුක්ති එන හැටි ලිපි මාලාවකින් ඉදිරිපත් කරල තියෙනවා.)

ඉතින් මේ සිද්ධිය හරි පුදුම දෙයක් නිසා මම තුන් වතාවක් විතර බැලුවා. මේක ඇත්තටම වෙන්න පුළුවන්ද ? මේ කාරණය මගේ මනෝ සංකල්පයක් නම් ඒක මම හිතන හිතන විදියට වෙනස් වෙන්න ඕන. නමුත් ඒක එහෙම වෙනස් වුනේ නෑ. මම මධ්‍යස්ථව සිහි කරල බැලුවා. ඒත් ඒකමයි පෙනුනෙ. අන්තිමට එහෙම දෙයක් නොවුනයි කියල හිතාගෙන අනිත් පැත්තටත් හිතල බැලුවා. ඒත් ඒ දර්ශනයම පෙනුනා. ඇත්තටම මේක එහෙම දෙයක්ද? ඉතින් මම සත්‍යයම පෙනේවා කියල අධිෂ්ඨාන කළාම නැවතත් ඒකම පේන්න පටන් ගත්තා. කෙටියෙන් කියනව නම්, මේ හාමුදුරුවන්ගෙ මස් ලේ කයේ මරණයත් එක්කම මනුස්ස ගන්ධබ්බයා පිට වෙලා ගිහින්, බලු නිමිත්තක් ඇවිත් ඉතා කෙටි කාලයක් ඇතුලත චුති පටිසන්ධි වෙලා බලු ගන්ධබ්බයෙක් බවට පරිවර්තනය වෙලා බැල්ලියකගෙ කුසට ඇතුළු වුණා. නමුත් මෙහෙම දෙයක් සිද්ධ වුනයි කියල ඒ හාමුදුරුවන් ළඟ හිටපු පිරිස නම් කොහෙත්ම විස්වාස කරන එකක් නෑ. ඒ වුනත් ඇත්ත කතාව ඕකයි. අපි හිතන් ඉන්න දේවල් නෙවෙයි මළාට පස්සෙ සිද්ධ වෙන්නෙ.

දූන් මේ කියන්න යන්නෙ ගුප්ත ලෝකයේ හිටපු අමනුස්සයෙක්ගෙ සතර අපාගත වීමක් ගැන. අපේ පන්සලේ ඒ කාලෙ එක්තරා උපාසක මහත්තයෙක් නතර වෙලා හිටියා. ඒ වගේම කියන දේ නාහෙට අහන්නෙ නැති තවත් හාමුදුරු නමකුත් වැඩ හිටියා. උන් වහන්සේ කියන කිසිම දෙයක් ගණන් ගන්නෙ නෑ. ඉතින් මේ උපාසක මහත්තය බොහොම අහිංසක වුනාට නිතරම ඔල්මාදෙන් වගේ මොනව හරි දොඩවනවා. මේ හාමුදුරුවො අර උපාසක මහත්තයත් එක්ක නිතරම වගේ රණ්ඩු වෙනවා. මොකද ඔල්මාදෙන් වගේ කියන මොනව හරි කතා නිසා. ඉතින් මම ඔය කාරණය දන්න නිසා රණ්ඩුවට යන්න එපා කියල නිතරම උපදෙස් දුන්නා. මොකද ඒ අය ඔහොම රණ්ඩු වුනාම ඒකෙන් විහිදෙන විස කිරණ මුල් කරගෙන අමනුස්සයො මට පහර ගහන්න බලනවා. ඒ නිසා මම අනික් අයටත් කිව්වා, ඔයගොල්ලො මේ විදියට රණ්ඩු සරුවල් වුනොත් අමනුස්සයො ඒ අවස්ථාව ප්‍රයෝජනයට අරගෙන මට පහර ගහන්න



යොදා ගන්නව කියල. මේ අමනුස්සයො ඇවිස්සෙන කොට විහිදෙන ශක්තිය නිසා ඒ පැත්ත ක්‍ෂණයකින් දූෂ්‍ය වෙනවා. ඒ වෙලාව ප්‍රයෝජනයට අරගෙන ඒ අමනුස්සයො මට පහර දෙනවා. අමනුස්සයන්ගෙ මෙහෙම ක්‍රමයක් තියෙන නිසා හැම දෙනාම පරිස්සමට ඉන්න කියල මම අනික් පිරිසටත් උපදෙස් දීල තිබුණා. මොකද මිනිස්සු අන්තයටම දූෂ්‍ය වුනාම කොච්චර හරි බලවත් වෙන අමනුස්ස කොටස් ඉන්නවා. ඒ වගේ වෙලාවකදි තමයි ඒ අයට බල ගන්න පුළුවන් වෙන්නෙ. නමුත් ඉතින් කිව්වට මේ අය එකක්වත් ඇහුවෙ නෑ.

දවසක් මම දානෙ අරගෙන දවල් වරුවෙ ටිකක් වෙලා නිදාගෙන හිටියා. නිදාගන්නව කිව්වට මම සාමාන්‍යයෙන් හාන්සි වෙලා සමාධියෙන් ඉන්නෙ, නින්ද යන්නෙ නෑ. ඔහොම ඉන්න කොට එක පාරටම මට දැනුනා, විශාල ශක්තියකින් මගේ පපුවට කවුරු හරි ගැහුව කියල. ඒත් එක්කම මට පේනවා, මා වටා කිරණ වළල්ලක් තියෙන බව. ඒක හීනයක් නෙවෙයි, නිකං ස්වභාවිකව ඉන්න කොට දැනිච්ච දෙයක්. අර ගහපු පහර ඒ කිරණ වළල්ලට තමයි වැදුනෙ. ඇඟට වැදුනෙ නෑ. හැබැයි ගහපු වේගය බැලුවොත්, සාමාන්‍යයෙන් වාහන දෙකක් එකට හැප්පුනා වගෙයි දැනුනෙ. ඒ තරම් මහ විසාල මනෝමය ශබ්දයක් එක්කයි මේ ගැටීම ආවෙ. මට පැහැදිලිවම තේරුණා මේ ගැහුවෙ අමනුස්සයෙක් කියල.

මම ඊට පස්සෙ යොමු කරල බැලුවා මොකද වුනේ, කවුද ගැහුවෙ කියල. ඒ ගහපු අමනුස්සය කරණමක් ගහල තමයි ඒ පහර ගැහුවෙ. හැබැයි ඒ කරණම ආපසු කැරකිලා ඒ අමනුස්සයටම වැදිල උඩුකුරුව ගිහින් ආකාසෙ හිටියා. අර කිරණ වළල්ල නිසා නිකං රබර් බෝලයක් වගේ ආපසු ගිහින් ඒ අමනුස්සයගෙම ඇඟටයි වැදුණෙ. ඒ අමනුස්සය ඒ කාරණය දන්නෙ නැතිවයි ගැහුවෙ. හැබැයි ගැහුවෙ මැරෙන්න කියල හිතාගෙන.

දූන් කෙනෙක් අහන්න පුළුවන් කොහොමද ඒක දැනගත්තෙ කියල. ඒ ගහපු ස්වභාවයෙන් මට වැටහුනා ඔහු මෙච්චර සැඩ පහරකින් ගැහුවෙ කියල. ඒ පහර, ඉරියව්ව දැක්කම මාරාන්තික පහරක් ගැහුවෙ කියල වැටහෙනවා. එහෙම නැතිව මම හිතල කියන එකක් නෙවෙයි. උදාහරණයක් විදියට කෙනෙක් තව කෙනෙකුට යකඩ පොල්ලකින් ගහනවා. එතකොට ඒ පහර ඒ පුද්ගලයට නොවැදී ළඟ තියෙන පුවක් ගහක් වගේ කාෂ්ට ගහකට වදිනවා. ඒ ගහපු පහරට ඒ ගහ පැලිල යනවා. හැබැයි ඒ පුද්ගලයට වැදුනෙ නෑ. නමුත් ඒ පහර දැක්කම වැටහෙනවා, මේ ගහපු පහරට පුවක් ගහත් ලෙලි ගියා නම් මගේ ඔළුවට වැදුන නම් ඔළුවෙ කෑලිත් නෑ කියල. ගහල තියෙන්නෙ මැරෙන්න මිසක් නිකං අතගාන්න නෙවෙයි කියල එතකොට දකිනවා. ඒ වගේ දෙයක් තමයි මෙතනදි සිද්ධ වුණෙත්.

ඉතින් ඒ ශක්තිය ආපසු කැරකිලා ගිහින් අමනුස්සයගෙ පපුවට වැදිච්ච නිසා කැරකිලා ආකාසෙ උඩුකුරුව හිටියා. මොකද ඒ ශරීර හරි සියුම්. නමුත් මහ බලවත් කිරණමය ශරීර. ඉතින් මේ අමනුස්සය වැඩේ වරද්ද ගත්ත නිසා මම තවත් යොමු කරල බැලුවා. බලන කොට හොඳ ලස්සන උස සුදු ශරීරයක් තියෙන කෙනෙක්. පෙනුමෙ හැටියට අඩි 30 ක්

විතර උසයි. එච්චර උසට තමයි ඒ අමනුස්සය ගුප්ත ලෝකයේ ඉන්නෙ. මේ කියන්නෙ යම්කිසි ප්‍රබල යස්සයෙක්. නමුත් අත්වල හිටන් වළලු වගේ ආභරණ දාල උඩු කයට ඇඳුම බොහොම අඩුවෙන් තිබුණෙ. හැබැයි මේ සතර අපාගත යස්සයෙක් නෙවෙයි. චාතුර් මහා රාජිකය යටතේ පාලනය වෙන මිනිස් මට්ටමේ ඉන්න කෙනෙක්. මහ සොහොන්, රීරි යක්ස... ආදී වශයෙන් කියන්නෙත් ඒ වගේ අය. චාතුර් මහා රාජිකයට සම්බන්ධ වෙලා සේවය කරන එක්තරා කොටසක්. ඒ වගේ සේවය කරන කොට යම් කිසි විදියකින් අවස්ථානුකූලව බලාගෙන ඉඳල ඒ අය තවත් අයගෙන් පළිගන්නත් පුළුවන්.

සාතාගිරි හේමවත කියල යස්සයො දෙන්නෙක් බණ අහල සෝවාන් වෙච්ච කතාවක් ධර්මයේ සඳහන් වෙනවා. ඒ අයත් චාතුර් මහා රාජිකය යටතේ පාලනය වෙච්ච යස්ස කොටසක් මිසක් සතර අපාගත යක්ෂ නෙවෙයි. ඒ කියන්නෙ බණ අහල අවබෝධ කර ගන්න පුළුවන් මට්ටමේ අය. හැබැයි ද්වේශයෙන් පළි ගන්න ගියොත් විනාස වෙන්නත් පුළුවන්. මේ කාරණා දෙකම මේ අයට තියෙනවා.

සැරියුත් මහ රහතන් වහන්සේට ටොක්කක් ඇණල අපා ගත වෙච්ච නන්ද කියන යස්සයත් ඒ වගේ කෙනෙක්. ඒ නන්ද යස්සයගෙ යාළුවා තෙරුවන් කෙරෙහි පැහැදිලා හිටපු කෙනෙක්. ඒ නිසා තමයි නන්ද යස්සය ටොක්ක අනින්න පෙර මේ යාළුව කිව්වෙ, ඔය ඉන්නෙ උත්තමයෙක්, ඕක කරන්න එපා මහ භයානක වැඩක් කියල. නමුත් නන්ද යස්සය ඒක ගණන් ගත්තෙ නෑ. එතකොට මේ දෙන්නත් චාතුර් මහා රාජිකය යටතේ හිටපු අය. දෙන්නම පෙර කරපු පිනකින් තමයි එතන හිටියෙ. ඒ කියන්නෙ චාතුර් මහා රාජිකයේ වෛශ්‍රවණ දෙවියන් යටතේ ඉන්න යස්සයො. ආටානාටිය සූත්‍රයෙදි යක්ඛෝවා, යක්ඛිණීවා, යක්ඛ පාරිසජ්ජෝවා, යක්ඛ මහා මත්තෝවා ..... ආදී වශයෙන් කියන්නෙත් ඒ වගේ යස්ස පිරිසට අයිති කොටස්. යස්ස මහා මත්තෝවා කියන්නෙ එහේ ඉන්න යස්ස මහ ඇමතිවරු. මනුස්ස ලෝකෙ ඉන්න මැති ඇමතිවරු වගේ එහේ ඉපදිලත් මැති ඇමතිවරු වෙච්ච අය ඉන්නවා.

දැන් ඉතින් මේ සිද්ධියෙන් පස්සෙ මම නැගිටල එළියට ආවා. එතකොට අර උපාසක මහත්තය කෑ ගහනවා, මම තාත්ත කෙනෙක් වගේ අනේ මට ගැහුවා, මෙහෙම කළා කියල. මම ඇහුවා මොකද වුනේ කියල. මේ උපාසක මහත්තය දොඩවන කොට අර හාමුදුරුවො කනට පහරක් ගැහුව කියල අනිත් අය කිව්වා. ඉතින් මම නැවතත් කිව්වා, මම ඔයගොල්ලන්ට කියල තියෙනවනෙ ගුටි කාපු අයට නෙවෙයි අන්තිමට මටයි වදින්නෙ, තව පොඩ්ඩෙන් ඉවර වෙන්නෙ මමයි කියල. මම කියල තියෙනවා රණ්ඩු වෙලා සැඩ පරුෂ වෙන්න එපා, ඔය අයගෙන් නෙවෙයි මගෙන් තමයි පළිගන්නෙ කියල.

ඒ විදියට මගෙන්ම පළිගන්නත් හේතුවක් තියෙනවා. මොකද ඒ අය දකිනවා මම මුල් වෙලා මේ පූජනීය ස්ථානයේ විසාල වශයෙන් පිරිස දහමට නැඹුරු වෙන බව. මේ අමනුස්සයො මාර පාක්ෂික බලවේග එක්කත් එකතු නිසා ඒ අයටත් ඕන ඒක වළක්වන්න. ඒ වගේ අවස්ථාවකදි මාර පාක්ෂික බලවේගත් ඒ අයට උදව් කරනවා. කොහොම හරි අහවල් එකා පැත්ත දාපන්, එතකොට ඉන්න ඔක්කොම වැටෙනව කියල ඒ අයත් ඒකට අනුබල දෙනවා. කාගෙ හරි මාධ්‍යයකින් වුනත් කමක් නෑ, ඒ අයගෙ පැත්තට විරුද්ධව වැඩ කරන අයට පහර ගහන්න තමයි බලන්නෙ. ඒක මාර පාක්ෂිකයන්ගෙ උසි ගැන්වීමක්. ඒ වගේ අවස්ථාවකදි මම



පැත්ත වැටුන නම් ඒ සියල්ල කඩා කප්පල් වෙන බව ඒ අය දන්නවා. ඒ අයගෙ බලාපොරොත්තුවත් ඒක. මුලට ගැහුවම ඔක්කොම ඉවරයි. නමුත් ඉතින් මේ වෙන කොට නම් මුලට ගැහුවයි කියල වැඩක් නෑ. මොකද මේ කාලෙ වෙද්දි අග හැදිල ඉවරයි. පින්වත් පිරිස් අතු පතර විහිදිලා මල් එල හට ගෙන තියෙන්නෙ. දැන් ඉතින් පහර දුන්නත් එකයි, නැතත් එකයි. ඉතින් එදා මේ අයට කොච්චර කිව්වත් ඒ කාරණයේ බරපතලකම තේරුම් ගත්තෙ නෑ. අන්තිමට මෙන්න මෙහෙම දෙයක් ඔය වෙලාවෙ වුනේ කියල, වෙච්ච සිද්ධියත් මම ඒ අයට කිව්වා.

දැන් අර උපාසක මහත්තයට ගහන කොට තමයි මේ අමනුස්සය වෙලාව බලාගෙන ඉඳල මගේ පපුවට පහර දුන්නෙ. මම යොමු කරල බලන කොට කාලයක ඉඳන් එන වෛරයක් තිබිල තියෙන්නෙ. එළාර රජ්ජුරුවන්ගෙ ප්‍රධාන යෝධයෙක් හිටියා දීඝජන්තු කියල. අන්න ඒ යෝධය තමයි මේ ගුප්ත ලෝකෙ ඉන්න අමනුස්සය. එදා යුද්ධ කාලෙදි සම්බන්ධ වෙලා මියගිය කෙනෙක්. ඉතින් මගෙත් මොකක් හරි උපදෙස් දීපු සම්බන්ධයක් තියෙන්න ඇති ඔහුට විරුද්ධව. ඒකෙ පළිය තමයි මේ ගන්න ඇත්තෙ. එහෙම නැත්නම් යම්කිසි විදියකින් කවුරු හරි ඒ කාලෙ කරපු ප්‍රබල හිර බන්ධනයකට අහු වුනාද දන්නෙත් නෑ. මොකද එහෙම කළා නම් ඒ වට පිටාවෙ ඇල්ම බැල්ම තියෙන බොහෝ අමනුස්සයො ඒකට හිර වෙනවා. කොහොම හරි මම නැවතත් යොමු කරල බැලුව මේ පුද්ගලයට මොකද වෙලා තියෙන්නෙ කියල. අර පහර නැවත වැදිල උඩුකුරු වෙච්ච ගමන් එහෙම්ම ඉන්නවා. එන්න එන්නම ශරීරයේ ජීව ශක්තියත් අඩු වෙනවා. නමුත් මැරෙන්නෙ නෑ. කකුල් දිහා ඉඳන් ටික ටික මැරී ගෙන ගිහින් ඔළුව පැත්ත තමයි අන්තිමට මැරෙන්නෙ. හැබැයි එතකොට මට පේනවා, ඔළුව පැත්ත පහළට වැක්කෙරෙනව වගේ. ඒ වැක්කිරීම ගිහින් තියෙන්නෙ ආකාසෙ ඉඳල පොළව යට තියෙන අපායකට. මේ අමනුස්සයගෙ ශරීරය දිය වෙවී කෙළින්ම පහළට වැක්කෙරිල අපායෙ ශරීරය හැදෙන්න නියමිතයි. මේ එක්තරා ක්‍රමයක්. ඊට පස්සෙ දින 2 ක් විතර යනකල් මේ අමනුස්සය ඔය විදියට දිය වෙලා ගිහින් අන්තිමට මුකුත්ම නැතිව ගියා.

දැන් මේ අමනුස්සයට සම්බන්ධ විසාල පිරිසක් ඇවිත් බලනව ඔහුට මොකද වුනේ කියල. බලන කොට එතන මහ වළක් හැදිල තියෙනවා. ඒ වළ දිහා බල බලා මේ පිරිස බයේ දුවනවා. ඒ අමනුස්සය අර විදියට පොළව පළාගෙන අපාගත වෙච්ච මාර්ගය තමයි ඒ පෙන්නුම් කළේ. හැබැයි මේ පොළව පලාගෙන යනවයි කිව්වට ඒක අපේ මස් ලේ ඇහැට පේන එකක් නෙවෙයි. භෞතික පොළව පැළීමක් ගැන නෙවෙයි මේ කියන්නෙ. කිරණ ලෝකයත් එක්ක මේ ලෝකය සම්බන්ධයි. ඒ කිරණ පොළව තමයි පළාගෙන ගියේ. මේ හැම භෞතික වස්තුවක් එක්කම කිරණ ධාරාවක් ඒ විදියටම තියෙනවා. ඒ වගේ මේ භෞතික පොළවත් එක්ක කිරණ පොළවකුත් තියෙනවා. එතකොට මේ අමනුස්සයගෙ කිරණමය ශරීරය, ඒ කිරණ පොළව පලාගෙන තමයි යටට ගියේ. කලින් සඳහන් කළා වගේ දහමෙ එන කතාවක් තියෙනවා, නන්ද කියන යස්සයා සැරියුත් මහ රහතන් වහන්සේගෙ හිසට වැරෙන් ඇනපු ටොක්කක් නිසා එවෙලෙම පොළව පළාගෙන ගියා කියල. ඒ වගේ සිද්ධියක් තමයි මේ. නමුත් මේ කථාව කිව්වෙ, එහෙම දේවල් මේ කාලෙත් සිද්ධ වෙනවයි කියල පෙන්වන්න මිසක්, මම සැරියුත් මහරහතන් වහන්සේට අහලකින්වත් සමාන වෙන්න නෙවෙයි. ඒ නිසා මේ කාරණය වරදවා තේරුම් නොගත යුතුයි. ඉතින් අර දීඝජන්තු කියන යෝධයා එදා යුද්දෙදි මැරිල ගුප්ත ලෝකෙ යස්සයෙක්

විදියට මෙච්චර කලක් ඉඳල අපාගත වුණා.

**දැන් මේ කාරණය කිව්වෙ එක්තරා වැදගත් පණිවිඩයක් දැනුම් දෙන්න. මේ ගෙවල්වල ඉන්න පිරිස් අගක් මුලක් දන්නෙ නැතිව රණ්ඩු සරුවල් වෙනවා, ගහ මරා ගන්නවා. ඔය වගේ අවස්ථා දඩමීමා කරගෙන ගුප්ත ලෝකයේ ඉන්න විවිධ අමනුස්සයො විවිධ අයගෙන් පළි ගන්න බලනවා. සමහර විට ඔය පිරිස් ගහ මරාගන්න අවස්ථාවල ඒ මනුස්සයින්ගෙ ශරීරවලින් පිටවෙන විස කිරණ නිසා ඒ අමනුස්සයො ඇඟට ආවේස වෙනවා. ආවේස වෙලා ඒ ආවේසයෙන්ම අනිත් අය මරනවා. එහෙම නැත්නම් කපනවා, කොටනවා, දෙන්නට දෙන්න පෙති ගහ ගන්නවා, කා කොටා ගන්නවා. මොකද ඒ ගලන ලේ ඒ අමනුස්සයින්ට වාසියක්. උන්ගෙ ආහාරය තමයි ඒක. ඒ නිසා මිනිස්සු කුපිත කරවල ඒකෙන් ප්‍රයෝජන ගන්න අමනුස්ස කොටස් බලාගෙන ඉන්නවා. ඒ අයට බුදු දහමෙ කියන්නෙ ද්වේශ භක්‍ෂක අමනුස්සයො කියල. ද්වේශය ආහාර කර ගෙන තමයි ඒ අය ජීවත් වෙන්නෙ. කෙනෙක් කුපිත කරවල ඒක ආහාර කර ගන්නවා.**

මේ වගේ සිද්ධියක් දහමෙත් සඳහන් වෙනවා. සක්‍ර දෙවියන්ගෙන පඬුපුල් ආසනයට එක්තරා කුරු, මිටි යස්සයෙක් ගිහින් වාඩි වෙච්ච කතාවක් තමයි ඒකෙන් කියන්නෙ. සක්‍ර දෙවියො සුදම් සභාවට ගිය අතරෙ තමයි ඒ යස්සයා ඒ ආසනයෙ ඉඳ ගත්තෙ. ඒ වගේ වෙලාවකදි සක්‍ර දෙවියන්ගෙ අනෙක් පරිවාර දේව පිරිස ඒ ආසනය ආරක්‍ෂා කරනව මිසක් කාටවත් ඉඳගන්න ඉඩ දෙන්නෙ නෑ. සිංහාසනය වගේ තියෙන තමන්ගෙ රජ්ජුරුවන්ගෙ ආසනය නිසා ඒක ආරක්‍ෂා කරනවා. දැන් ඉතින් මේ කැත යස්සයා අර ආසනයෙ ඉඳගන්නව දැකල අනෙක් දේවතාවන්ට තරහ ගිහින්, ඔක්කොම එකතු වෙලා කෑ ගහන්න පටන් ගත්තා, අපේ දෙවියන්ගෙ ආසනය කැත කරන්නෙ නැතිව ඉක්මනින් ඉවත් වෙයන් කියල. එතකොට මේ යස්සයා උඩ පැන පැන හිනා වෙවී මහත් වෙන්න පටන් ගත්තා. අන්තිමට ආසනයෙන් එකක් දක්වාම විසාල වුණා. මේ යකා මහ පුදුම යකෙක්නෙ කියල දේවතාවො බය වුණා. ඉතින් මේ කාරණය සක්‍ර දෙවියන්ට ගිහින් කිව්වම, ද්වේශය ආහාර කර ගෙන ජීවත් වෙන මේ අභවල් ජාතියෙ යස්සයෙක් කියල සක්‍ර දෙවියො දැන ගෙන හිටියා. ඒ නිසා සක්‍ර දෙවියො ගිහින් මේ යස්සයා ළඟ බිමින් ඉඳ ගත්තා. ඉඳ ගෙන, යස්සය මට ඔය ආසනයත් එකයි, බිමත් එකයි කියල හිනා වුණා. යස්සයා සක්‍ර දෙවියන්ව අවුස්සල ගන්න උත්සාහ කළත් සක්‍ර දෙවියො පොඩ්ඩක්වත් ඒව ගණන් ගත්තෙ නෑ. සක්‍ර දෙවියො හිනා වෙලා බලන් ඉඳෙද්දීම, මේ යස්සය ක්‍රමයෙන් කෙට්ටු වෙලා, පුංචි වෙලා සක්‍රයට ආසනය දීල අතුරුදන් වුණා.

ඉතින් මේ වගේ කතා අපේ දහමෙත් සඳහන් වෙනවා. මේ නිසා කවදාවත් ද්වේශයෙන් කටයුතු කරන්න හොඳ නෑ. මොකද ද්වේශ භක්‍ෂක අමනුස්සයො ඒක ආහාර කර ගෙන මනුස්සයින්ගෙන් පළි ගන්න බලනවා. ඒ නිසා ඒ වගේ අවස්ථාවලින් ප්‍රවේසම් වෙන්න කියන පණිවිඩය තමයි මේ දහම් කතාවෙන් කියන්නෙ.

ඒ වගේම මෙතනදි හුඟ දෙනෙක් නොදකින කාරණයක් තියෙනවා. හෘදයාබාධ තියෙන සමහර අය රණ්ඩු වෙලා බහින් බස් වෙලා, හිටි ගමන් පපුව බදාගෙන නිච්චි නැතිව එහෙම්ම මැරෙන අවස්ථා තියෙනවා. කවුරුවත් දන්නෙ නෑ, මේ වගේ හෘදයාබාධ තියෙන අයට හිටි ගමන් විදුලි සැර වැදුන වගේ පපුවෙ හිරවීමක් එනවා. ඒ නිසා ඒ වගේ රෝගීන්ට කියනවා කලබල කරන්න එපා, අධික විදියට කම්පා අවස්ථාවන්ට මුහුණ දෙන්න එපා ආදී වශයෙන්. හැබැයි ඒ වෙලාවට ඒ පුද්ගලයට කියා ගන්න විදියක් නෑ මොකක්ද වුනේ කියල. නමුත් බොහෝ කොටම ඔය වගේ අවස්ථාවල අමනුස්සයො පහර ගහනවා. ඒ වගේ දුර්වලතාවයක් බලල, ඒ දුර්වලතාවයෙන් කෙනෙක්ගෙ ද්වේශයක් නැගිච්ච වෙලාවක ඒක ආහාරයක් කරගෙන ඒ අමනුස්සයින්ට ඒ පුද්ගලයට පහර ගහල මරන්නත් පුළුවන්. නමුත් ඉතින් මරණ පරීක්‍ෂණයෙදි නිකං හෘදයාබාධයකින් මැරුණයි කියනව මිසක් ඔය කාරණය අහු වෙන්නෙ නෑ. ඉතින් ඒ වගේ වෙලාවකට පපුවට වැදුනම පපුව හිර වෙනවා. නමුත් එතකොට කියන්නෙ රුධිර පීඩනය වැඩි වෙලා, එහෙම නැත්නම් යම් කිසි විදියකින් හෘදයාබාධයක් තිබිච්ච නිසා හදිසි කම්පනයකින් මළා කියල. හදිසි කම්පනයකින් මළා කියන කොටත් බොහෝ කොටම සිද්ධ වෙන්නෙ ඔය වගේ දෙයක්.

මේ කාරණය ද්වේශයට විතරක් නෙවෙයි, සෝකය, භය, සන්තාපය, ඒ වගේම අසාර දේවල්වලට අධික සතුටු වීම ආදිය නිසාත් වෙන්න පුළුවන්. කොටින්ම කිව්වොත් දස අකුසලයට සම්බන්ධ සිද්ධියක් නැගිච්ච වෙලාවක ඒ පරිසරයේ ඇතිවන විස කිරණ අමනුස්සයින්ට ආහාරයක් වෙනවා. මෙතනදි අසාර දේවල්වලට සතුටු වීම කියන්නෙ නියම සතුටු වීමක් නෙවෙයි. නියම සතුටට හදවත කැළඹෙන්නෙ නෑ. උදාහරණ විදියට බුද්ධේ අවෙච්ච ප්‍රසාදය, ධම්මේ අවෙච්ච ප්‍රසාදය, සංඝේ අවෙච්ච ප්‍රසාදය කියන්නෙ නියම සතුටක්. ඒ කියන්නෙ ලෝකයට බැඳුණු ස්වභාවය අඩු වෙන කොට ලැබෙන පැහැදීම. තපෝ ගුණය හැර, බොජ්ජංග ධර්ම හැර, නිවන හැර මේ ලෝක සත්වයාට වෙනත් සුවයක් මම නොදකිමියි කියන බුද්ධ දේශනාව අනුව ඒ සුවයත් නියම සතුටක්. ඒ තමයි ලෝකය අත් හරින කොට ලැබෙන නිදහස් සතුට. නමුත් ලෝකයේ තියෙන අසාර දේවල්වලට සතුටු වෙනව කියන්නෙ කෙලෙස් ගතියක්. ඒවත් අමනුස්සයින්ගෙ ආහාර. අන්න ඒ වගේ අවස්ථාවන් අල්ල ගෙන අමනුස්සයින්ගෙ ශක්තිය නැගෙන වෙලාවක් නිසා ඒ අයගෙ ආහාරය සපය ගන්න ඒ පුද්ගලයින්ට පහර දෙන්න පුළුවන්. මොකද මළාට පස්සෙ මළ මිනිය හෝ ගහ මරාගෙන තුවාල වෙන කොට ගලන ලේ හෝ ඒ මැරෙන කොට පිට වෙන දූෂ්‍ය විස කිරණ හෝ අමනුස්සයින්ට ආහාර වෙනවා. ඒක ලබාගන්න ඔය වගේ අවස්ථාවල උන් උපක්‍රම යොදනවා. නමුත් සාමාන්‍ය ලෝකයා හිතන්නෙ ඒ පුද්ගලයට හෘදයාබාධ රෝගී තත්ත්වයක් තිබුණා, හදවත දුර්වල වෙලා තිබුණ කියල. ඒ නිසා හදිසි කම්පනයක් ඇවිත් මළා කියනව මිසක් ඒ අයට ඇත්ත වශයෙන්ම මොකක්ද වුනේ කියල පහදල දෙන්න කෙනෙක් නෑ.

එතකොට මම මුහුණ දුන්න මේ සිද්ධිය වගේ දේවල් මට විතරක් නෙවෙයි, තවත් තැන්වල තවත් අයට අදටත් සිද්ධ වෙනව ඇති. මිනිස්සු පොඩි දේටත් රණ්ඩු සරුවල් කරන කොට ඒ පොඩි දේත් අවුස්ස ගෙන අමනුස්සයින්ගෙ ආහාරය සපය ගන්නවා. දැනුත් වැඩි හරියක් මේ සිද්ධ වෙන මිනී මැරුම්වලට, ඇණ කොටා ගැනීම්වලට හේතු වෙලා තියෙන්නෙ මේ වගේ දේවල්. නමුත් ඉතින් මේ කාරණය මිනිස්සු දන්නෙ නෑ. හැබැයි අන්තිමට ඒ අයත් ලතැ වෙනවා. අනේ මොකද කළේ, ඇයි මම මෙහෙම දෙයක් කළේ, මං හීනයකින්වත් හිතපු දෙයක් නෙවෙයි.... මේ ආදී වශයෙන් ඒ මිනී මරපු අයම අන්තිමට පාපොච්චාරණය කරන අවස්ථා තියෙනවා, තමන්ටම හිතා ගන්නත් බෑ වෙච්ච දේ. නමුත් ඇත්ත වශයෙන්ම ඒ අය එහෙම හිතුවෙ නැති බව ඇත්ත. හැබැයි අර නියපොත්තෙන් කඩන්න තියෙන දේ පොරවෙන් කපන මට්ටමට පත් කරගන්නෙ නැතිව, මිනිස්සු දැන ගන්න ඕන මේ වගේ දේවල්වල තියෙන භයානකත්වය. එහෙම දැන ගෙන පුංචි දේටත් කේන්ති නොගෙන ඉවසන්න පුරුදු වෙන්න ඕන. නැත්නම් අන්තිමට ලැව් ගින්නක් වගේ දන්නෙම නැතිව මහ විනාසයක් වෙනවා. ඉතින් මේ කාරණය දැනුම් දුන්නෙ, සංවරත්වයේ වටිනාකම සමාජයට කියල දෙන්න.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*සටහන*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# මස් ලේ කයේ මරණින් පසු ගන්ධබ්බයෙකුගේ මුල් දින 7 ගෙවෙන හැටි...

(පසුගිය කලාපයෙන්: අනාගාමී ආර්ය උත්තමයන්ට අදාළ වන අන්තරා පරිනිබ්බායී අවස්ථාව....)

ශා කනෙක්ගෙ මස් ලේ කයේ සිද්ධ වෙන මරණයත් එක්ක පිට වෙන ගන්ධබ්බයා හෙවත් සංජාතිකයා ගැන දිග විස්තරයක් මීට පෙර 24 වන කලාපයේ පටන් ඉදිරිපත් කළා. එතනදි දණ්ඩ සූත්‍රය ඇසුරින් උඩ ගැසූ දණ්ඩක් වරෙක මුලින්ද, වරෙක මැදින්ද, වරෙක අගින්ද බිම වැටෙන්නා සේ වරෙක මෙලොවින් පරලොවට යෑමත්, වරෙක පරලොවින් මෙලොවට ඒමත් කියන කාරණය ඇසුරින් ගන්ධබ්බයෙකුගෙ විවිධ අවස්ථාවන් විග්‍රහ කළා. දැන් මේ කියන්න යන්නෙ කෙනෙක්ගෙ මරණයත් එක්ක ඉවතට යන ගන්ධබ්බයා, ගන්ධබ්බ ලෝකෙ මුල් දින 7 ගත කරන ආකාරය. මේ කාරණය චුති පටිසන්ධි වෙච්ච හෝ නොවෙච්ච දෙගොල්ලන්ටම අදාල වුනත් විශේෂයෙන් බලපාන්නෙ චුති පටිසන්ධි නොවෙච්ච අයට. ඒ කියන්නෙ මැරෙන්න පෙර මේ ලෝකයේ හිටපු විදියටම ගන්ධබ්බ අවස්ථාවෙ ඉඳගෙන පරිවර්තනය වෙන අය. එතකොට අර දණ්ඩ සූත්‍රයේ උපමාව නැවතත් ගත්තොත්, දණ්ඩක් උඩ විසි කළාම උඩ රැඳෙන්න තැනක් නෑ. නමුත් විසි කරපු වේගයට දණ්ඩ උඩ ගිහින් බිමට වැටෙන කල් උඩ යම් කිසි කාලයක් ගත කරනවා.

ඒ වගේ ගත කරන අන්තරාභවික අවස්ථාවට තමයි පරලොව කියන්නෙ. දණ්ඩ උඩ විසි කළයි කියන්නෙ ඕන කමින් කරපු දෙයක්. බිම වැටෙනවයි කියන්නෙ නිරායාසයෙන්ම සිද්ධ වෙන දෙයක්. පොළවෙ තියෙන දණ්ඩ නිකම්ම උඩ යන්නෙ නෑ. යමක් පොළවට වැටෙන්න නම් අපි යම්කිසි හේතුවකින් ඒක උඩ විසි කරන්න ඕන. ආයුක්ඛය හෝ උපච්ඡේදක මරණ කියන අවස්ථා දෙකෙන් කෙනෙක් මරණයට පත් වුනොත් චුති පටිසන්ධියක් නැතිව ගන්ධබ්බය පිටවෙනවා. කර්මක්ඛය හෝ උභයක්ඛය මරණයක් සිද්ධ වුනොත් චුති පටිසන්ධියක් වෙන නිසා ක්ෂණයකින් අළුත් භවයක් ආරම්භ කරල ගන්ධබ්බ අවස්ථාවට පත් වෙන්න පුළුවන්. නමුත් එතකොට පෙර ජීවිතයෙ දේවල් මතක නෑ. දණ්ඩක් උඩ ගිහින් බිමට වැටිල යමක් අල්ල ගෙන බිම නවතිනවා. ඒ වගේ කයක් අල්ලගත්තම තමයි සත්ත්වයා තාවකාලිකව නවතින්නෙ. එතකල් නිකං සුළඟට අහු වෙච්ච පරඬැල වගෙයි. උඩ ඉන්න අවස්ථාවෙයි, බිම ඉන්න අවස්ථාවෙයි උපමාවෙන් තමයි මේ අන්තරාභවයේ සිටින සහ මවු කුසක් අල්ලා ගැනීම හෝ සනීභවන උප්පත්ති කයක් (මනුස්ස, දේව, සතර අපා වගේ යම් අත්බැව් කයක්) දරාගැනීම කියන අවස්ථා 2 පෙන්වන්නෙ.

මේ කාරණය තවත් විදිහකට පහදනව නම්, කාලයක් තිස්සෙ කෙනෙක්ගෙ කරේ මාලයක් තිබුණොත්, ඒ පිළිබඳව විශේෂ අවධානයක් ඒ පුද්ගලයට දැනෙන්නෙ නෑ. සාමාන්‍ය විදිහට ඉන්නවා. නමුත් ඒක කවුරුහරි උදුර ගන්න ආවොත්,




එහෙම නැත්නම් ගැලවිලා ළිඳකට වැටුණොත් අයියෝ කියල කෑ ගහනවා, විලාප දෙනවා. හරි වැඩේනෙ මගේ මාලෙ උදුර ගත්තා, ළිඳට වැටුණා. දැන් ඉතින් ඒක නැවත ලබාගන්න විසාල දාහයක් එනවා. ඒ වගේ බැරි වෙලාවත් මේ කය බිඳෙනව කියල දැන ගත්තොත්, හරි වැඩේනෙ මගේ කය වැනසෙන්නයි යන්නෙ කියල මහ වේගයක් ඇතිවෙනවා. ඒක ශක්තියක්. අන්න ඒ වේගය වගේ තමයි දණ්ඩක් උඩ විසිකරන කොටත් ඒකට ශක්තියක් ඕන වෙනවා. හැබැයි දණ්ඩ බිම වැටෙන්නෙ නිරායාසයෙන්. ඒකට අමුතුවෙන් ශක්තියක් දෙන්න ඕන වෙන්නෙ නෑ. ඒ වගේ දැන් ඒ මස් ලේ කයින් වෙන් වෙච්ච ගන්ධබ්බය නිකන් සුළඟට අහුවෙච්ච පරඬැලක් වගේ, තමන්ට ඕන දෙයක් කරන්න බෑ. දණ්ඩ බිමට නිරායාසයෙන් වැටෙනව කිව්වෙ ඒකයි. හැබැයි එතකොට පොළොවට තියෙන ගුරුත්වාකර්ෂණ ශක්තිය වගේ තමයි ගන්ධබ්බයගෙ තණ්හාව ආකර්ෂණය වෙනවා. බිමට වැටීම උපාදානය හා සමානයි. උදාහරණයකින් පැහැදිලි කළොත්, පොඩි ළමයෙක් ළඟ සෙල්ලම් බඩු වට්ටෙටම තියෙනවා. ඒ ළමය ඒව අරගෙන සෙල්ලම් කරනවා, විසි කරනවා, නැවත තියනවා, නොයෙක් දේවල් කරනවා. කිසි ගානක් නෑ. හැබැයි ළමය බලාගෙන ඉඳෙද්දි කවුරුහරි ඒ සෙල්ලම් බඩුවක් ඈතට විසි කළොත් ඒ ළමය හයියෙන් කෑ ගහනවා, අඬනවා, ඒක ගන්න දුවනවා. එතනදි යම් කිසි වේගයක් පෙන්වනවා. ඒ වේගය පෙන්වන්නෙ ඒ සෙල්ලම් භාණ්ඩය නැවතත් ළඟට ගන්න. තමන් ළඟ තියේ නම් ඒ වේගය එන්නෙ නෑ. ඒක තමයි තණ්හාව උපාදානය කරගෙන ඉන්නව කියන්නෙ. තණ්හාවෙන් කරන්නෙ ඇලීම. උපාදානය කියන්නෙ බැඳීම. දණ්ඩ ගුරුත්වාකර්ෂණය නිසා පහළට වැටීමයි, බිමට වැටුනට පස්සෙ නැවතීමයි මේ දෙකෙන් පෙන්වනවා. හැබැයි මේ කිව්වෙ මැරෙන සියලුම අය ගැන නෙවෙයි.

එක්තරා මට්ටමකට මහ බලවත් පුණ්‍ය කුසල කර්ම කරල තිබ්බ්ච අයට ඒ වගේ තත්ත්වයක් එන්නෙ නෑ. ඒ අයට තමන්ගෙ මනස පාලනය කරල හිතූ හිතූ තැන්වලට යන්න පුළුවන්. උදාහරණ විදිහට බෝසතාණන් වහන්සේ තුසිත දෙව් ලොවින් චුත වෙලා මනුස්ස ලෝකෙට එනකොට, අහවල් මවු කුසටයි මම යන්නෙ කියල අධිෂ්ඨාන කරලත් ඉවරයි. ඒ වගේ කෙනෙක් අර සුළඟට අහුවෙච්ච පරඬැල වගේ යන්නෙ නෑ. හරියටම එල්ල කරපු තැනට යනවා. මොකද ඒ අයගෙ පුණ්‍ය ශක්තිය වැඩියි. සමහරවිට ඒ වගේ අයට තමන්ට තෝර ගන්න දෙව්ලොවයි බඹ ලොවයි දෙකම පේනවා. මේ වගේ අය බොහොම කලාතුරකින් ඉන්නේ. නමුත් බහුතරයක් ඉන්නෙ පිනක් දහමක් කරගන්නෙ නැතිව මෙලොවදි නිකන් කාල බීල වැටිල හිටපු අය. ඒ වගේ අය තමයි අර විදිහට අනාථ ගොඩේ ඉන්නෙ.

මේකට තවත් උදාහරණයක් ගත්තොත්, අපේ ඇහැට වැලි ☞

කැටයක් වැටෙන්න එනකොට ක්ෂණිකවම ඇස් පියවෙනවා. හැබැයි මේ සිද්ධිය වෙන්න යන්නෙ ඉතාම අල්ප කාලයයි. අපේ මනස දන්නවා, එතකොට ඇසිපිය ගහන්න ඕන කියල. මොකද ඇහැ ආරක්ෂා කරගන්න. ඒ වගේ යම්කිසි කෙනෙකුට මරණාසන්න මොහොතක් ක්ෂණයකින් ආවත්, හෙණ පාරක් වැදිල ආවත් ඒ ක්ෂණයෙන්ම ජීවත් වෙන්න හිත පිහිටිනවා. ඇහැ ආරක්ෂා කරන්න තියෙන බලාපොරොත්තුව යම් පමණකටද, ජීවිතය ආරක්ෂා කරගන්න ඒ වගේ සිය දහස් ගුණයක බලාපොරො-ත්තුවක් එනවා. ඒ නිසා තමයි කිණිහිර උඩ ඉන්න මැස්සෙකුට කොයි තරම් වේගයකින් මිටියකින් ගැහුවත්, ක්ෂණයකින් මැරිල ගියත් ඒ මොහොතෙදිම නැවත ජීවත් වෙන්න හිතක් පිහිටල ඉවරයි කියල පෙන්වා තියෙන්නෙ. මනුස්සයො ඇතුළු සියලු සත්ත්වයින්ගෙ ස්වභාවය ඒ වගේ. ජීවත් වීමේ ආසාව පළවෙනියි. රහත් වෙනකල්ම ඒ ජීවිත ආසාව ඉවර වෙන්නෙ නෑ.

එතකොට උඩ විසි කරපු දණ්ඩ මුලින් වැටීම කියන්නෙ මස් ලේ කයේ මරණයත් එක්ක මොහොතකින් චුති පටිසන්ධි ලබල නව කර්ම ශක්තියකින් නව භවයක් ආරම්භ කරපු අය. මැදින් වැටීම කියන්නෙ ඒ ගන්ධබ්බය හිටපු භවයෙන් මැදක් ගෙවල ඒ භවයට හිමි තවත් ඉතිරි කාලය ගෙවන්න මවු කුසකට ඇතුල් වීම. අගින් වැටෙනව කියන්නෙ ඒ භවයට හිමි අවසාන කාලය ගෙවන්න මවු කුසකට ඇතුල් වීම. ඒ කියන්නෙ ඒ කර්ම ශක්තියට හිමි අවසාන අත්බැව ගෙවන්න. මේ තුන් වෙනි අවස්ථාවෙදි ඒ අත්බවය ගෙවුනට පස්සෙ කවද හරි කර්මක්ඛය හෝ උභයක්ඛය මරණයක් තමයි එන්නෙ. හැබැයි ඒ කාරණය උපමාව තුළ තියෙනව මිසක් විග්‍රහ කරල නෑ. ඒක නැණ නුවණින් තේරුම් ගන්න ඕන.

දණ්ඩක් උඩ විසි කළාම උඩ රැඳෙන්න තැනක් නෑ. අහසෙ තියෙන්නෙ. ඒ නිසා තමයි උඩ ගිය ගිනි රොඩුව කුමක් උපාදාන කරගෙන පවතිනවද කියල ඇහුවම, සුළඟ උපාදාන කරගෙන පවතිනව කියල බුදුන් වහන්සේ දේශනා කළේ. ඒ වගේ සත්ත්වයා මළාට පස්සෙ මතු කයක උප්පත්තියට ගියේ නැත්නම්, ඒ අතරතුර තණ්හාව උපාදාන කරගෙන ජීවත් වෙනවා. එතකොට යමක් අල්ල ගෙන තියෙනව නම් ඒක වායුව වගේ බොහොම සියුම් දෙයක් මිසක් ඝනීභවන දෙයක් නෙවෙයි. බිම තියෙන දැල්වෙන ගින්න ඝනීභවන වෙච්ච දර උපාදාන කරගෙන පවතිනවා. එතනින් උඩට යන ගිනි රොඩුව සියුම් වායුව උපාදාන කරගෙන පවතිනවා. හැබැයි වායුවට පුළුවන්කමක් නෑ ගින්න එක තැන අල්ලගෙන හිටින්න. ඒ වගේ තමයි පරලොව. ඒක කොහෙද තියෙන්නෙ? මෙලොවින් පරලොවට, පරලොවින් මෙලොවට. එහෙනම් මෙලොව උපන් අයට ඒ පරලොව මොකක්ද? දෙවියො බ්‍රහ්මයො ඉන්නෙ පරලොවේද? මනුස්සයො ඉන්න තැන විතරද මෙලොව කියන්නෙ? ඒ නිසා සත්වයො මැරෙන කොට පරලොවට යන හැටි වෙන් කරල හඳුන ගන්න ඕන.

මේ කාරණය ඔප්පු වෙන වැදගත් තැනක් රතන සූත්‍රයේ තියෙනවා. යං කිංචි විත්තං ඉදවා හුරංවා සග්ගේසු වායං රතනං පණීතං. මෙතනදි ඉදවා, හුරංවා, සග්ගේසු කියන්නෙ කාරණා තුනක්. මෙලොව, පරලොව හෝ ස්වර්ගයේ හෝ යම් ප්‍රණීතයක් වූ රත්නයක් ඇත්ද, තථාගතයන් වහන්සේ හා සමාන තවත් රත්නයක් නෑ. බුදුන් වහන්සේගේ වටිනකම එතනින් පෙන්වනවා. එතකොට මෙතනදි ඉදවා කිව්වෙ මෙලොව. සග්ගේසු කිව්වෙ ස්වර්ගය. එහෙනම් මෙලොවයි ස්වර්ගයයි දෙක අතර හුරංවා තිබිය යුතුයි. මේ හුරංවා කිව්වෙ පරලොව හෙවත් එලොව. ස්වර්ගය කියන්නෙ පරලොව නෙවෙයි. ඒකත් මෙලොව වගේ තවත් ලෝකයක්. ඒ නිසා පරලොව කියන්නෙ දෙව්ලොව, බඹ ලොව ආදී වශයෙන් ගත්තොත්, එතකොට හුරංවා තියෙන්නෙ කොහෙද? කෙනෙකුට මෙලොවින් ස්වර්ගයට යන්නත් පුළුවන්. ස්වර්ගයෙන් මෙලොවට එන්නත් පුළුවන්. ස්වර්ගය කියන්නෙත්, මෙලොව කියන්නෙත් අත්බැව්. ස්වර්ගය කියන්නෙ දේව බ්‍රහ්ම අත්බැව්. මෙලොව කියන්නෙ මනුස්ස අත්බැව් හෝ සතර අපාගත අත්බැව්. එතකොට හුරංවා කිව්වෙ අන්තර් භවය හෙවත් පරලොව ඉන්න ගන්ධබ්බ අවස්ථාව. මේ කාරණා තුනෙන් පරලොව හොයා ගන්න පුළුවන්.

දණ්ඩ මුලින් බිමට වැටුනොත් ඒ දණ්ඩ නැවත උඩ විසි කළොත් මිසක් තව වතාවක් බිමට වැටෙන්නෙ නෑ. මැදින්, අගින් වැටුනත් ඒ වගෙයි. කොහේ හරි වැටුනට පස්සෙ නැවතත් වැටෙන්න නම් තව වතාවක් උඩ විසි කරන්න ඕන. එක පාරක් වැටුනම ඒක අල්ල ගත්තා. නැවතත් උඩ ගියොත් තමයි කොහේ හරි තැනක වැදිල අල්ල ගන්නෙ. ඒ වගේ සත්වයා මළොත් තමයි කර්ම ශක්තියෙන් මේ තුන් පොළින් කොයිකට හෝ එන්නෙ. මේ කයත් අත් හැරියම මතු කයකටත් ගියේ නැත්නම්, ඒ අතරතුර සත්වයා තණ්හාව උපාදාන කරගෙන ඉන්නව කිව්වෙ ඒකයි. මතු කය කිව්වම දෙවියන්ගෙ, බ්‍රහ්මයින්ගෙ කය මතු කයක් නෙවෙයිද? දෙවියන්ට බ්‍රහ්මයින්ට කයක් තියෙන බව පැහැදිලිවම සඳහන් කරල තියෙනවා. ඒ වගේ, වෙන කයකට ගියා නම් ඒ සත්ත්වයා ඒ කය තුළ ජීවත් වෙන්නෙ. එතකොට පරලොවක් නෑ. වෙන කයකටත් ගියේ නැත්නම්? මේ අහන්නෙ ඒ අතර කුමක් උපාදාන කරගෙන ජීවත් වෙනවද කියල. ඒක තමයි තණ්හාව කියල කිව්වෙ. ඊට පෙර උපමාව තමයි ගින්න පොලවෙදි දර උපාදාන කරගෙන පවතිනවයි කිව්වෙ. එතකොට උඩ ගිය ගිනි රොඩු වාතය උපාදාන කර ගෙන පවතින්නෙ. මේ කයත් අත් හැරල මතු කයකටත් ගියේ නැත්නම්, ඒ අතර තණ්හාව උපාදාන කරගෙන ඉන්න බව පැහැදිලිවම කියනවා. එහෙනම් මේ කයින් මතු පරලොව කියන්නෙ මොකක්ද? ඒක තමයි මේ කියන අන්තරාභවික අවස්ථාව. එතනදි තණ්හාව උපාදාන කරනව ඇරෙන්න වෙන අල්ලන්න දෙයක් නෑ. තණ්හාව කියන්නෙ අල්ලන දෙයක් නෙවෙයි. මානසිකත්වයක්. භෞතිකව යමක් අල්ල ගැනීමට තියෙන බලාපොරොත්තුවක්. ඒ තණ්හාවත් ඒ අවස්ථාවෙදි පූර්ණ වශයෙන් නිරෝධ කළොත් පවතින්න දෙයක් නෑ. ඒ නිසා තමයි පිරිනිවන් පාන්නෙ. ඒක තමයි අන්තරා පරිනිබ්බායී අවස්ථාව කියල පසු ගිය කලාපයෙන් පැහැදිලි කළේ.

එතකොට මේ ජීවත් වීමේ ආසාවට තමයි තණ්හාව කිව්වෙ. පරලොව හෙවත් අන්තරා භවයෙ ඉන්නෙත් මේ තණ්හාවෙන්. සත්වයා ජීවත් වීමේ ආසාව නිසා දැඩි බලාපොරොත්තුවක් ඇතිව ඉන්නවා. ජීවත් වෙන්නෙ මොකටද ? තමන් පෙර කරපු කියපු ටික තව දුරටත් කර කර ඉන්න. එහෙම නැතිව නිකං බුදියගෙන ඉන්න නෙවෙයි. පුද්ගලයාට ඕන කරන්නෙ අවදි වෙලා ඒ කරපු වැඩ පිළිවෙල කරගෙන ඉන්න. ඒක තමයි බලාපොරොත්තුව. යම්කිසි කෙනෙකුට ඉඳගෙන ඉඳල නැගිටින්න බැරි වුනොත් එහෙම මොන තරම් අසහනයක්ද ? මානසික වශයෙන් ලොකු වදයක් විඳින්න වෙනවා. ඊට පස්සෙ පුළුවන් තරම් උත්සාහ කරන්නෙ නැගිටින්න. එදා නැගිට්ට හැටියටම නැගිටින්න දැනුත් උත්සාහ කරනවා. බැරි වුනාම තමයි අඬන්නෙ, දුක් වෙන්නෙ. ඉස්සෙල්ලම කරන්නෙ උත්සාහ කිරීම. ඒ වගේ මේ ගන්ධබ්බ ලෝකෙට ගියාට පස්සෙ ඒ ගන්ධබ්බයා මස් ලේ කයින් කරපු වැඩ පිළිවෙල එහෙදිත් කරන්න උත්සාහ කරනවා. නමුත් උත්සාහ කළාට දැන් තියෙන සියුම් කයින්, අර කලින් ඝනීභවන දේවල් සම්බන්ධ කරගෙන ගෙනිච්ච වැඩ පිළිවෙල කරන්න බෑ. ඒක වෙනස් ක්‍රියාදාමයක්. නමුත් ගන්ධබ්බයට ඒක තේරෙන්නෙ නෑ. ඒ අත්දැකීම තවම ලබල නෑ. ඉස්සෙල්ල තිබිච්ච අත්දැකීම දැන්

තියෙන සූක්ෂම කයින් ක්‍රියාත්මක කරන්න බෑ, පරිවර්තනය වෙලා.

උදාහරණයක් ගත්තොත්, පුංචි කාලෙ සිංහල කතා කර කර හිටපු කෙනෙක් විදෙස් රටකට ගිහින් අවුරුදු 20 - 25 ක් විතර එහේ හිටියොත් ඒ රටේ භාෂාව හොඳට පුරුදුයි. එහේදී සිංහල භාෂාව කතා කරන්න අවස්ථාව ලැබුනෙ නෑ කියල හිතුවොත් සහ නැවතත් ලංකාවට ආවොත්, ඒ පුද්ගලයට එක පාරටම සිංහල කතා කරන්න බෑ. කොච්චරවත් එන්නෙ එහේ වචන, ක්‍රියා කලාප. මෙහේ වචන මතක් කර ගන්න දඟලන්න ඕන. ඊට පස්සෙ ඒ භාෂාවෙන් මෙහෙ කතා කරන්න බැරි බව දැන ගන්නවා. දැන් ඒක හරි අසහනයක්. ඊට පස්සෙ මෙහේ භාෂාවට නැවතත් ටික ටික හුරු වෙනවා. පැරණි වචන මතකයට ගන්නවා. ඒවා භාවිතාවට ගන්නවා. එතකොට ඒ පුද්ගලය කලින් තිබිච්ච ක්‍රියා කලාපය ක්‍රමයෙන් දීන කරනවා.

ගන්ධබ්බයගෙ පළවෙනි දවස කියන්නෙත් මේ වගෙයි. ඒක තමයි රවි දවස හෙවත් ඉරිදා කියන්නෙ. ක්‍රියාකාරීත්වය තමයි ඒකෙන් පෙන්වන්නෙ. ඒ මුළු දවසෙම ගන්ධබ්බයා පෙර කරපු මොනව හරි ක්‍රියාවක් කරන්න උත්සාහ කරනවා. උදාහරණ විදියට කලින් ජීවිතයේ පුරුද්දට වතුර බොන්න කෝප්පය අතින් අල්ලන්න පුළුවන්. නමුත් ඝනීභවන කෝප්පය දැන් තියෙන සියුම් කිරණමය අතින් අල්ලන්න බෑ. ළිඳට ගිහින් වතුර එකක් අදින්න බලනවා. නමුත් අහු වෙන්නෙ නෑ. කලින් ජීවිතයෙ තමන් වාහනයක් පදවමින් හිටිය නම් දැනුත් වාහනයේ සුක්කානම කරකවන්න බලනවා. නමුත් ඒක කරන්න බෑ. මේ වගේ ඒ දවස ඇතුළත මොනව හරි ක්‍රියා කරන්න පුළුවන්ද කියල අත්හදා බලනවා. මේ කියන්නෙ මිනිස් ලොවේ දවසක්. අන්තිමට ඒ දවසෙ අත්දැකීමක් ලබනවා, දැන් පෙර කරපු ඒ ක්‍රියා එකක්වත් කරන්න බෑ කියල. ඒක දැනගත්තට පස්සෙ එන්නෙ සඳු දිනය.

දැන් ගන්ධබ්බය කැමතියි පෙර වැඩ ටික කරන්න. හැබැයි කැමති වුනාට ඒව එකක්වත් කරන්න බෑ කියල අත්දැකීමක් ලැබිල තියෙනවා. මට දැන් එහෙම කරන්න බැනෙ! කැමැත්ත තිබුනට කරන්න බෑ. කැමැත්තක් ආවට ඒ අවස්ථාව ඉක්ම යන්නෙ නෑ. ඒ කියන්නෙ කලින් දවසෙ වගේ ක්‍රියා කරන්න දඟලන්නෙ නෑ. මොකද කැමති වුනාට වැඩක් නෑ, උත්සාහ කිරීම නිෂ්ඵලයි කියල දැනගත්තා. උදාහරණ විදියට මනුස්සයෙක් කොහේ හරි කාමරයකට දාල කොටු කළොත්, දැන් ඒ මනුස්සය අඩි බිඩි ගාල එහෙ මෙහෙ දුවනවා, දොරවල් කඩන්න හදනවා, පෙරලන්න හදනවා, එළියට පනින්න අරකට තට්ටු කරනවා මේකට තට්ටු කරනවා, උඩ පනිනවා, පනින්න තැන් හොයනවා. ඒ තමයි පළවෙනි දවස හෙවත් රවි දවස කිව්වෙ.

ඊට පස්සෙ බැරිම තැන කොතැනකට හරි වෙලා ඉඳගෙන කල්පනා කරනවා. ''මම මෙහෙම කරල බැලුවා, ගේ දොර කඩන්නත් බෑ, හොල්ලල බැලුවා ඒත් බෑ. ජනේලයකින් පනින්න බැලුවා ඒකත් වහල. මට තනියෙන් ඇර ගන්නත් බෑ, වහල දිහා බැලුවම සිවිලිම ගහල, ඒකෙන් පනින්න විදියකුත් නෑ.'' දැන් පුද්ගලය වෙච්ච දේවල් ගැන හිතනවා. මුළු දවසක් තිස්සෙ කරපු ඒවායින් මට පැන ගන්න බැරි වුනානෙ! මේ වගේ තමයි ගන්ධබ්බයගෙ දෙවැනි දවස හෙවත් සඳු දිනය. සඳු පටන් ගන්නකොට රවි දීන වෙනවා. සඳු කියන්නෙ හිතට අධිපති හෙවත් කැමැත්ත. මම මෙහෙම බැලුවා, ඒත් එකක්වත් කරගන්න බැරි වුනානෙ. ඕක තමයි මුළු දවස තුලම හිතන්නෙ. ඒ තමයි රවි දීන වුනාට පස්සෙ එන සඳුගේ ස්වභාවය. ඒ කියන්නෙ ඒ ගන්ධබ්බයට කලින් විදියටම ජීවත් වෙන්න කැමැත්තක් තිබුනත්, දැන් තමයි ඒක බැහැ කියල අත් දැකීම ලබන්නෙ. අත්දැකීම ලැබුවට පස්සෙ කාරණා 2 ක් සිද්ධ වෙනවා. එකක් බැරි නිසා ක්‍රියාව අත හැරිල යනවා. දැන් ඒ ගැන හිතුවට වැඩකුත් නෑ. ඒ නිසා දෙවෙනියට ඒ අදහසත් අත් හරිනවා.

ඊළඟට සඳු දීන වෙලා තුන්වෙනියට එන කුජ දවසෙදි මේ ගන්ධබ්බයගෙ හිතට තරහක් එනවා, වේගයක් එනවා. හරි වැඩේ මට වුණේ! මම දැන් මොනවද කරන්නෙ? දැන් හිත පෑරෙන්න පටන් ගන්නවා. පිස්සුවකින් වගේ දඟලනවා. ඒක තමයි කුජගෙ ස්වභාවය. කුජ සටන්කාමීයි කියන්නෙත් ඒකයි. තව වතාවක් ගිහින් උත්සාහ කරල සටන් කරල බලනවා. ගන්ධබ්බයගෙ මේ තුන් වෙනි දවස හරි භයානකයි. පළවෙනි දවසෙ උත්සාහ කළා බැරි වුණා, දෙවෙනි දවසෙ හිතල බැලුවා, තුන් වෙනි දවසෙ සටන්කාමීත්වයට බහිනවා. බැහැල බොහොම තදින් ක්‍රියාත්මක වෙන්න බලනවා. සමහර විට මේ තුන්වෙනි දවස වෙන කොට ගන්ධබ්බය ඇවිත් ගෙවල් දොරවල්වලට ගහනව ඇහෙන්න පුළුවන්. දොරවල් අරින්න උත්සාහ කරන්න පුළුවන්. විවිධ සද්ද බද්ද කරන්න පුළුවන්. මොකද හේතුව කුජ ක්‍රියාකාරීත්වය. ඒ ක්‍රියාකාරීත්වයෙන් උත්සාහ කළත් දැන් මොනවත් කරන්න බෑ.

ඊළඟට කුජ දීන වෙලා එන බුධ දවස හෙවත් හතර වෙනි දවසෙදි පොඩි ළමයෙක්ගෙ තත්ත්වයට මානසිකත්වය පත් වෙනවා. දැන් ඒ ලෝකෙට ගැලපෙන විදියට හැසිරෙන්න බලනවා. මට ඒ ලෝකෙ කවුරුවත් නැනෙ, මේ ලෝකෙ කවුද ඉන්නෙ කියල බලනවා. මොකද පොඩි එකෙක් හැම වෙලේම කාගෙ හරි ආධාරයක් උපකාරයක් බලනවා. අන්න ඒ වගේ තත්ත්වයකට මේ ගන්ධබ්බයත් එනවා. ඒ තමයි බුධගෙ ස්වභාවය. දැන් ඉස්සෙල්ල තිබිච්ච සටන්කාමී ගතිය අඩු වෙලා පොඩි ළමයෙක්ගෙ තත්ත්වයට වැටෙනවා. එක පැත්තකින් කුජ දීන වෙනවා. තවත් පැත්තකින් බුධ ආරම්භ වෙනවා. ඉතින් මේ හතරවෙනි දවස හෙවත් බුධ දවස ඇතුළත ඒ ගන්ධබ්බයා ඒ ලෝකෙට ගැලපෙන යම්කිසි ඉගෙනීමක් ලබනවා. හරියට පොඩි එකෙක් වගේ. ඊට පස්සෙ මෙච්චර කලක් කරපු කියපු ඒව පිළිබඳ මතකය දීන කරල අලුත් දේකට නැඹුරු වෙනවා.

ඊළඟට පස් වෙනි දවස තමයි බුධ දීන වෙලා එන ගුරු දිනය. ඒ කියන්නෙ ගුරුහරුකම් ලබනවා, ඒ ලෝකෙට හොඳ හයිහත්තියක් ලබනවා. ඒකෙන් ශක්තිමත් වෙලා ඒ ලෝකෙට නැඹුරු වෙනවා. ගුරුගෙ ස්වභාවය තමයි ඉගෙන ගත් දේ ක්‍රියාත්මක කිරීම, ශක්තිමත් වීම. ඒ අනුව ඒ ලෝකෙට අවශ්‍ය කරන විදියට දැන් මේ ගන්ධබ්බයා කටයුතු කරනවා. ඒ පිළිබඳව දැන ගන්නවා. ඉස්සෙල්ල කරපු කියපු කටයුතු වැඩක්ම නෑ, දැන් අලුත් ක්‍රමයක් තියේද කියල බලනවා. ගුරුහරුකම් වර්ධනය වෙනවා. මෙච්චර කලක් මස් ලේ කයින් ගත්තු ගුරු හරුකම් පැත්තකට දාල, දැන් අලුත් ලෝකෙට ආවට පස්සෙ ඒ ලෝකෙට ඉගෙන ගත්තු දේවල් අත්හදා බලනවා.

ඊළඟට හය වෙනි දවස තමයි කිවි දවස හෙවත් සිකුරාදා කියන්නෙ. එදාට, අල්ලගත්තු අලුත් ලෝකය නිසා සතුටක් එනවා. අලුත් ක්‍රමය අහු වෙච්ච නිසා තමයි සතුටු වෙන්නෙ. කලින් අල්ලගත්තු ඒව නැති වුනාට දැන් අලුත් ක්‍රමයක් තියෙන නිසා හිතට බයක් නෑ. එතකොට කලින් දේවල් අතහැරීම ගැනත්, අලුත් දෙයක් ලැබීම ගැනත් සතුටක් එනවා. ඒ ගන්ධබ්බ ලෝකෙ ඉන්න අනිත් ගන්ධබ්බයොත් එක්ක බොහොම සතුටු සාමීච්යේ ගත කරනවා.

ඊළඟට අලුත් ක්‍රමයට නැඹුරු වෙන කොට පරණ ක්‍රමය වැඩක් නෑ කියල දකිනවා. ඒක අත්හැරලම දානවා. දැන් අලුත් ලෝකෙට නැඹුරු වෙලා සන්තෝස වෙලා පරණ ජීවිතයෙන් අහක් වෙලා අලුත් ජීවිතයක් ආරම්භ කිරීම හත් වෙනි

දවසෙදි ශනි දිනයෙන් පටන් ගන්නවා. එතකොට කිවි දීන වෙනවා. කලින් ඒවාට මොනව වුනත් කමක් නෑ කියල ඒව එළියට අත හැරල දානවා, මකල දානවා. දැන් ඒව වැඩක් නැති බව දන්නවා. ඒව හෙණ ගැහුව වගේ අකල මකල දානවා. ඒක තමයි ශනි කිව්වෙ. මේ දවස ඉවර වෙන කොට ඒ මියගිය කෙනාට දානෙ දීල පින් අනුමෝදන් කරල අවශ්‍ය පෝෂණ පදාර්ථ ලබා දුන්නම, ඒක ගන්න පුළුවන් තැනක ඒ ගන්ධබ්බය ඉන්නව නම් අටවෙනි දවසෙ ඉඳන් ඒ ලෝකෙ අළුත් ජීවිතයට පූර්ණ වශයෙන් බහිනවා. දැන් කියන බණක් වුනත් අහන්න පුළුවන්.

එතකොට කෙනෙක් මියගියාම ඉස්සර මේ හත් දවසෙ දානෙ දෙන ක්‍රමයක් තිබුණා. එතනදි ඒ පුද්ගලයා යම් දිනයක මියගියානම් එතැන් පටන් හත් දවසක් ඇරල අටවෙනි දවසෙ ඥාති බත දීල බණ කියනවා. උදාහරණ විදිහට පුද්ගලයා රවි දවසෙ මියගියා නම්, ඊළඟ සතියෙ සඳු දවසෙ දවල් ඥාති බත දීල එදා රෑට බණ කියනවා. මෙතනදි ඉස්සෙල්ලම වැදගත් වෙන්නෙ ඥාති බත දීම. මොකද ඒකෙන් තමයි ගන්ධබ්බයට පෝෂණය එන්නෙ. එතකොට හරි විදිහට අට වෙනි දවසෙ තමයි ඒ වැඩේ කරන්න ඕන. මොකද දින හතක් යනකල් ඒ ලෝකෙට හැඩගැහෙන්න ඕන. හත්වෙනි දවස පූර්ණ වශයෙන් ඉවර වුනාට පස්සෙ තමයි සුදුසු මානසිකත්වයට එන්නෙ. මේ දින හත හරියට ගනින්න නම් ඒ පුද්ගලය මියගිය වෙලාවෙ ඉඳන් පැය 24 බැගින් දවස් හතක් සම්පූර්ණ වෙන්න ඕන. ඊට පස්සෙ තමයි හත් දවසෙ ඥාති බත දීල බණ කියන්නෙ. උදාහරණ විදිහට පුද්ගලය ඉරිද හැන්දෑවෙ හයට මියගියානම් දින හතක් සම්පූර්ණ වෙන්නෙ ඊළඟ සතියෙ ඉරිද හැන්දෑවෙ හයට. අවශ්‍ය නම් ඒ ඉරිද හයෙන් පස්සෙ රෑ හතට/අටට ඥාති බත දීල බණ කියන්න පුළුවන්. නැත්නම් ඊට පහුවදා ඒක කරන්නත් පුළුවන්. උදේ දවල් හැන්දෑවෙ කොයි වෙලේ කළත් ගැටළුවක් නෑ. හැබැයි හත්වෙනි දවස සම්පූර්ණ වෙලා ඊළඟ පැය 24 ගත වෙන්න පෙර ඥාති බත දෙන්න ඕන. මොකද ඒ අවස්ථාවෙදි තමයි ගන්ධබ්බයට ඒකට අවශ්‍ය මානසිකත්වය ලැබිල පෝෂණය අවශ්‍ය වෙන්නෙ. නමුත් මේ කාරණය අද පටලවාගෙන දවස් හතක් යන්නත් කලින් ඥාති බත දීල බණ කියනවා. ඒ වගේම මැතකදී හදාගත් මතයකට අනුව සමහරු ඥාති බත නොදීත් බණ කියනවා. එතකොට ගන්ධබ්බය තවමත් ඒක ගන්න, ඒ බණ අහන්න පුළුවන් සුදුසු මානසිකත්වයකට ඇවිත් නෑ.

දැන් මෙතනදි දීන වෙනවයි කියන්නෙ ගෙවී ගෙවී යනවයි කියන එක. ඒ විදියට ගෙවී ගෙවී දීන 7 ක් යන එක තමයි දින 7 ක් කියන්නෙ. මේ දින හතෙන් කියන්නෙ ඒ ගන්ධබ්බයගෙ හැසිරීමේ ලක්ෂණ. ඒ ලක්ෂණ හත මුල්කරගෙන තමයි මේ දින හත මේ විදිහට හැදිල තියෙන්නෙ. ඒ දින හත කියන්නෙ අපි මේ ලෝකෙ කියන දින හතම නෙවෙයි. උදාහරණ විදිහට ගන්ධබ්බයගෙ රවි දිනය අපේ මනුස්ස ලෝකෙ සඳු දිනයක් වෙන්න පුළුවන්. මොකද මැරෙන හැමෝම රවි දිනේම මැරෙන්න නෑ. විවිධ දවස්වල මැරෙනවා. රවි කියන්නෙ මුළු ලෝකෙටම එළිය දෙන සූර්යා. අන්න ඒ සූර්යාගේ ක්‍රියාකාරීත්වය උපමා කරල තමයි ගන්ධබ්බයගෙ මේ ක්‍රියාකාරීත්වයට රවි දිනය කියල සම්මත කරගෙන තියෙන්නෙ.

ඉස්සෙල්ලම තත්... තත්... කියන්නෙ ඒ ඒ මොහොත. පරය යනවයි කියන්නෙ ගෙවී ගෙවී යනවා. තත්පරය කියල කියන්නෙ ඒ ඒ මොහොත ගෙවිල යනවයි කියන එක. එහෙම ගිහින් ඊළඟට හද ගැස්මක් එනවා. නාඩි කියන්නෙ හද ගැස්ම. ඒක එන්නෙ ගන්ධබ්බයගෙ කර්මජ



කයට. නාඩියක් වුනයි කියන එක තමයි වී නාඩි - විනාඩි කියන්නෙ. එතකොට විනාඩියක් යනවා. ඒ කියන්නෙ පුද්ගලය හිටපු තත්ත්වයෙන් වැනසිලා තවත් පියවරක් ඉස්සරහට තියනවා. යම්කිසි අලුත් අවබෝධයක් ලබනවා. හිටපු අවස්ථාවෙන් ගෙවිල ගියා. හැබැයි මේ විනාඩිය කියන්නෙ දැන් තියෙන ඉංග්‍රීසි විනාඩිය නෙවෙයි. අපේ තිබ්බ්ච සිංහල විනාඩියක්. ඉංග්‍රීසි විනාඩි දෙකහමාරක් සිංහල විනාඩි එකයි.

ඊළඟට දැන් නම් ටික ටික හරියන පාටයි කියල අපි කතාවටත් කියනවා. මේ පාටක් කියන්නෙ පැහැයක්. ඒක තමයි පැයක් කියන්නෙ. පැහැයක් හෙවත් පැයක් වුණා. ඒ විදිහට පාටින් පාටට ගිහින් තමයි අන්තිමට දීන එකක් හෙවත් දින 1 ක් වෙන්නෙ. එහෙම දීන 7 ක් ගියාම නව ශක්තියක් ආරම්භ කරනවා. අන්න ඒ නව ශක්තිය තමයි සතිය කිව්වෙ. සක්තිය එකක් සති එකයි. ගන්ධබ්බයට ඒ ලෝකෙට පරිවර්තනය වෙන්න දින 7 ක් හෙවත් සති 1 ක් යනව කිව්වෙ ඒකයි.

එහෙම දින 30 ක් යන කොට මහ අංසයක් බවට පත් වෙනවා. ඒ පැත්තෙ අංසය මහත් කර ගන්නවා. ඒ කියන්නෙ යම් කිසි විදිහකින් ඒ ගන්ධබ්බය උස් මහත් වෙලා මෝරනවා. ඒක තමයි මාංසය හෙවත් මාසයක් කියන්නෙ. මාංස එකක් මාස එකයි. ඊළඟට මාංස තුනක් ගියාම තුන් මාසයක් එනවා. ඒ කියන්නෙ ඒ ගන්ධබ්බයට දරා ගෙන ඉන්න පුළුවන් තැනට ආවයි කියන එක. එකින් එකට ස්වෛරීයව නැගී හිටින්න පුළුවන් තැනට ආවා. දැන් කකුල් 3 කින් හිටින්න පුළුවන්. දෙකකින් යන්න පුළුවන් වුනාට හිටින්න අමාරුයි. බයිසිකලයක් වුනත් රෝද දෙකෙන් ගමන් කරන්න පුළුවන් වුනාට එක තැන නැවැත්තුවොත් පෙරළෙනවා. ඒ වගේ අවස්ථාවක්. දැන් කෙනෙක් අහන්න පුළුවන්, ඇයි කකුල් දෙකෙන් හිටගෙන ඉන්න බැරිද කියල. කෙනෙක් කකුල් දෙකෙන් හිටගෙන ඉන්න කොට පොඩ්ඩක් සෝදිසි කරල බැලුවොත් මොකද වෙන්නෙ කියල, එක්කො කොතැනකට හරි හේත්තු වෙන්න බලනවා. එහෙම නැත්නම් මොකක් හරි අල්ල ගන්න බලනවා. මොකද තුන්වෙනි කකුලක් නැති නිසා වෙනත් ක්‍රමයකින් ඒක ලබන්න බලනවා. ටික වෙලාවක් යනකොට කකුල් එහෙට මෙහෙට කරනවා, ඉරියව් වෙනස් කරනවා. හැරමිටියක් වගේ මොකකට හරි බර දෙනවා. ඒ කියන්නෙ කකුල් දෙකට බර දීල වැඩි වෙලාවක් ඉන්න බෑ. ඒ නිසා එක තැන ඉන්න නම් තුන්වෙනි ආධාරකයක් තියෙන්න ඕන. ඒ නිසා ඒ පුද්ගලයා එක්කො ඉඳගන්නවා. එහෙම නැත්නම් කකුල් දෙක බිම දිගා කරල වාඩි වෙලා හේත්තු වෙනවා. මේ වගේ මොනව හරි උපක්‍රමයක් පාවිච්චි කරනවා.

මෙන්න මේ වගේ දෙයක් මෙතනදිත් සිද්ධ වෙනවා. ඒ නිසා තමයි තුන් මාසයක් ගියාම තුන් මාසෙ දානෙ කියල තවත් දානයක් දෙන්නෙ. ඒ තවත් අවස්ථාවක්. තුන් මාසයක් කියන්නෙ ඒ ගන්ධබ්බ ලෝකයේ සැරි සරන තත්ත්වයට අනුකූලව තුන් පොළකින් දරා හිටින්න පුළුවන් අවස්ථාවක්. තුන් මාසෙ දානෙ දුන්නට පස්සෙ යම්කිසි තැනක පැළ පදියම් වෙලා තනියෙන් පෝෂණය ලබන්න පුළුවන් මට්ටමක් එනවා. හැබැයි තවම දුබලයි. නමුත් කෙලින් ඉන්න පුළුවන් තත්ත්වයක්. ඔහොම ගිහින් ඔය තත්ත්වය පූර්ණ වෙලා මාස 12 ක් ගියාට පස්සෙ වෘත්ත 1 ක් හැදෙනවා. දැන් ගන්ධබ්බය ඒ ලෝකෙට වැඩිමහල්ලෙක් වුණා. ඒක තමයි අවුරුද්දක් කියන්නෙ. අවුරුද්දෙ දානෙ දෙන්නෙ වැඩිමහල්

වුණාම. එහෙනම් දැන් ඒ ගන්ධබ්බයට අනිත් අයට උපදෙස් දෙන්න පුළුවන්. අනිත් අයව මෙහෙය වන්න පුළුවන්. තත්පරයෙන් පටන් ගෙන මේ විදියට යන ක්‍රමයක් තියෙනවා. හැබැයි මේ විග්‍රහය පොත්වල නෑ.

කෙනෙක් මියගිහින් මේ වගේ ගන්ධබ්බ අවස්ථාවක ඉන්නව නම්, දින 7 ක් යන්න පෙර දානෙ දුන්නට ඒ ගන්ධබ්බයට ඒක ගන්න නිච්චියක් නෑ. මොකද දවස් 7 ක් යන කල්, වෙන වැඩ පිළිවෙලක ඉන්නෙ. ඉතින් මේ හත් දවසෙ දානෙ දෙන සම්ප්‍රදාය නිකං ආවට ගියාට හදාගත්තු එකක් නෙවෙයි. හේතු ඇතිවම හදා ගත්තු එකක්. ඒ වගේම ඉස්සර පටන් තිබිච්ච ක්‍රමයක්. හැබැයි ඒ කාරණය කියල දෙන්න ලොවුතුරා බුදුවරුම ඕන නෑ. ඍෂිවරුන්ටත් ඒක පේනවා. උදාහරණයක් විදියට අන්වීක්ෂයකින් බලන්න විශේෂඥයො ඕන වුනාට මස් ලේ ඇස් දෙකට ගෝචර වෙන දෙයක් බලන්න විශේෂඥයො ඕන නෑ. ඇස් දෙකින් ගහක කොස් දෙල් ඉදිලද කියල බලන්න පුළුවන්කම තියෙද්දී ඒකට විශේෂඥයො ගෙන්වන්න ඕන නෑ. විශේෂඥයො ඒ වගේ දේකට එන්නෙත් නෑ. හැබැයි වතුරෙ ක්ෂුද්‍ර ජීවීන් ඉන්නවද කියල බලන්න කිව්වොත් විශේෂඥයො එනවා. මොකද ඒක සාමාන්‍ය කෙනෙකුට ඇස් දෙකින් බලාගන්න බැරි නිසා, ගෝචර කරගන්න බැරි නිසා. මේ වගේ ඍෂිවරුන්ට පේන කොටසක් තියෙනවා. ඒක කියන්න ලොවුතුරා බුදුවරු ඕන නෑ. මේ දින 7 ක කතාවත් ඍෂිවරුන්ට පේනවා. ඒ නිසා හත් දවසෙ දානෙ දෙන්න කියල බුදුන් වහන්සේ වෙනම දේශනා කළේ නෑ. ඒක හරියට ගහේ කොස් දෙල් පැහිලද බලන්න විශේෂඥයො ගෙන්වන්න ඕන නෑ වගේ.

නමුත් ඉතින් ඕක සාමාන්‍ය අයට තේරෙන්නෙ නෑ. බුදුන් වහන්සේ කොතැනද ඕක කියල තියෙන්නෙ කියල සමහරු අහනවා. උන් වහන්සේ දේශනා කරල තියෙන්නෙ අනිත් අයට මුලින්ම දේශනා කරන්න බැරි, තනියෙන් තේරුම් ගන්න බැරි කොටස්. සර්වඥ ගෝචර වෙලා ශ්‍රාවකයන්ටත් ගෝචර වෙන මට්ටමේ ඒව තමයි උන් වහන්සේ දේශනා කළේ. ශ්‍රාවකයන්ට තනියෙන් ගෝචර කර ගන්න පුළුවන් ඒවා දේශනා කරන්න ගියේ නෑ. ඒකට කාලය නාස්ති කළේ නෑ. එතකොට කෙනෙකුට ගැටළුවක් එන්න පුළුවන් එහෙනම් ජානුස්සෝනීය සූත්‍රයේදී මේ පෙරේත තටුව දීල දෙන දානෙ ගැන දේශනා කරල තියෙන්නෙ බුදුන් වහන්සේ නෙවෙයිද කියල. එතනදී ජානුස්සෝනීය බමුණ අහපු ප්‍රශ්නයකට තමයි උන්වහන්සේ උත්තර දුන්නෙ. ඒ කියන්නෙ ඒ බමුණ මෙච්චර කාලයක් තිස්සෙ මේ වගේ ඥාති දානයක් දීගෙන ආවා. අන්න ඒ දානෙ ගන්න මියගිය අය එනවද කියල තමයි බුදුන් වහන්සේගෙන් ඇහුවෙ. එතකොට උන්වහන්සේ කියනවා ස්ථානයේ ගනී, අස්ථානයේ නොගනී කියල. එහෙම කියල ඒ දාන ක්‍රමය අනුමත කළා. ඒක මිත්‍යාවක් නෙවෙයි කියල පෙන්නුවා.

ඉතින් කෙනෙක් මළාට පස්සෙ ගන්ධබ්බයා මුල් දින 7 ගත කරන්නෙ හරියට කරකවල අතහැරිය කෙනෙක් වගේ. මේ දින 7 ක ක්‍රියාවලිය කෙටි වෙච්ච අවස්ථා වගේම දිග වෙච්ච අවස්ථාත් තියෙනවා. ඒක විවිධාකාරයි. සාමාන්‍ය ක්‍රමවේදය තමයි මේ දින 7 සම්බන්ධයෙන් පැහැදිලි කළේ. නමුත් ක්ෂණික වෙලාවකත් ඔය සිද්ධිය වෙනවා. ජාති, සංජාති, ඔක්කන්ති වෙන කොට ඔය සිද්ධිය වෙලා ඉවරයි. බ්‍රහ්ම අත්බැවකට ගියත් මුලින්ම මේ වගේ ස්වභාවයක් එනවා. උදාහරණ විදිහට ඒ කාලෙ හිටපු අනාගාමී කෙනෙක් මැරිල චුත වෙලා අවිහ බඹ ලොව ඉපදුනා. ඇයි නැවත ඉපදෙන්න හේතුව කියල හොයල බලල එවෙලෙම බුදුන් වහන්සේ හමුවෙන්න මනුස්ස ලෝකෙට ඇවිත් ඉඳගන්න බැරිව වැක්කෙරෙන ශරීරයකින් හිටියා. මොකද බ්‍රහ්ම ශරීරයෙන් මේ ලෝකෙ ඉන්න බෑ. ඒ වෙලාවෙදී බුදුන් වහන්සේ උපදෙසක් දුන්නා බ්‍රහ්මය ඕලාරික (ඝනීභවන) කයක් මවාගන්න කියල. ඊට පස්සෙ තමයි මේ ලෝකෙට ගැලපෙන ඝනීභවන කයක් මවාගෙන බුදුන් වහන්සේට නමස්කාර කරල පැත්තකට වෙලා ඉඳගෙන විස්තරය කිව්වෙ.

එතකොට මේ ඉතාම සුළු මොහොතක් තුළ වෙච්ච දිගු ක්‍රියාදාමයක්. ඒ වෙලාවෙත් මේ චක්‍රය ක්ෂණයකින් ක්‍රියාත්මක වුණා. හරියට අර දින හතක් වගේ. උදාහරණ විදිහට බුදුන් වහන්සේ ඒ බ්‍රහ්මයට උපදෙස් දීම ගුරු දිනය වගේ. ඊළඟට ගුරු දීන වුනාට පස්සෙ තමයි ඒ ක්‍රමය සතුටින් භාරගෙන ඕලාරික කයකින් ඉඳගත්තෙ. ඒ හැකියාව ලැබුනම සතුටු වෙලා සිකුරු පටන් ගත්තා. ඊළඟට ශනි දවස ලබන කොට, කලින් ජීවිතයේ බලාපොරොත්තු අත්හැරල නව ජීවිතය ප්‍රකෘතිමත් වුණා. පැරණි අදහස් ගෙවිල අලුත් ජීවිතය ආරම්භ වුණා. මණ්ඩූක දිව්‍ය පුත්‍රයට වුනෙත් මේ වගේ දෙයක්.

මේ හැම එකක්ම එක වගේ ක්‍රම රටාවකට තමයි ක්‍රියාත්මක වෙන්නෙ. එතනදිත් කුඩා චක්‍ර, මධ්‍යම චක්‍ර, මහා චක්‍ර, මහ විසාල චක්‍ර ආදී වශයෙන් තියෙනවා. පරමාණුවක් ගත්තත් ඒකත් කැරකෙනවා. පරමාණු එකතු වෙච්ච පොදියත් කැරකෙනවා. පරමාණු පොදිවලින් හට ගත්තු ජීවත් කැරකෙනවා. ඒ මදිවට සක්වලත් කැරකෙනවා. එක රටාවකට මේ වගේ පොඩි පොඩි අවස්ථාවෙන් පටන් ගෙන ලොකු ලොකු අවස්ථාවන්ට යනකල්ම කැරකෙනවා. ඒ චක්‍ර විවිධාකාර පැතිකඩවල් ඔස්සේ කැරකෙනවා. පටිච්ච සමුප්පාද චක්‍රයත් ඒ වගෙයි. එක චිත්තක්ෂණයකත්, චිත්ත වීථියකත් මේ චක්‍ර කැරකෙනවා. යම් කිසි සම්මත කරගත්තු අවස්ථාවකත් චක්‍ර කැරකෙනවා. ජීවිත කාලයේමත් චක්‍ර කැරකෙනවා. ජීවිත කාල කිහිපයක් එකතු කළාමත් චක්‍ර කැරකෙනවා. නමුත් ක්‍රම රටාව ඕකයි.

දැන් එතකොට මේ කිව්වෙ කෙනෙක් මැරිල ගිහින් විශේෂයෙන් චුති පටිසන්ධි නොවී ඒ භවයෙම ඉඳගෙන, කලින් හිටපු මිනිස් ස්වභාවයෙන්ම ඉන්න ගන්ධබ්බයින්ගෙ මුල් දින 7 පිළිබඳව. හැබැයි ඒ වගේ කෙනෙකුට දින හතෙන් දෙන දානය ඒ අය විතරක් නෙවෙයි, තවත් අය ගන්න බලාගෙන ඉන්නවා. ඒ කියන්නෙ සමහර ගන්ධබ්බයො ඉන්නව කාලයක් තිස්සෙ පැරදිලා අනාථ වෙලා. ඒ වගේ අයට ඒ අයගෙ මුල් දින 7 ගියයි කියල කරගන්න දේකුත් නෑ. එහෙම දෙයක් කර ගන්න හේතු යෙදිලත් නෑ. ඒ නිසා ඒ ලෝකයට අවශ්‍ය විදියට වැඩෙන්න, පෝෂණය සපය ගන්න විදියකුත් නෑ. උදාහරණ විදියට යම් කිසි තරුණයෙක් ඉන්නවා. ඉගෙන ගත්තෙත් නෑ. නිකම්ම තරුණ වුණා. රැකියාව කරන්න හැකියාව තිබුණත් රැකියාවක් නෑ. ජීවත් වෙන්න ක්‍රමයක් නෑ. ඒ වගේම පොඩි කාලෙ ඉඳන් ඉගෙන ගත්තු අය ඉන්නවා. ඒ අය තරුණ බවට පත් වෙන කොට අවශ්‍ය සියල්ලම ලැබිල රස්සාවකුත් කරනවා. දැන් ඒ පුද්ගලයට යැපෙන්න අනුන්ගෙන් උදව් ඕන නෑ. හැබැයි උදව් ඕන අර වගේ තවත් විසාල පිරිසක් ඉන්නවා. මොකද ඒ අයට හැකියාවක් නෑ. හැකියාවක් තියෙන තත්ත්වෙට ආවත් ඒ අයට ලැබීමක් නෑ, රස්සාවක් නෑ. ඉගෙන ගත්තෙ නෑ. කරන්න කියන්න දෙයක් නෑ. කවුරු හරි තමන්ට මොනව හරි දෙනකල් නිකමෙක් වගේ බලාගෙන ඉන්නවා.

මෙන්න මෙහෙම කොටස් ගන්ධබ්බයො අතරත් හරියට ඉන්නවා. ඒ නිසා තමයි බුදුන් වහන්සේ පෙන්වා දුන්නෙ, මියගිය කෙනෙකුට දෙන ඥාති බත ගන්න ඒ පුද්ගලයා නාවොත්, ඒකට තවත් හිමිකාරයො ඕන තරම් ඉන්න නිසා ඒ ඥාති බත අපතෙ යන්නෙ නෑ කියල. එහෙනම් හත් දවසෙ දානෙ කියන්නෙ අපතෙ යන එකක් නෙවෙයි. මියගිය කෙනා අලුත් කයකට නොගිහින් ඒ ☞

සුදුසු ගන්ධබ්බ අවස්ථාවෙ හිටියොත්, ඒ හිමිකම ලබල ඒකෙන් පෝෂණය වෙන්න පුළුවන්. එහෙම නැත්නම් කාලාන්තරයක් තිස්සෙ ගන්ධබ්බ ලෝකෙ අනාථ වෙලා ඉන්න අනෙක් අය ඒකෙන් පෝෂණය ලබනවා. එහෙම නැති අවස්ථාවක් ලෝකයේ නෑ කියලත් බුදුන් වහන්සේ දේශනා කරනවා.

එතකොට මියගිය කෙනා දේව අත්භවයක හිටියත් ඒ ආහාරය ගන්න ආවෙ නැති වුණාට, ඒ දෙන දානෙ පින අනුමෝදන් වෙන්න පුළුවන්. ඒකට මතු කයක් ලබල තිබීම බාධාවක් නෙවෙයි. දින හතේ කතාවක් එතකොට අදාල නෑ. මැරිච්ච දවසෙම දේව බ්‍රහ්ම උප්පත්තියක් ලැබුව නම් එදාම වුනත් අනුමෝදන් වෙන්න පුළුවන්. එතකොට කෙනෙක් මියගිහින් දින 7 ක් ඇරල දානයක් දෙන්නෙ, ඒ අය කොහේ ඉන්නවද කියල ඥාති පිරිස දන්නෙ නැති නිසා. ඒ කාරණය සාමාන්‍ය අයට බලාගන්න ක්‍රමයක් නැති නිසා, දින 7 ක් යනකල් ඉඳල දානෙ දුන්නම ඒ වගේ තැනක ඉන්නව නම් ඒක ගන්න පුළුවන්. නමුත් සමහර විට හැමෝටම ඒක අවශ්‍ය නැති වෙන්න පුළුවන්. ඒ කියන්නෙ දේව බ්‍රහ්ම අත්බැවක උප්පත්තිය ලබල තියේ නම්, එහෙම නැත්නම් මවු කුසක උප්පත්තියට ගිහින් තියේ නම්, එහෙමත් නැත්නම් සතර අපායක උප්පත්තිය ලබල තියේ නම් ඒ දෙන දානෙ ගන්න විදියක් නෑ. නමුත් ඒ කාරණය දැන ගන්න ක්‍රමයක් නැති නිසයි අර දින 7 ඇරල දානයක් දෙන්නෙ. හැබැයි ඒක ඒ පුද්ගලයට වැඩක් නැති වුනත් ගන්ධබ්බ ලෝකෙ වෙනත් ගන්ධබ්බයො ඒක ගන්න නිසා අපතෙ යන්නෙ නෑ. ඒ නිසා මේ හත් දවසෙ දානෙ කියන්නෙ වැඩකට නැති දෙයක් නෙවෙයි.

ඒ වගේම මේ ගන්ධබ්බයගෙ මුල් දින 7 ගෙවෙන කොට, ඒ ගන්ධබ්බ ලෝකෙ ඉන්න හුරු වෙච්ච පැරණි ගන්ධබ්බයො ඇවිත්, දැන් ඉස්සර වගේ කරන්න කියන්න බෑ කියල අර අලුත් ගන්ධබ්බයින්ට කරුණු පහදල දෙනවා. මොකද ඉස්සර මැරිච්ච අය තවමත් ගන්ධබ්බ ලෝකෙ ඕන තරම් ඉන්නවා. තමන්ගෙ ආච්චිල සීයල, නෑදෑ හිතවත්තු, උදව් උපකාර කරපු අය... මේ ආදී වශයෙන් පෙර මියගිය අය අතරින් තවමත් ගන්ධබ්බ ලෝකෙ සැරි සරන අය ඕන තරම් ඉන්නවා. ඒ අයත් එක්තරා මට්ටමකින් මේ අලුත් ගන්ධබ්බයින්ට ඒ ලෝකෙට හුරු වෙන්න ආධාර කරනවා. ඔහොම ඉඳල හරි යන්නෙ නෑ, වරෙන් වරෙන් කියල අඬ ගහනවා. හැබැයි ඉතින් අඬ ගැහුව පළියට මුල් දවස්වල එහෙම යන්නෙ නෑ. මොකද ඒකට මානසිකත්වයක් ඒ වෙන කොට නෑ. තවමත් මනුස්ස ලෝකයේ කරපු කටයුතු ගැන තමයි හිත තියෙන්නෙ.

මේ කාරණය තවත් උදාහරණයකින් පැහැදිලි කළොත්, කැලෙන් වල් සතෙක් අල්ල ගෙන ඇවිත් හීලෑ කරගත්තු සත්තුත් එක්ක එකට දානවා. හැබැයි එහෙම දම්මට හීලෑ කරපු සත්තු කියන දෙයක් අහන්න ඒ වල් සතා මුලින් ලෑස්ති වෙලා නෑ. උෟ කඩාගෙන පනින්න හදන්නෙම කැළේට. සමහර විට හීලෑ වෙච්ච එවුන්ටත් ගොරවනවා. මුල් කාලෙ උන්ට කරන්න දේකුත් නෑ. හැබැයි පස්සෙ බැරි වුනාම තමයි අනිත් අයගෙන් පිළිසරණ බලාපොරොත්තුවෙන් වටපිට බලන්නෙ. එහෙම ක්‍රමයක් තමයි ගන්ධබ්බයගෙ මුල් දින කිහිපයට තියෙන්නෙත්.

හැබැයි මේ විදියට කෙනෙක් මියගිහින් ගන්ධබ්බ අවධිය ගත කරන අතරෙ ඕනෑම වෙලාවක චුති පටිසන්ධියක් හෝ, මවු ගැබකට ඇතුල් වීමක් හෝ වෙන්න පුළුවන්. ඒක සමහර විට පළවෙනි දවසෙ වෙන්නත් පුළුවන්. දින, මාස, අවුරුදු ගණනාවක් ගිහිල්ල වෙන්නත් පුළුවන්. නමුත් මේ කිව්වෙ ගන්ධබ්බ ලෝකෙ ස්වභාවය ගැන. මරණින් පසු ගන්ධබ්බ ලෝකෙට වැඩි පිරිසක් යන නිසාම ඒ ගන්ධබ්බ ලෝකෙ සිද්ධාන්තයන්ට අනුව තමයි ඔය ක්‍රම රටාව හැදිල තියෙන්නෙ. හත් දවසෙ, තුන් මාසෙ, අවුරුද්දෙ දානෙ ආදී වශයෙන් ඒ අය මුල් කරගෙන තමයි ඒ ක්‍රමවේදය හැදිල තියෙන්නෙ. ඉතින් ඔහොම ඉන්න අතරෙ ඕනෑම අවස්ථාවක උප්පත්තියක් අල්ලන්න හෝ වෙනත් පරිවර්තනයක් වෙන්න පුළුවන්. එතකොට අර දින 7 ක කතාව ඒකත් එක්ක සම්බන්ධයක් නෑ. නමුත් අනාථ වෙච්ච විසාල පිරිසක් ඔය ගොඩේ ඉන්න නිසා ඒ අය මේ දෙන දාන මානවලින් ප්‍රයෝජන ගන්නවා.

උදාහරණ විදියට මේ ලෝකෙ ඉන්න සියල්ලන්ටම වයස අවුරුදු 25 - 30 ගියාට පස්සෙ තමන්ගෙ මවු පියන් ඇතුළු නෑදෑයින් සියල්ලම පෝෂණය කරන්න තරම් ශක්තියක් ලැබෙන්නෙ නෑ. යමක් කමක් කරගත්තු, රැකියාවක් ව්‍යාපාරයක් කරල දියුණු වෙච්ච කෙනෙකුට තමයි එහෙම කරන්න පුළුවන්. හැබැයි එහෙම අය බොහොම අඩුවෙන් තමයි ඉන්නෙ. අනෙක් අය ඉන්නෙ යමෙක්ගෙ ආධාර උපකාරයක් බලාපොරොත්තුවෙන් යම් මට්ටමක. වෘත්ත එකක් (අවුරුද්දක්) ඉවර වුනත් ලැබීම් නැති අය හරියට ඉන්නවා. හැබැයි වෘත්ත එකකට ගැලපෙන විදියට තමන් ස්වෛරීයව ආවට පස්සෙ ඒ අය අනෙක් අය කන්න බොන්න දෙනකල්, අනුකම්පා කරනකල් බලාගෙන ඉන්නෙ නෑ. කොහාට හරි ඉව අල්ලගෙන යනවා. මනුස්ස ලෝකෙ බත් මුලක් හරි අල්ල ගන්නවා. ඒකෙ ගන්ධය උරා ගන්නවා. මනුස්ස ලෝකෙ තියෙන ඔය කුණු කසල ගොඩවල් හරි අල්ල ගන්නවා. කන්න බොන්න දෙයක් නැත්නම් කරන්නෙ ඒ වගේ දුර්ගන්ධය උරන එක. කොහේ හරි අසූචි ගොඩක් තිබුණ නම්, ඒ ගන්ධය අල්ලන්න ඒකටත් යනවා. කුණු වෙලා වැටිච්ච ගෙඩි මොනව හරි තියේ නම් ඒකටත් යනවා. පිළී ගඳ ගහන ඒව හරි කන්න බොන්න බලනවා. ඒ අයගෙ කර්ම ශක්තියට මොනවද ලැබිල තියෙන්නෙ, ඒව තනියෙන් කරගන්න පටන් ගන්නවා. එහෙම කරන අය ගන්ධබ්බ ලෝකෙ හරියට ඉන්නවා. ඉතින් මේ වගේ අසරණ වෙලා ඉන්න ගන්ධබ්බයින්ට අර වගේ දානයක් දුන්නම බොහොම සතුටින් භාර ගන්නවා. ඒත් මුල් දින 7 වික්ෂිප්ත වෙලා තමයි ඉන්නෙ. එතනින් සුගති උප්පත්තියක් ලැබුවොත්, දේව අත්බැවක් වගේ ලැබුවොත්, පින් අනුමෝදන් වෙලා පිනක් දහමක් කරගන්න පසුතලය හදාගන්නත් පුළුවන්.

උදාහරණ විදියට බුදුන් වහන්සේ පිරිත් කියන වෙලාවෙ මණ්ඩුක දිව්‍ය පුත්‍රයා මැඩි අත්බවයෙන් එවෙලම චුති පටිසන්ධි වෙලා දේව අත්භවයක ඉපදිලා, එවෙලෙම ඉතිරි බණ ටික අහන්න ඇවිත් සෝවාන් වුණා. ඒකට වැඩි වෙලාවක් ගියේ නෑ. අහේතුක වෙලා හිටපු ගෙඹි අත්භවයෙන් මිදිල ත්‍රිහේතුක දේව අත්බවක් ලබන්න ඉතා සුළු වෙලාවයි ගියේ. අන්තිමට බුදුන් වහන්සේගෙන් බණ අහල සෝවාන් වෙලා තමයි නැවතත් ගියේ. ඒ විදියට ඒ බණම අහල ක්ෂණයකින් ඒ ටික කරගන්නත් පුළුවන්. නමුත් ඉතින් කවදාවත් 100% කටම එහෙම අවස්ථාවක් උදා වෙන්නෙ නෑ. ඒක බොහොම අති දුර්ලභ දෙයක්. උපමාවකින් පෙන්වන්නෙ, මහ පොළවෙ පස්වලින් නිය පිඬට ගත්තු පස් ටිකක් වගෙයි කියල. මහ පොළවෙ තියෙන ඉතිරි පස් වගේ ඉතිරි බහුතරයම දුගතියට යන්නෙ. ඒ විදියට මේ ගන්ධබ්බ ලෝකෙ කියන්නෙත් වැඩි හරියක් දුක්ඛිතව ඉන්න සිද්ධ වෙන තැනක්.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# කල් ගත වූ කැස්සට, සෙමට සමාධිමය ඔසුවක් ....

කාලයක් තිස්සේ පවතින සුව නොවන සෙම නිසා සමාජයේ බොහෝ දෙනෙක් විවිධාකාරයෙන් පීඩා විඳිනවා. පපුවෙ සෙම, පෙනහළුවල බැඳිල තියෙන සෙම, කල් ගිය කැස්ස, බඩේ අජීර්ණ, ඇල දිවේ ආබාධ, හිස කැක්කුම ඇති කරන හිර වෙලා තියෙන සෙම් අමාරු..... ආදී සෙම මුල් කර ගෙන හට ගන්නා රෝගාබාධ රැසකටම සුවය දෙන, වහරක අභයරතනාලංකාර හිමියන්ගෙ බේත් සමාධියට හසු වූ තවත් ප්‍රත්‍යක්ෂ ඔසුවක් තමයි මේ හඳුන්වා දෙන්න යන්නෙ.

මේ බේත හදාගන්න සුදු ළූණු, පාවට්ට මුල්, බිම් කොහොඹ, නික මුල්, ගාගාත්තු වියළි පොල් සහ තල් සූකිරි අවශ්‍ය වෙනවා. මෙතනදි සුදු ළූණු (පොතු ඇරල), පාවට්ට මුල්, නික මුල් සහ බිම් කොහොඹ අමුවෙන් ගන්නව නම් ග්‍රෑම් 100 බැගිනුත්, වේලපුව ගන්නව නම් ඒ ප්‍රමාණයෙන් 1/3 බැගිනුත් ගන්න ඕන. වෙළඳ සැල්වල විකුණන්න තියෙන්නෙ අමු සුදු ළූණු. ඒ සුදු ළූණු පලල කපල අරගෙන වේලුවම තමයි වේලිච්ච සුදු ළූණු වෙන්නෙ.

ඒ වගේම බිම් කොහොඹ ගන්න කොට මුළු ගහම ගන්න පුළුවන්. යම්කිසි විදියකින් බිම් කොහොඹ හොයාගන්න බැරි වුනොත්, ඒකට ආදේශකයක් වශයෙන් කිරාට කියන පැළෑටි වර්ගය ගන්න පුළුවන්. සිංහල බෙහෙත් බඩු වෙළඳසැල්වලින් ඒවා මිලදී ගන්න පුළුවන්. හැබැයි එතකොට ඒ පැළෑටියෙන් බිම් කොහොඹ වගේ දෙගුණයක් ගන්න ඕන. ඒ කියන්නෙ අමුවෙන් නම් ග්‍රෑම් 200 ක්. ඉස්සෙල්ලම මේ වර්ග 4 හොඳට අඹර ගන්නවා. ඊට පස්සෙ ඒ මිශ්‍රණය වතුර බෝතල් 4 කට මිශ්‍ර කරල ඒක බෝතල් 1 ක් දක්වා හින්ද ගෙන ඉස්ම ටික පෙරා ගන්නවා.

ඊළඟට හිරමනයකින් පොල් ගාගෙන ඒ ටික කබලක දාල හොඳට කලු වෙලා දුම් දමන මට්ටමට එනකල් බැද ගන්නවා. එහෙම බදින කොට දුමාරයක්











එක්ක තෙල් ගතිය සෑහෙන ප්‍රමාණයක් අහක් වෙනවා. ඒ විදියට කලු වෙන මට්ටමට බැදගත් පොල් ග්‍රෑම් 500 ක් අවශ්‍ය වෙනවා. ඊට පස්සෙ ඒ බැදගත්තු පොල් ග්‍රෑම් 500 අර කලින් පෙරාගත්තු ඉස්ම බෝතලයත් එක්ක හොඳට මිශ්‍ර කර ගෙන සියුම්ව අඹර ගන්නවා. එහෙම නැත්නම් මිශ්‍රණ යන්ත්‍රයකින් මිශ්‍ර කර ගන්නත් පුළුවන්. ඊළඟට තාච්චියකට මේ මිශ්‍රණයත් එක්ක තල් සූකිරි ග්‍රෑම් 500 ත් එකතු කරල අවශ්‍ය පදමට එනකල් හැඳි ගානවා. මෙතනදි සාමාන්‍යයෙන් අංශක 60 ක උෂ්ණත්වය තමයි වඩා සුදුසු. නමුත් ඒ ප්‍රමාණය හරියටම පාලනය කරගන්න උපකරණයක් නැත්නම් ඉතා මඳ ගින්නෙන් වතුර බස්සල තමයි පදම ගන්න ඕන. එතනදි අවශ්‍ය නම් ගුලි හදාගන්න මට්ටමට හෝ චූර්ණයක (පැණි මට්ටමටත් වඩා ටිකක් උකු ලාටු වැනි මට්ටමක්) මට්ටමට හදා ගන්න පුළුවන්.

චූර්ණයක් විදියට හදා ගන්න ඕන නම් සාමාන්‍යයෙන් ඒ පදමට එනකොට බා ගන්න ඕන. ඒ මට්ටමට වතුර හිඳ ගත්තම පුස් අල්ලන්නෙ නැතිව කාලයක් තියා ගන්න පුළුවන්. ගුලි හදාගන්න ඕන නම් ඒ මට්ටමට පදම එන කොට බාගෙන කෝපි ඇට මට්ටමේ ගුලි හදා ගන්නවා. ඒ ගුලි වේල ගන්නෙ නෑ. හැබැයි මෙතනදි සමහර විට ගුලි කරන්න ගියාම මේ මිශ්‍රණය අතේ ඇලෙන්න බලන නිසා සමහර විට ගුලි කර ගැනීම ටිකක් අපහසු වෙන්න පුළුවන්. ඒ නිසා චූර්ණයක් විදියට හදා ගැනීම වඩාත් පහසුයි. හොඳට පැණි රසත් තියෙන නිසා පොඩි ළමයින්ට වුනත් ප්‍රිය මනාපයෙන් දෙන්න පුළුවන්. කොහොම හරි ලිපේ තියල තමන්ට අවශ්‍ය පදමට එනකල් හිඳගෙන බා ගන්න ඕන. මේ විදියට හදා ගත්තු චූර්ණය හෝ ගුලි තද කළු පාටයි. කළු පාට වුනයි කියල ගැටළුවක් නෑ. පොල් පුච්චපු නිසා තමයි ඒ කලු පාට එන්නෙ.

දැන් මේ විදියට හදා ගත්තෙ ගුලි නම් උදේ, දවල්, රෑ කෑමට පසු ගුලිය බැගින් ගන්න ඕන. චූර්ණය නම් තේ හැඳි 1/2 බැගින් ගන්න ඕන. පොඩි ළමයෙකුට

☞



වුනත් මේ ප්‍රමාණය ගත්තයි කියල වැඩියක් වෙන්නෙ නෑ. නමුත් ඒ ප්‍රමාණය වැඩියි කියල හිතෙනව නම් ටිකක් අඩුවෙන් දුන්නත් කමක් නෑ. ඒ විදියට සුව වෙන කල් පාවිච්චි කරන්න පුළුවන්. සාමාන්‍යයෙන් සති 2 - 3 ක් විතර මේ බේත ගන්න කොට ඒ රෝගී තත්ත්වයන් සුව වෙනවා.

ඉතින් මේ බේත හරි ගුණයි. තනිකරම පපුවෙ, බඩවැලේ ආදී ඕනෑම තැනක තියෙන සෙම ගැලවිලා ඉවත් වෙනවා. ඒ කියන්නෙ ආහාර මාර්ග පද්ධතිය මුල් කර ගෙන තමයි මේ බේත ක්‍රියාත්මක වෙන්නෙ. බඩ වැලේ, පෙනහළු ආදී තැන්වල සෙම බැඳිල අපද්‍රව්‍ය එක් රැස් වෙලා තමයි මේ වගේ රෝගී තත්ත්වයක් එන්නෙ. ඒවා ඔක්කොම ආහාර ජීරණ පද්ධතියට ඇදල සුද්ධ කරන්න පටන් ගන්නවා. එතකොට බැඳිල තියෙන සෙම ඇතුළු අපද්‍රව්‍ය බඩවැලට ඇදල ඇවිත් සුද්ධ වෙනවා. ශරීරයේ සිව් ඇතුලෙ බැඳිල තියෙන අපද්‍රව්‍ය පවා ඇදිල ඇවිත් සුද්ධ කරනවා. මේ බේතෙන් කිසිම අතුරු ආබාධයක් එන්නෙ නෑ. ආහාරවලින් ප්‍රවේසම් වීමක් අවශ්‍යත් නෑ. වෙනත් ඕනෑම බේතක් පාවිච්චි කරන ගමන් වුනත් ගන්න පුළුවන්. කිසිම ප්‍රතික්‍රියා කිරීමක් නෑ. වැඩි වියදමක් නැතිව හදාගන්නත් පුළුවන්. ඒ වගේම මේ අමුද්‍රව්‍ය ප්‍රමාණයන් සඳහන් කළේ සාමාන්‍යයෙන් වැඩි බේත් ප්‍රමාණයක් හදා ගන්න. ඒ නිසා තමන්ට අවශ්‍ය ප්‍රමාණයන්ට ඉහත අනුපාතයන් එන විදියට අමුද්‍රව්‍ය අරගෙන අවශ්‍ය ප්‍රමාණයට බේත හදාගන්න පුළුවන්.

සටහන
**නීතිඥ චන්දන සිරිවර්ධන**

# ගෙවන සසර දුක - දුක් බව නොදැනා ...

**ගෙවන සසර දුක දුක් බව නොදැනා**
**ලෝ සත රා බිව් මීයන් ලෙසිනා**
**ගිය දා ගැලවී පණ නල කයෙනා**
**පිහිටද සදහට කාගෙන් එදිනා**

**පහළ වූ දා මුනිවරු ලොව කෙදිනා**
**වැටහෙයි සත හට භව බිය එදිනා**
**වටහා ගත් සත ඒ බව සොඳිනා**
**මිදෙයි දුක් කඳින් සසරට බඳිනා**

**මෝහෙන් මත් වී නිසරුව නොදැනා**
**ලොව සරු යැයි සත අඳුරෙම ගිලෙනා**
**තිලකුණු වැටහුණු සත නැණ ලබනා**
**දුරලයි අවිදුව යළි දුක නොඑනා**

**ගෙවනා හැම මොහොතෙම සත පෙළෙනා**
**සැප යැයි රැවටෙයි මිරිඟුව ලෙසිනා**
**ඒ බව දකිනට බුදු බණ තියෙනා**
**නුවණින් ඇසි විට භව දුක නිවෙනා**

පබැඳුම: **ලලිත් මිල්රෝයි - දාරළුව**



# කැමැත්ත - ප්‍රිය මධුර බව ස්පර්ශය - පොට්ඨබ්හය අතර වෙනස ...


*(පසුගිය කලාපයෙන්: පෘතජ්ජනයින්ට සහ මගඵල ලාභීන්ට ඇති වන කාම රාග, ව්‍යාපාදයන්ගේ වෙනස........)*

අනාගාමී කෙනෙකුට ඇති වන ධර්ම කාම සහ ධර්ම රාග ගැන පසුගිය කලාපයේ ලිපියේ අවසන් කොටසින් යම් පමණකට විග්‍රහ කළා. ඒ කාරණා ටික අති සියුම් නිසා තවදුරටත් ගැඹුරින් විමසා බලා දැන ගැනීම වැදගත්. අනාගත බලාපොරොත්තු සහිත කැමැත්ත සහ අනාගත බලාපොරොත්තු රහිතව යම්කිසි විදියකින් භෞතික වශයෙන් තියෙන දාහයන්ගෙන් මිදීමේ කැමැත්ත කියන්නෙ කාරණා 2 ක්. මේ දෙවෙනි අවස්ථාවෙදි එන කැමැත්ත කියන්නෙ උපාදාන වෙන දෙයක් නෙවෙයි. නමුත් යම්කිසි කෙනෙකුට අනාගත බලාපොරොත්තු සහගත කැමැත්තක් තියේ නම් ඒක උපාදාන වෙන එකක්. අනාගාමී කෙනෙක් ගත්තොත් ඒ පුද්ගලයට පංච කාමයන් පිළිබඳ කැමැත්තක් තිබුනට අනාගත බලාපොරොත්තු සහගත කැමැත්තක් නෑ. මෙතනදි කැමැත්ත කියන වචනයේ අදහස තෝර ගන්න ඕන.

**කෑ + ඇම + ඇත්තා කියන අදහස තමයි කැමැත්තෙන් කියන්නෙ. කෑව ඇම මොකක්ද කියල බලන්න ඕන. ඒක තමයි මාරයාගේ බිලිය කියල බලිස සූත්‍රයෙන් පෙන්වල තියෙන්නෙ. ඇම කෑව නම් බිලිය ගිල්ල වගෙයි. මාරයගෙ බිලිය තමයි ක්ලේෂ කාමයන්ගෙන් ඔතපු පංච කාමය නමැති බිල්ල. ඒක ගිලගන්න කෙනාට තමයි කැමැත්ත තියෙන්නෙ. නමුත් අද ලෝක සම්මතයේ කැමැත්ත කියන වචනය කිව්වම මේ අදහස එන්නෙ නෑ. යම් කිසි ප්‍රිය මධුර සියල්ලටම කැමති කියන වචනය තමයි පාවිච්චි කරන්නෙ. නමුත් කැමැත්ත කියන්නෙ එක අදහසක්. ප්‍රිය මධුර කියන්නෙ තව අදහසක්. ප්‍රිය මධුර ස්වභාවය බුදුන් වහන්සේට සහ රහතන් වහන්සේටත් දැනෙනවා. ඒක වේදනාවක්. ඒ කියන්නෙ විපාකස්කන්ධයක්. ඒ වේදනාව මතු අභිසංඛාරවලට වැටෙන්නෙ නෑ. මොකද රහතන් වහන්සේ අභිසංඛාර දුරු කරල ඉන්නෙ.**

එතකොට කැමැත්ත කියන්නෙ පුද්ගලයා ඒකෙ ලැගගෙන ගිලගෙන ඉදීම. ආස්වාදයන් පිළිබඳ ඇලී ඇලී හෝ ගැටී ගැටී හෝ ඒකෙ බැහැගෙනම ඉන්නවා. ඒක කෙලෙස් මරුට අයිතියි. හැබැයි ප්‍රිය මධුර ස්වභාවය කියන්නෙ වෙනම අංශයක්. ආස්වාදය මුල් කරගෙන බලාපොරොත්තු සහගත ප්‍රිය මධුර භාවයක් ආවොත් ඒක කෙලෙස් මරුට අයිතියි. යම් කිසි දුකකින් මිදෙන්න ප්‍රිය මධුර භාවයක් ආවොත් ඒක කෙලෙස් මරුට අයිති වෙන්නෙ නෑ. මධු උරනවා කියන එක තමයි මධුර කියන්නෙ. මධුර බවේ ඇලීම කියන්නෙ කෙලෙස් මාරයා. මධුර බව දැනීම වේදනා ස්කන්ධයක්. ප්‍රිය මධුර බව විඳීමේ බලාපොරොත්තුවෙන් ඇලීම ක්ලේෂයක්. යම් කිසි දුකකින් මිදීමේ





අරමුණින් ප්‍රිය මධුර බවින් ගැනීම ක්ලේෂයක් නෙවෙයි. මේ නිසා ප්‍රිය මධුර ස්වභාවය බුදුන් වහන්සේටත්, රහතුන් වහන්සේටත් දැනෙනවා. හැබැයි ඒ යම් කිසි භෞතික දුක් දාහයකින් මිදෙන්න. පිපාසයෙන් පෙළෙනකොට වතුර ටිකක් බොන්න ඉල්ලන්නෙ දුකෙන් නිදහස් වීමට ඇති ප්‍රිය භාවය නිසා මිසක් කැමැත්ත නිසා නෙවෙයි. මධුර කිව්වමත් මිහිරි ස්වභාවය තියෙන්නෙ. යමක් දැක්කම පුණ්‍ය ඵලයක් වශයෙනුත් ප්‍රිය මධුර ස්වභාවයක් ඇති වෙන්න පුළුවන්. ඉෂ්ට ප්‍රිය අරමුණු සුවයි. අනිෂ්ට අප්‍රිය අරමුණු දුකයි. කවුරුවත් දුකට ප්‍රිය නෑ. සුවට ප්‍රියයි. ඒක බුදුන් වහන්සේටත්, රහතන් වහන්සේටත් එකයි. ඉතින් කැමැත්ත කියන වචනයේ අදහස තෝරගන්න බැරිව ආසන්න වචනවල අදහස් එන වචනවලටත් කැමැත්ත කියන එක ඈඳගෙන තියෙනවා. නමුත් කැමැත්ත කියන්නෙ එක කොටසක් විතරයි. ඒ නිසා පද නිරුක්තියෙන් ඒ වෙනස මේ විදිහට තෝරගන්න පුළුවන්.

එතකොට කෙනෙක් වැසිකිලි යන්නෙ කැමැත්තකින් නෙවෙයි. නමුත් අපි අද කතාවට කියනව මං කැමතියි වැසිකිලියට යන්න කියල. ඇයි කැමති? ඔබට මළ මූත්‍ර බරක් නැත්නම් ඒත් කැමතිද ඇහුවොත් නෑ කියනවා. ඇයි එහෙනම් යන්නෙ? ඉන්න බෑ පෙළෙනවා. දරන්න බැරි නිසා. ඒ වගේ යම්කිසි පුද්ගලයෙක් යම්කිසි විදියකින් භෞතිකව දුක් විඳිනව නම්, ඒ පුද්ගලයට යම්කිසි පිළිසරණක් ඕන වෙනවා. එතකොට අහෝ කියන හැඟීමක් එනවා. ඒ නිසා ඒ දේ කරනව මිසක් කැමැත්තකින් කරනව නෙවෙයි. කැමැත්ත කියන එකයි, අපි කරන ක්‍රියාවයි දෙකක්. කැමැත්ත කියන වචනය ප්‍රවේසමෙන් තෝර ගන්න ඕන සියුම් වචනයක්. කැමැත්ත කියන එක බුදුන් වහන්සේට / රහතන් වහන්සේලාට ඇත්තෙම නෑ. හැබැයි යමකින් පෙළෙනව නම් ඒ පෙළීමට ප්‍රතිකර්ම කරනවා. අපි ලෝක සම්මතයේ කතා කරන කොට කැමතියි කියල කියනවා. නමුත් උපමාවකින් තමයි කැමැත්ත අකමැත්ත පහදන්න ඕන. උදාහරණයක් විදියට අපි ගමනක් යන කොට කෙනෙක් මඩ වලක වැටිල ඉන්නවා. ඒ පුද්ගලය මඩ වලින් ගොඩ එන්න කැමතියි. නමුත් ගොඩ එන්න තියෙන කුණු කඹේ අල්ලන්න කැමති නෑ. හැබැයි කුණු කඹේ එල්ලිලා මිසක් ගොඩට එන්න බෑ කියල හිතුවොත්, දැන් ඒ ජරා වෙච්ච කුණු කඹය අතින් අල්ල ගන්නම වෙනවා. ඒක ගහක අත්තක පටලවල හරි ගොඩට එන්න ක්‍රමයක් තිබුණත් ඒත් ජරාවක්මයි. හැබැයි ජරාව වුනත් ගොඩට එන්න ඕන නිසා අල්ල ගන්නවා. දැන් කැමැත්තෙන්ද ඇහුවොත් ඇල්ලුවෙ? අකමැත්තෙන් වුනත් කරන්න දෙයක් නෑ අල්ලන්න වෙනවා.

තවත් උදාහරණයක් ගත්තොත්, අතේ ඉන්න ළමය අසූචි වළකට ☞


වැටෙනවා. දැන් අම්ම හෝ තාත්ත අසූචි වළට පනිනවා. ඔබ කැමැත්තෙන්ද පැන්නෙ කියල ඇහුවොත් ඔව් කියන්නද? කරන්න දෙයක් නැති කමට පැන්නා. හැබැයි ඒකට කැමති නෑ. නමුත් දරුව ගැන දයානුකම්පාව නිසා පැන්නා. ඇයි පැන්නෙ? වෙන හේතුවක් උඩ. කැමැත්ත නිසා නෙවෙයි. එතකොට ලෝකානුකම්පාව / දයානුකම්පාව කියන්නෙ කැමැත්තක් නෙවෙයි. ලෝකානුකම්පාව නිසා සෙතක් කරනව කියන්නෙ කැමැත්තකින් කරනව නෙවෙයි. කැමැත්තක් නැතිව ලෝකානුකම්පාවෙන් කරන ලෞකික යහපත් කටයුතුත් තියෙනවා, ලෝකෝත්තර කටයුතුත් තියෙනවා. බුදුන් වහන්සේ, රහතන් වහන්සේ ලෝකයට ධර්ම දේශනා කරන්නෙ කැමැත්ත නිසා නෙවෙයි. ලෝකානුකම්පාව නිසා. ඒ නිසා තමයි කැමැත්තෙන් පන්න පන්න බණ කියන්න යන අය, පස්ස හරවල බැනල යන කාන්තාවන් පස්සෙන් ගිහින් ඉඹිනව වගේ කියල උපමාවක් පෙන්නුවෙ. ඒ අය එපා කියද්දිත්, කැමැත්තෙන් බණ කියන අය පස්සෙන් පන්න පන්න බණ කියන්න යනවා. ඒ වගේ අයට බුදුන් වහන්සේ මනා නිග්‍රහයෙන් නිග්‍රහ කළා.

දැන් කෙනෙකුට හිතෙන්න පුළුවන්, යහපතක් වෙනව නම් පස්සෙන් පන්නල බණ කිව්වත් මොකද කියල. නමුත් එතනදි ඒ පුද්ගලය බණ අහන්න බලාපොරොත්තුවක් නැත්නම්, ඒකට අකමැති නම්, ඒ වගේ කෙනෙකුට පන්නගෙන ගිහින් බණ කියන්න ගියොත් ඒ පුද්ගලයට යහපතක් නෙවෙයි අයහපතක් වෙන්නෙ. මේ කාරණය ඔප්පු වෙන තැනක් තමයි චුන්ද සූකරට බණ කියන්නෙ නැත්තෙ මොකද කියල භික්ෂූන් වහන්සේලා බුදුන් වහන්සේගෙන් අහපු වෙලාවෙ උන්වහන්සේ දීපු උත්තරය. චුන්ද සූකරට මම බණ කියන්න ගියොත් ඔහු මටත් ධර්මයටත් දොස් කියල අට මහ නිරයට යනවා. නමුත් ඔහු දැන් ඌරො මර මරා ඉඳල ඊට මෙහා තියෙන ඔසුපත් නරකයකට යන්නෙ. එතකොට ඒකෙන් පේනවා නොගැලපෙන අයට බණ කියන්න ගියොත් ඒ පුද්ගලය විනාශ වෙන බව, නරකක් කරගන්න බව. ඒ නිසා දේශනා කරන පුද්ගලය ඒ කාරණය දැනගන්න ඕන.

එහෙම පන්න පන්න කැමැත්තෙන් බණ කියන අය, තමන්ට බණක් කියන්න දුන්නෙ නැත්නම් හරි තරහයි. ඒ කියන්නෙ ඇල්මක් තිබිච්ච නිසා තමයි ගැටෙන්නෙ. කැමැත්තෙන් බණ කියන්න බලාපොරොත්තුවක් නැති අයට එහෙම ගැටළුවක් නෑ. මේ දෙක අතර ලොකු වෙනසක් තියෙනවා. කැමැත්ත කියන කාරණය හැම වෙලේම ලෝකයත් එක්ක බැඳීමක් තියෙනවා. බුදුන් වහන්සේට / රහතන් වහන්සේලාට ලෝකය සමග කැමති සේ පවත්වන්න බැඳීම් එකක්වත් නෑ. ඒ සියල්ලම ඊට මෙහා ඉන්න ලෝකයේ අය කැමැත්තකින් හදාගෙන තියෙන දේවල්. රහතන් වහන්සේ කොතැනකවත් කැමැත්තක් හදාගෙන නෑ. නමුත් අනිත් අයට කැමැත්ත අත් හැර ගන්න බෑ. කොයි වෙලාවෙත් ලෝකෙ කොතැනක හරි කැමැත්තකින් බැඳිල ඉන්නෙ. ඒ කැමැත්ත පිළිබඳ දැඩි බැඳීමක් / ඡන්ද රාගයක් පෘතජ්ජන අයට තියෙනවා. එතකොට මේ කියන කැමැත්ත කාමයක්. ඒ කැමැත්ත පිළිබඳ මතු බලාපොරොත්තුවක් තියේ නම් ඒක කාම රාගයක්.

ඒ නිසා බුදුන් වහන්සේට / රහතන් වහන්සේට ධර්මය සම්බන්ධයෙන් හෝ කැමැත්තක් නෑ. ඒ නිසා තමයි





ආනන්ද හාමුදුරුවො සැරියුත් මහරහතන් වහන්සේගෙන්, මේ ධර්මය විනාස වෙලා ගියොත් මොකද හිතෙන්න කියල ඇහුවම, මොනව හිතන්නද කියල උත්තර දුන්නෙ. ඊළඟට තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑවොත් මොකද හිතෙන්නෙ කියල ඇහුවම, ඒකටත් මොනව හිතන්නද කියල කිසි ගානකට නැති උත්තරයක් දුන්නා. නමුත් ඒකට කැමැත්තක් තිබුණ නම් උන් වහන්සේ එහෙම උත්තරයක් දෙන්නෙ නෑ. දැන් ඉතින් මේ උත්තර දීපු ස්වභාවය ආනන්ද හාමුදුරුවන්ට හරි හිතට අමාරුයි, දරා ගන්න බෑ. මොකද ධර්මය වැනසිලා ගියත්, තථාගතයන් වහන්සේ පිරිනිවන් පෑවත් උන් වහන්සේට ගානක් නැතිලු. ඒ නිසා අනිත් අතට බුදුන් වහන්සේට ගිහින් කිව්වා, ස්වාමීනි සැරියුත් හාමුදුරුවො මෙන්න මෙහෙම කියනව කියල. ඉතින් මම කිව්වත් කියන්න තියෙන්නෙ ඔච්චර තමයි, සාරිපුත්ත මහා ප්‍රාඥයිනෙ කියල උන් වහන්සේත් උත්තරයක් දුන්නා. මොකද නැති වෙන දෙයක ස්වභාවය ඒකයි. ඒක එහෙම නොවේවා කියල කිව්වට එහෙම තියෙයිද? ඒක කරන්න පුළුවන් දෙයක්ද? හට ගත් දෙයක් ගෙවිල යාමත් ඒකෙ ස්වභාවයක්. අපි කැමති අකමැති වුනාට ඒක තියෙන්නෙ නෑ. ඉතින් බැරි දේකට කැමති වෙන්නෙ කොහොමද? බුදුන් වහන්සේ / රහතන් වහන්සේ ඒකෙ ස්වභාවය ඒ විදියට දකිනවා.

ඊළඟට ධර්ම කාම රාග නෑ කියන්නෙ නිවන් මග හැර යම්කිසි ඉදිරි බලාපොරොත්තු සහගතව කැමැත්තෙන් යමක් කරන්නෙ නෑ, කියන්නෙ නෑ, හිතන්නෙ නෑ කියන එක. හැබැයි නිවන් මග පූර්ණ කරන්න තියෙන බලාපොරොත්තු සහගත අරමුණ කියන්නෙ කාම රාග නෙවෙයි. ඒක ඡන්ද සෘද්ධි පාදවලට අයිතියි. අනාගත ලෞකික බලාපොරොත්තුවලට හිත තියාගෙන කරන, කියන, හිතන යමක් ඇත්නම් ඒක කැමැත්තකින් කරන්නෙ. තවම කැමැත්ත ඉවර වෙලා නෑ. හැබැයි පංච කාමය පිළිබඳ බලාපොරොත්තු සහගත කැමැත්තක් අනාගාමී අයට නෑ. ඒ නිසා තමයි පංච සුද්ධාවාසවලට යන කොට කාම රාග ඉක්මවා යන්නෙ. කාම තිබුනට ඒ කාමවලට උපාදාන බලයක් නෑ. රූප අරූප රාගවලට තමයි උපාදාන තියෙන්නෙ. ඉදිරි බලාපොරොත්තු තිබුනොත් තමයි කාම උපාදාන වෙන්නෙ. එතකොට අනාගාමී අයට ධර්ම කාම සම්බන්ධයෙන් විතරයි ඉදිරි බලාපොරොත්තු නැත්තෙ. රූප අරූප රාග සම්බන්ධයෙන් ඉදිරි බලාපොරොත්තු අත්හැරිල නෑ.

ඊළඟට මතු බලාපොරොත්තු රහිත කැමැත්ත තමයි ධර්ම කාම කියන්නෙ. ඒකත් කාමයක්. උදාහරණයක් විදිහට බඩගින්නට කෙනෙක් ආහාරයක් ඉල්ලනකොට වතුරයි බතුයි දෙනවා. දැන් ඒක ව්‍යංජන නැතිව කන්න බෑ. ලුණුවත් නැතිව නිකන් වතුරයි බතුයි කන්න බෑ. දැන් ලුණු ටිකක් දෙනවා. බඩගින්න නිසා ඒක කනවා. හැබැයි ඒ ජාතියේ කැමක් මතු බලාපොරොත්තු වෙන්නෙ නෑ. ඒක බඩගින්නට ප්‍රතිකර්මයක් මිසක් ඒකෙන් මතු බලාපොරොත්තු හදා ගන්නෙ නෑ. පෘතජ්ජනයටත් ඒක එහෙමයි. ධර්ම කාම රාග කියන්නෙ මතු බලාපොරොත්තු හෙවත් කාම උපාදානයක් සහිත කැමැත්ත. මේ අවස්ථා 2 ක්. හැබැයි මේ කියන රහිත / සහිත කියන දෙකම නැතිව, පෙළීමෙන් මිදෙන බලාපොරොත්තුවක් තියේ නම් ඒක කාමයක් හෝ කාම රාගයක් නෙවෙයි. ඒක

නිකං ක්‍රියා සිතකට සීමා වෙනවා. ඒක තමයි රහතන් වහන්සේලාට තියෙන්නෙ. ඒ නිසා රහතන් වහන්සේ නමක් තමන්ගෙ බෙල්ල කපන්න හැදුවොත් නිකං බලාගෙන ඉන්නෙ නෑ. මග හැරල යනවා. මොකද පෙළීමට ප්‍රිය කරන්නෙ නෑ.

මුගලන් මහ රහතන් වහන්සේ මරන්න එන කොට තුන් වතාවක් බේරිලා පැනල ගියේ මරණ බයට නෙවෙයි. ගහන කොට රිදෙනවා, හරි වේදනායි. ඒකට ප්‍රිය නෑ. ඒ කියන්නෙ හිතා මතා දුක් විඳින්නෙ නෑ. ඒකෙන් මිදෙන්න ක්‍රමයක් හොයනවා. බඩගින්නෙ ඉන්නෙ නැතිව පිණ්ඩපාතෙ වඩින්නෙ ඒ නිසා. දානෙ ගන්නෙ ඇයි? බඩගිනියි, පෙළෙනවා. පෙළීමෙන් නිදහස් වෙන්න යමක් කරනවා. ආනන්ද පැන් පිපාසයි, බොන්න වතුර ටිකක් දෙන්න කියල බුදුන් වහන්සේත් ඉල්ලුවා. මොකද පිපාසය කියන පෙළීමෙන් නිදහස් වෙන්න. හැබැයි ඒක කැමැත්තක් නෙවෙයි. නමුත් පිටින් බැලු බැල්මට කැමැත්තක් වගේ එකක් පේනවා. ඒත් ඒක කැමැත්තත් එක්ක සම්බන්ධයක් නෑ. පෙළීම සඳහා ප්‍රතිකර්මයක් තමයි ඒ යෙදුවෙ. ඒක ලොව්තුරා බුදුන් වහන්සේත් කළා. එතකොට පෙළීම සඳහා ප්‍රතිකර්ම යොදනව කියන්නෙ එකක්, ආස්වාදයන් පිළිබඳ කැමැත්ත තව එකක්. ආස්වාදයන් පිළිබඳ මතු බලාපොරොත්තු සහගත කැමැත්ත කියන්නෙ තවත් එකක්. මතු බලාපොරොත්තු සහගත කැමැත්තක් ඇත්නම් ඒක කාම රාගයක්. මතු බලාපොරොත්තු නැතිව එවෙලෙට විතරක් කැමැත්තක් තියේ නම් ඒක කාම. ඒ කියන කාම කොටස අනාගාමී කෙනාටත් තියෙනවා. හැබැයි ඒක කාම රාගයක් නෙවෙයි. ඒ වගේම අනාගාමී කෙනාට කාම තිබුනට රහතන් වහන්සේලාට ක්‍රියා මිසක් කාම නෑ. හැබැයි රහතන් වහන්සේ පෙළීමට ප්‍රතිකර්ම කරනවා. ඒක කාම නෙවෙයි. කාම රාග තිබුණොත් තමයි කවද හරි කාම උපාදානයක් වෙන්නෙ. එහෙම නැතිව කාම විතරක් තිබුණට උපාදානයක් වෙන්නෙ නෑ.

ඇස, කන, දිව, නාසය, ශරීරය කියන පංච ඉන්ද්‍රියන් පංච කාමයන්ගෙන් පිනවන්න තිබෙන්නා වූ අදහස් මනසට එනව නම්, ඒ විදියට අදහස් එන එක්තරා ක්‍රමයක් තියෙනවා. ඒ කියන්නෙ මනසට අරමුණක් එනව නම් ඒ සියලු අරමුණු එන්නෙ අනිදස්සනං අප්පටිඝං හෝ සනිදස්සනං අප්පටිඝං හෝ සනිදස්සනං සප්පටිඝං හෝ අනිදස්සනං සප්පටිඝං කියන මේ මොනව හරි ක්‍රමයකින්. එතකොට කෙනෙක් බුදුන් වහන්සේ දකින්න කැමැතියි කියන්නෙ ඒක ධර්ම කාමයක් නෙවෙයි, ධර්ම රාගයක්. අනාගාමී කෙනත් ඒකට කැමතියි. ඒ නිසා මනසට මතක් වෙලා ඒ කාරණය ගෝචර වෙන්න පුළුවන්. අනාගාමී කෙනෙකුට දිව්‍ය තිබුණ කියල හිතුවොත්, දිව්‍යසින් බැලුවම ඔහුට පේන්න පුළුවන් බුදුන් වහන්සේ වැඩ ඉන්න කාලෙ ඉඳල තමන් හිටපු ස්ථානය. එතකොට ඒ පුද්ගලය ඒක දිබ්බ චක්ඛුවලින් බැලුවෙ. ඒකෙනුත් සනිදස්සනං කියන කොටසින්. ඒ කියන්නෙ දිව්‍යසට පේනවා. හැබැයි එහෙම බැලුවට ඒක ස්පර්ශ (පොට්ඨබ්බ) කරන්න බෑ. ඒ නිසා අප්පටිඝං. එතකොට ධර්මායතනයට තමයි දිව්‍යස ගෝචර වුණේ. ඒ නිසා ධර්මායතන පරියාපන්න රූපයක්. ඒ වගේම ඒක ධර්ම රූපයක්.

මෙතනදී ස්පර්ශයයි, පොට්ඨබ්බ-යයි කියන්නෙ කාරණා දෙකක්. කතා කරන කොට ස්පර්ශයයි, පොට්ඨබ්බයයි එකක් විදියට කතා කළාට පැහැදිලිවම දෙකක්. ඇස, කන, දිව, නාසය, ශරීරය කියන පංචේන්ද්‍රියන්ගෙන් කයට පොට්ඨබ්බ කියල දෙයක් තියෙනවා. ස්පර්ශය කියන දෙය ඇස, කන, දිව, නාසය, ශරීරය, මන කියන සියලු ඉන්ද්‍රියන්ට තියෙනවා. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ කියල කතාවට කිව්වට, ස්පර්ශය වෙනුවට පොට්ඨබ්බය තමයි යෙදෙන්න ඕන හරි වචනය. එතකොට අනිදස්සනං සප්පටිඝං කියල කිව්වෙ පොට්ඨබ්බය. ඒ කියන්නෙ භෞතිකව අහු වෙන දෙයක්, දකින්න බෑ. ස්පර්ශය කියන වචනය ව්‍යවහාරයෙදි භාවිතා වුනාට ඒක පොදු වචනයක්. අපි කෙනෙක්ගෙ අතින් ඇල්ලුවොත් අත ස්පර්ශ කළා නෙවෙයි, පොට්ඨබ්බ කළා. ඒක තමයි හරි වචනය. නමුත් කතාවට කියනවා අත ස්පර්ශ කළා කියල. ස්පර්ශය කියන එක ඇහින්, කනින්, නාසයෙන්, දිවෙන්, මනසින් කියන මේ සියල්ලෙන්ම කරන්න පුළුවන්.

ඒ නිසා තමයි චක්ඛු සම්ඵස්සය, ජිව්හා සම්ඵස්සය.... ආදී වශයෙන් කියන්නෙ. ඇස, කන, දිව, නාසය, ශරීරය, මන කියන මේ ඉන්ද්‍රියන් 6 න්ම ස්පර්ශය කියන එක කරන්න පුළුවන්. නමුත් මේ හැම එකකින්ම පොට්ඨබ්බ කරන්න බෑ. පොට්ඨබ්භ කරන්න පුළුවන් කයින් විතරයි. නාසයට ගන්ධය ස්පර්ශ වෙනවා. ඒ කියන්නෙ දැනෙනවා. දිවෙනුත් රසයක් ස්පර්ශ කරන්න පුළුවන්. ආහාර කියන ඒවා පොට්ඨබ්බවලට අයිතියි. ඒ ආහාර දිවේ ගෑවීම පොට්ඨබ්බයක්. නමුත් රස ධාතුව කියන එක ස්පර්ශයට අයිතියි. ඒක ජිව්හා ප්‍රසාද රූපයට තමයි දැනෙන්නෙ. ජිව්හා ඉන්ද්‍රිය කියන්නෙ කයේ කොටසක්. ඒකට පොට්ඨබ්බය දැනෙනවා. ඒවගේම සුවඳක් ආවම ආග්‍රහනය කරනව කියන්නෙ ස්පර්ශයක්. ඒක දැනෙන්නෙ ජිව්හා ප්‍රසාද රූපවලට. හැබැයි පොල් කෙන්දක් නාහෙ වදිනකොට ඒක ස්පර්ශයක් නෙවෙයි, පොට්ඨබ්බයක්. කනට ශබ්දය ස්පර්ශ වෙනවා. ඒ නිසා ඇහෙනවා. හැබැයි කනේ පොල් කෙන්දක් ගෑවුනොත් ඒක පොට්ඨබ්බයක්. ඒක ඇහෙන්නෙ නෑ නමුත් දැනෙනවා. ඒ වගේ ඇහැට පේන්නෙ ස්පර්ශයෙන් මිසක් පොට්ඨබ්බයෙන් නෙවෙයි. නමුත් ඇහැට මොනව හරි රොඩු කැල්ලක් වැටුනොත් ඒක පොට්ඨබ්බයක්. ඒ කියන්නෙ පොට්ඨබ්බය ඇහැ කියන මස් ලේ කයට ඉන්ද්‍රියක් වුනා. හැබැයි ප්‍රසාද රූප කියන්නෙ මස් ලේ කයේ ඉන්ද්‍රියක් නෙවෙයි.

මේ හැම අවස්ථාවකදීම ස්පර්ශයක් කියන්නෙ ප්‍රසාද රූපයට සම්බන්ධ දෙයක්. රූප ස්පර්ශය, ගන්ධ ස්පර්ශය, රස ස්පර්ශය, ශබ්ද ස්පර්ශය කියන්නෙ ප්‍රසාද රූපවලින් කරන වැඩක්. දිවට රසයක් දැනෙන්නෙ ජිව්හා ප්‍රසාදය නිසා. මොන රසද කියල ඇහුවොත් ඒක කියන්න පුළුවන්. හැබැයි කවුරුහරි දිවෙන් ඇල්ලුවොත් දැනෙන්නෙ පොට්ඨබ්බය නිසා. එතකොට ඇහුවොත් මොන රසද කියල එහෙම රසයක් කියන්න බෑ. දිව ඇල්ලුවම දැනෙන පොට්ඨබ්බය වෙනයි. දිවට රසයක් ආවම දැනෙන ස්පර්ශය වෙනයි. එතකොට පොට්ඨබ්බයට රූපද, ශබ්දද, ගන්ධද, රසද කියල කියන්න බෑ. පොට්ඨබ්බ කියන්නෙ දැනෙන ස්වභාවය. ඒ කියන්නෙ යම්කිසි ද්‍රව්‍යයක් ළඟට අරගෙන වද්දවල ගන්න පුළුවන් ජාතියෙ දෙයක් තමයි පොට්ඨබ්බ කියන්නෙ. ඒකට තියෙන්නෙ රළු ස්වභාවයක්. කයට දැනෙන පොට්ඨබ්බය ඒ වගේ දෙයක්. හැබැයි ශබ්දය තිබුනට ඒ ශබ්දය නෙවෙයි කනට වදින්නෙ, ඒ අංශු කම්පනය වීමෙන් ඒ අනුසාරයෙන් එන අනුකම්පනයක් තමයි කනට දැනෙන්නෙ. සෝත රූපයට ස්පර්ශය මිසක් පොට්ඨබ්බය දැනෙන්නෙ නෑ. ඇහැට පේන්නෙත් ඒ වගෙයි, රූප නෙවෙයි, ඒ අතර මැදින් සිද්ධ වෙන දෙයක්. ඒක භෞතිකව ඇහේ වදින්නෙ නෑ. භෞතිකව ඝනීභවනය වෙච්ච දෙයක් ඒ ඉන්ද්‍රියේ වැද්දුවොත් එන්නෙ පොට්ඨබ්බයක්. එතකොට මේ පොට්ඨබ්බය කියන්නෙ පංචේන්ද්‍රිය-න්ගෙන් පස්වෙනි ඉන්ද්‍රියට ගෝචර වෙන දෙයක්. ඇස, කන, නාසය, දිව කියන්නෙත් කයේ කොටස්. රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ කියන ඒවා ගෝචර වෙන්නෙ ඒ ඒ ඉන්ද්‍රියන්ගෙ ප්‍රසාද රූපවලට මිසක් ඒ ඒ ඉන්ද්‍රියන්ට නෙවෙයි. ඒ ප්‍රසාද රූපවලට ගෝචර වෙන්නෙ ස්පර්ශය මිසක් පොට්ඨබ්බය නෙවෙයි. එතකොට කාය ස්පර්ශය එකක්, කාය පොට්ඨබ්බය තව එකක්.

(ඉතිරි කොටස ලබන කලාපයෙන්)

*වහරක අභයරතනාලංකාර හිමිපාණන් විසින් දේශිත සැඟවුණ දහම් කරුණු ඇසුරින් සකස් කළේ :*

**නීතිඥ චන්දන සිරිවර්ධන**

# හෙළ බොදු පියුම දහම් සඟරාවේ 38 වන කලාපය සඳහා ශ්‍රමය හා මූල්‍යමය දායකත්වය සැපයූ පිංවතුන්

**ශ්‍රම දායකත්වය** -

♦ ධම්මික සේනාධීර මහතා - නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ ♦ අසංග මංජුල කුමාර මහතා - හෝමාගම ♦ සමන් සිල්වා මහතා - කළුතර ♦ චන්දන සිරිවර්ධන මහතා - අලපලාදෙනිය ♦ ෆික්රි ඉස්මයිල් මහතා - ගොතටුව ♦ එස්.එම්. ජයසේකර මහතා - මාලබේ ♦ සාලින්ද ශ්‍රී ජයවර්ධන මහතා - මාලබේ ♦ ප්‍රසාද් ද සිල්වා මහතා - දෙල්ගොඩ ♦ කැළුම් ලංකේශ්වර මහතා - නෙළුව ♦ පර්ෆෙක්ට් කම්පියුටර් ආයතනයේ කාර්ය මණ්ඩලය - පිටකෝට්ටේ ♦ ඉමාෂි මුද්‍රණාලයේ අධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය ♦ නන් අයුරින් දායක වූ පින්වතුන්

**මූල්‍යමය දායකත්වය** -

♦ රොහාන් නෙත්සිංහ මහතා සහ වාගීෂා රන්සිමාලි මහත්මිය ඇතුළු පවුලේ සැම - මෙල්බන් නුවර - රු.55,800/- ♦ සදහම් රත්නායක පුතා සහ උතුම් රත්නායක පුතා ඇතුළු පවුලේ සැම - පිළියන්දල - රු. 20,000/- ♦ ප්‍රියනාත් ආරියරත්න මහතා ඇතුළු පවුලේ සැම - කුරුණෑගල - රු. 20,000/- ♦ සමන් සිල්වා මහතා - කළුතර - රු. 10,000/- ♦ තුසිත නාකන්දල මහතා, සරූපා නාකන්දල මහත්මිය, දෙව්න්යා දුව - ගල්කිස්ස - රු. 10,000/- ♦ අමිත් හඳුගොඩ මහතා ඇතුළු පවුලේ සැම - අත්තිඩිය - රු. 5,000/- ♦ ගයාන් පුෂ්පික ඉන්ද්‍රජිත් ලොකුමාන්න මහතා, ඉරෝෂා ලොකුමාන්න මහත්මිය, සෙනුත් ලොකුමාන්න පුතා - ගල්කිස්ස - රු. 5,000/- ♦ සොනාලි සමරදිවාකර මෙනවිය - මහරගම - රු. 5,000/- ♦ ජනක හපුආරච්චි මහතා ඇතුළු පවුලේ සැම - ගිනිගත්හේන - රු. 5,000/- ♦ සුභාෂ් රණසිංහ මහතා - වේයන්ගොඩ - රු. 5,000/- ♦ ඊ.ඒ. රොෂානි එදිරිසිංහ මෙනවිය - මොට්ටුන්න - රු. 5,000/- ♦ ජී.පී. ගර්ලි මහත්මිය - පොල්ගස්ඕවිට - රු. 5,000/- ♦ එච්.ඩී. සරිත් මහතා - ගාල්ල - රු. 4,300/- ♦ කරගම්පිටිය ශාස්ත්‍රානන්ද පිරිවෙන් විහාරස්ථානයේ සදහම් වැඩසටහනට සහභාගි වන පින්වතුන් - රු. 3,000/- ♦ ටී.ටී.පී. සිල්වා මහත්මිය - නාගොඩ කළුතර - රු.2,500/- ♦ කපිල වික්‍රමනායක මහතා සහ ජනිඳු බිම්සර පුතා - මීරිගම - රු.2,000/- ♦ විපුල සංජීව මහතා ඇතුලු පවුලේ සැම - හෝමාගම - රු.2,000/- ♦ එම්.ජී.යූ. විමලධර්ම මහත්මිය - රාජගිරිය - රු. 2,000/- ♦ දර්ශන පෙරේරා මහතා ඇතුළු පවුලේ සැම - පිළියන්දල - රු. 2,000/- ♦ විනීතා කැකුළාවල මහත්මිය - මීරිගම - රු. 2,000/- ♦ ඩබ්. උපුල් පරාක්‍රම ද සිල්වා මහතා - මාරවිල - රු. 2,000/- ♦ අයිරාංගනී තිලකරත්න මහත්මිය - නාවල - රු. 1,500/- ♦ ජානකී කුමාරි රූපසිංහ මහත්මිය - පාදුක්ක - රු. 1,500/- ♦ ෂවීන් ශ්‍රී ජයවර්ධන පුතා ඇතුළු පවුලේ සැම - මාලබේ - රු. 1,000/- ♦ ඩබ්. විලියම් මහතා - දෙහිඅත්තකණ්ඩිය - රු.1,000/- ♦ ශ්‍යාමල් බණ්ඩාර මහතා - කුරුණෑගල - රු. 1,000/- ♦ රුවන් රණසිංහ මහතා - පන්නිපිටිය - රු.1,000/- ♦ නදීශා හර්ෂනී ලියනගේ මෙනවිය - කළුබෝවිල - රු. 1,000/- ♦ එරංග ලියනගේ මහතා සහ බිසන්තිකා ගුණසේකර මහත්මිය - කළුබෝවිල - රු. 1,000/- ♦ නිහාල් ලියනගේ මහතා සහ චිත්‍රා ශ්‍රේරු මහත්මිය - කළුබෝවිල - රු. 1,000/- ♦ ඉන්ද්‍රානි විශාකා ජයසිංහ මහත්මිය - බොරලැස්ගමුව - රු. 1,000/- ♦ එස්. ප්‍රසන්න ප්‍රියදර්ශන සිල්වා මහතා - ගල්කිස්ස - රු. 1,000/- ♦ නුවන් යාපා අමරසේකර මහතා - රදාවාන - රු. 1,000/- ♦ සී.එම්.පී.සී. ලක්රුවන් මහතා - කළුතර - රු. 1,000/- ♦ සේමිනි බුදාරා දියණිය - දොඩංගොඩ, කළුතර - රු.1,000/- ♦ ඩිලානි ඩයස් මහත්මිය - නාවින්න - රු.1,000/- ♦ අසංක සෙනරත් අඹගල මහතා - රදාවාන - රු.1,000/- ♦ රත්න පෙරේරා මහතා ඇතුළු පවුලේ සැම - කැස්බෑව - රු. 1,000/- ♦ ෂෙහානි බස්නායක මහත්මිය - මත්තෙගොඩ - රු. 1,000 ♦ තුසිත ජයවික්‍රම මහතා - ජගත් රොබෝටෙක් ආයතනය - රු.1,000/- ♦ කේ.ඒ. ප්‍රේමචන්ද්‍ර මහතා සහ එම මහත්මිය - කිරිඳිවැල - රු.1,000/- ♦ ස්වර්ණා සෝමරත්න මහත්මිය - දඹුටුව - රු. 1,000/- ♦ ඩොනල්ඩ් රත්නවීර මහතා ඇතුළු පවුලේ සැම - මත්තෙගොඩ - රු.1,000/- ♦ සුමිත් රූණගේ මහතා - කඩවත - රු.1,000/- ♦ සුනිමල් කුමාරතුංග මහතා - අවිස්සාවේල්ල - රු.1,000/- ♦ ජේ.ඒ. ප්‍රියදර්ශන පෙරේරා මහතා - කොට්ටාව - රු.1,000/- ♦ චරිත් ඉන්දික මහතා - ඉතාලිය - රු.1,000/- ♦ සඳුනි දසනායක මහත්මිය සහ අසංක ප්‍රේමරත්න මහතා - කළුතර - රු.1,000/- ♦ රසිකා ගංගානි මෙනවිය - ගාල්ල - රු.1,000/- ♦ අයි.එම්.ජී. ජනිඳු එරංග පුතා - නෙළුව - රු.1,000/- ♦ අයි.එම්.ජී. දෙව්මිණි තාරකා දුව - නෙළුව - රු.1,000/-♦ සකුන්තලා ඒකනායක මහත්මිය - බත්තරමුල්ල - රු. 1,000/- ♦ ග්‍රේෂානි ඊ. සිරිතුංග මහත්මිය - මිනුවන්ගොඩ - රු.1,000/- ♦ නයෝමි තරංගා ලියනගේ මෙනවිය සහ ගාමිණී ලියනගේ මහතා - නැදිමාල - රු.1,000/- ♦ ඩී.එස්. ඒකනායක මහත්මිය - රත්නපුර - රු.1,000/- ♦ ඩබ්.එස්. සොයිසා මහත්මිය - පානදුර - රු.1,000/- ♦ ප්‍රියංකා ජයසිංහ මෙනවිය - දොඩන්ගොඩ - රු.1,000/- ♦ ඉඳුනිල් නානායක්කාර මහත්මිය - පාමංකඩ - රු.1,000/- ♦ දසිත් අල්විස් පුතා - පැපිළියාන - රු.1,000/- ♦ කේ. නන්දසිරි මහතා සහ කේ. සර්ධාවතී මහත්මිය - වැලිමඩ - රු.1,000/- ♦ ප්‍රසාද් රණසිංහ මහතා - පන්නිපිටිය - රු.1000/- ♦ ශමීන් බණ්ඩාර මහතා -උඩුබැද්දාව-රු. 1,000/- ♦ චතුර සම්පත් ධනංගල මහතා - පාදුක්ක - රු.1,000/- ♦ එම්.කේ. ඥානවතී මහත්මිය - කොට්ටාව - රු.1,000/- ♦ පද්මා රාජපක්ෂ මහත්මිය - මාතර - රු.1,000/- ♦ ජගත් පෙරේරා මහතා - ඇහැලියගොඩ - රු.1,000/- ♦ රන්දි යුරේනිකා මහත්මිය - ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - රු.1,000/- ♦ එච්.එම්. මුතුමැණිකේ මහත්මිය - කන්තලේ, සෙනෙහෙලතා ජයවික්‍රම මහත්මිය - ගම්පහ, සචිනි ඒකනායක දියණිය - ගම්පහ, සුසිලා පෙරේරා මහත්මිය - අත්තිඩිය, ගයාන් සහ මනෝජ් යන මහත්වරුන් - කොල්ලුපිටිය, ගාමිණී සිරිමාන්න මහතා - රදාවාන, රංජිත් වික්‍රමසිංහ මහතා, පද්මාවතී වික්‍රමසිංහ මහත්මිය, සුභාෂිනී දිසානායක මහත්මිය, පී.එම්. ගමගේ මහත්මිය - කඩිගමුව, උපුල් විජේනායක මහතා - මාවනැල්ල, මනෝජ් ජයසූරිය මහතා, උදාන ආරියවංශ මහතා - මහරගම, ඉසුරු සම්පත් මහතා - කළුතර, චතුර මල්වාන මහතා - කෑගල්ල, චන්දිම ගුණදාස මහතා - මොරටුව, දුමින්දා සංජීවනී මහත්මිය - නිට්ටඹුව, කුමාරි ගොඩවිට මහත්මිය - කුරුණෑගල, ශ්‍රී රංජිත්සිංහ මහතා - කැළණිය, යමුනා උඩුමලගල මහත්මිය - පිළියන්දල, රසික තුශාන්ත මහතා - හෝමාගම - රු. 6,400/-♦ එකතු වූ

සියලු මුදල් පරිත්‍යාග- රු. 226,000/- ♦ පළමු පිටපත් 10000 සඳහා මුද්‍රණ වියදම රු. 232,500/- ♦අනෙකුත් වියදම් - 10,410/- ♦ සම්පූර්ණ වියදම - රු. 242,910/- මුද්‍රණ කටයුතු සඳහා ගිය හිඟ මුදල සඟරා අලෙවියෙන් පියවා ගන්නා ලදී. සඟරා අලෙවියෙන් ලැබෙන ඉතිරි සියලු මුදල් නැවත මුද්‍රණ කටයුතු ඇතුළු දහම් කටයුතු සඳහා යොදවනු ලැබේ.

**ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළු ආධාර උපකාර කළ සියලු දෙනා සිදු කරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන, අනන්ත සසරේ පටන් මේ දක්වා තම තමන් අතින් අවැඩ, අසාධාරණ, වැරදි, ප්‍රමාද දෝෂවලට ලක් වූ සියලු දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මියගිය සතර වරිගයක ඥාති මිත්‍රාදීන්ටත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද විහිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා, සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණාවබෝධයටද හේතු වාසනා වේවා! එම ආධාර උපකාර කළ පිංවත් පිරිස් ඇතුළු සිය පවුල්වල සැමටත්, කරන කියන යහපත් රැකී රක්‍ෂා ව්‍යාපාර ආදියෙන් සියලු ජයග්‍රහණයන් අත් වේවා. දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතුවලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලු අභිවෘද්ධිය උදා වේවා!**

---

## සියවස් ගණනාවකට පෙර සැඟව ගිය නිමල බොදු මග යළි පුබුදුවමින්,

**හෙළ බොදු පියුම දහම් කරුණු ඔබ වෙත රැගෙන එන්නේ, බුදු පියාණන් වහන්සේ අනුදැන වදාළ, අග්ගඤ්ඤ සූත්‍රය, නිරුක්තිපථ සූත්‍රය සහ අරණවිභංග සූත්‍රය යන සූත්‍රාන්තයන්ට අනුව, දහම් පදවල සැඟවුණු දහම් අරුත් මතු කරන පද නිරුක්ති සහ අතීතය, වර්තමානය, අනාගතය හඟවන තුන්කල් නිරුක්ති සහිත ව්‍යවහාර ශබ්ද නිරුක්ති ක්‍රමවේදය අනුව මිස, උන්වහන්සේ අනුමත නොකළ ලිඛිත භාෂා රීති සහිත බමුණන්ගේ ත්‍රිවේද නිරුක්ති මත නොවන බව සලකන්න.**

---

**පින්වත් ඔබ වෙනුවෙන් එළි දැක්වූ දහම් ගබඩාවන්...**

www.hiddendhamma.net mp3.hiddendhamma.net www.helabodhupiyuma.net www.aaryadharma.org
විද්‍යුත් ලිපිනය: webmaster@helabodhupiyuma.net දු.අං:- 071 3046895

**දම් සභා ගුවන් හඬ** - www.waharaka.com වෙබ් අඩවිය ඔස්සේ පුර සහ අමාවක පොහොය දිනයන්හි උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා

**සැඟවුණු බොදු මග යළි විවර කරමින් වහරක අරිය චින්තාශ්‍රම බෞද්ධ විහාරස්ථානයේ සදහම් වැඩසටහන් පැවැත්වෙන කාල හෝරාවන්:**

සැම පුන් පොහෝ දිනකම සහ සැම අමාවක පොහොය දිනකම උදෑසන 8.00 සිට සවස 5.00 දක්වා - පෙහෙවත් සමාදානය, දහම් සාකච්ඡා සහ විශේෂ පුණ්‍යානුමෝදනාව.

ගමන් මාර්ගය: නිට්ටඹුව - රුවන්වැල්ල ප්‍රධාන මාර්ගයේ ගෝණගල්දෙනිය හන්දියේ සිට වහරක අතුරු මාර්ගයේ මීටර 350 ක් පමණ දුරින් දකුණු පස.

---

## හෙළ බොදු පියුම දහම් සඟරාවේ පසුගිය කලාපයන් ඇතුලු සියලු කලාපයන් දැනට ලබාගත හැකි ස්ථාන:

1. ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය - 33, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ
2. නෙක්මෝ කම්පියුටර්ස් ආයතනය - මාලබේ.
3. නිව් පියුමි කොමිනිකේෂන් - පීරිස් මාවත, කළුබෝවිල - 0773742023
4. තුෂාරා ෆැෂන් - හයිලෙවල් පාර, හෝමාගම.
5. පිනැකල් නෙට් - ශානි ඉන්ස්ටිටියුට් - හයිලෙවල් පාර, ගොඩගම
6. තුෂාරි සාරි සෙන්ටර් - කොළඹ පාර, පාදුක්ක.
7. සුජය ෆාමසි - කටුබැද්ද හංදිය, මොරටුව.
8. ගේට්වේ අධ්‍යාපන ආයතනය - කලේගාන, ගාල්ල.
9. සමනල පොත්හල - නෙළුව.
10. නිව් මෙට්‍රෝ කම්පියුටර්ස් - කාලිදාස මාවත, මාතර
11. මෝලෙ කඩේ - මුදුන, වලස්මුල්ල.
12. කේ. පී. ස්ටෝර්ස් - ගන්තුන, කැගල්ල.
13. ලසන් ට්‍රේඩ්සෙන්ටර් - 8, අලුත්ගොඩ පාර, තිස්සමහාරාමය - 0718523556
14. නුගේගොඩ නාලන්දාරාම විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (ඉරිදා උදේ 9.00 සිට සවස 2.00 දක්වා පමණි.) (077 7577592)
15. දෙහිවල කරගම්පිටිය ශාස්ත්‍රානන්ද පිරිවෙන් විහාරස්ථානයේ සදහම් වැඩසටහනින් (සෙනසුරාදා උදේ 8.30 සිට සවස 2.00 දක්වා පමණි) (දෙහිවල පොලිස් ස්ථානය අසල) - 0713228571

**තැපෑලෙන් ගෙන්වා ගැනීම සඳහා විමසන්න -**
**ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය - අංක 33, තලවතුගොඩ පාර, පිටකෝට්ටේ - 0777794676**

***ඉහත ආයතන හිමි පින්වතුන් මෙම සද් කාර්ය ඉටු කරනු ලබන්නේ කිසිදු වෙළඳ ලාභයකින් තොරව සාසනික කටයුත්තක් වශයෙන් පමණි.***



# පරිහරණය ප්‍රවේසමෙන්...

සසුනට පිදෙන නෙක දෑ සතු දහම ගැන
සෙසු අය මෙලෙස ගනු දෙනු කළ යුතුය දැන
මුසු කර ගතොත් සසුනෙන් පිට කුමන තැන
පසු තැවෙනට හැකිය ගිනි කෑ විලස කින

ඉඳි කටු තුඩ පවා සසුනට පිදුව දිනේ
එදිනම එය සතුය කටයුතු එ තුල තැනේ
මදියක් පිරවුමට පිටතට බැහැර සැනේ
සැදි එත පවක් මතු දවසක ඇදෙන හෙණේ

බුදු පා මොක් සඟට දුන් දානය පෙර දා
පිදුමට නොදී උදුරන් කෑ පව පර දා
සැදුමෙන් කප් ගණන් ඉන් දුගතියෙ වර දා
මිදුමට නොවිය දස බුදුවරුනද හැර දා

දුන්නොත් යමක් උදෙසා බුදු සසුන වෙතා
ඉන් අත් නොවේ හිමිකම කම් සුවය පතා
උන් කවුරුන් වුවද දැන හෝ නොදැන යතා
ගින්නකි උපනුපන් තැන එය සුළුද නැතා

කම් සැප විඳින්නට ගතහොත් සසුනෙ එලේ
නිම් නැත එයින් එන ගිනි කඳ මැරෙන කලේ
තුම් එල ලබන්නට ඇති සිවු පසය තුලේ
දම් මග නොවඩ හිටියොත් මතු වැටෙති වලේ

ගඟේ වැලි ගඟට අයිතිය කියන ලෙසේ
නැගේ උරුම සසුනක සතු දෙයට මෙසේ
මගේ කියා වින්දොත් කම් සුවය රසේ
රඟේ දැනෙයි ගිය විට මහ නිරයෙ පැසේ

ගිහි හෝ පැවිදි වේවා යම් තැනක සිට
මහිමය දත යුතුය ඇති බුදු සසුනකට
සිහි නැති එවුන් සේ කෑ බිව් විටදි හෙට
නහිනට වෙනව මතු ගිනි ගත් විලසකට

කිරි පැණි කනව විලසට දැලි පිහිය ගෙන
හරියට කළොත් මිස නැත්නම් අවැඩ වෙන
අරි මග යනෙන විට පරිහරණයට දෙන
පිරිකර ඇතුළු සැම ගත යුතු සසුන දැන



පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන









# තමන්ගෙ වළ
# තමන් කපා.....



දුලබ දම් මග බොහෝ කලකින් යළිත් සත වෙත එන විටා
නොලද උන් පෙර හේතු තරවටු කරයි බුදු යන නම වටා
පිළක ඉඳ ගෙන උගත් මානය පොත පතින් කෙරුවද රටා
වළද තමනගෙ කපා ගෙන උන් වදියි පර ලොව නිරයටා

නැණ නුවන් ඇති පින්වතුන් කිසි උගත්කම් තනතුරු නැතී
බණ දහම් කර ලොව යථා දැක පොත පතේ නැති දෙය දෙතී
දැන එයින් තතු හේතු ඇති උන් ඇදි විත් ඒ මග යතී
උණ මතින් දොඩවන උගත්කම් තවත් පහලට ඇද ලතී

තමන් නොදනින බවක් හඟවනු කැමති නැති සමහර දනා
බලන් ඉන්නේ කොතැනකදී හෝ වාසියක් අහු වෙන තැනා
නිවන් මග පසෙකලා තමනගෙ බඩ වඩා ගන්නට යනා
එවන් උදවිය අනුන්ගේ නැති වැරදි හොයනව බොරු තනා

නොදන්නව නම් ගිතළු නොකියා කතා නොකරන තරමටා
එයින් යහපති යන්න තියෙනා තැනත් රැකෙනව තමනටා
ලොබින් වෙලිලා වාසි ගන්නට කියන දම් මත අනුනටා
තමන් සහ පිරිවරත් රවටා විඳින කල නැත කිසි තුටා

ලොවේ සම්මත වෙනත් කරුණක් ගැන විවාදය දොස නැතා
නොවේ එලෙසට දහම් කරුණක් තෙපුලතොත් පවු එල දෙතා
සුවේ ලොව්තුරු සොයන දනයා වරද ගත් විට එම කතා
බොහෝ දුක් කටයුතු ද සකසා දුගතියෙහි මතු පැසවතා

කරන කියනා නොයෙක කටයුතු දහම හා බැඳි විට එනා
කිරණ බලයෙහි නරක හෝ හොඳ තමන් පසු පස එලවනා
සරණ තුරු භව සසර ලොව්තුරු දහමේ මෙ වෙනස දැන ගෙනා
මරණ මොහොතෙදී දුගති නොම ගනු මහා බිය දුක ගෙන දෙනා

පබැඳුම - නීතිඥ චන්දන සිරිවර්ධන

නීතිඥ චන්දන සිරිවර්ධන විසින් නුගේගොඩ ගංගොඩවිල විහාර පාරේ අංක 96/A දරණ ස්ථානයේ පිහිටි ඉමාෂි මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.